පුවත්පත
නිවසටම ගෙන්වා ගැනීමට
දැන්ම අමතන්න : 0761 367 623
නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න

අරුණ

2023 ජූලි 25 අඟහරුවාදා | හතර වැනි කාණ්ඩය | 251 කලාපය | මිල රු 60.00 | www.aruna.lk

කටවහන වකුලේඛය හකුළා නොගත්තොත් **සෞඛ්‍ය වර්ජනයක්** ▸▸05 පිටුවට

ලක්ෂ 10කින්

මන්ත්‍රී රක්ෂණය වැඩිකරන ඉල්ලීම කුණු කූඩයට

දෙලක්ෂය මදියැයි විපක්ෂ මන්ත්‍රීවරයෙක් යෝජනා කරලා

■ නිලන්ත මදුරාවල

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන රක්ෂණාවරණය රුපියල් ලක්ෂ දහයක් දක්වා වැඩි කිරීමට විපක්ෂ මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කළ යෝජනාවට කථානායක මහින්ද යාපා අබේවර්ධනගේ එකඟතාව ලැබී නොමැති බව පාර්ලිමේන්තු ආරංචි මාර්ග සඳහන් කළේය. ▸▸02 පිටුවට

පැය 24ට දියේ ගිලී 6ක් මරුට

▸▸03 පිටුවට

රියැදුරු වර්ජනයෙන් දුම්රිය ගමන්වාර 65ක් අවලංගුයි

■ එම්. අස්ලම්

දුම්රිය එන්ජින් රියැදුරන් පිරිසක් ඊයේ (24 වැනිදා) සිදුකළ වර්ජනය හේතුවෙන් දුම්රිය ගමන්වාර 65 ක් අවලංගු කෙරුණු බව දුම්රිය ස්ථානාධිපති සංගමය පවසයි. ▸▸02 පිටුවට

සුද්ද සිංහලෙන්ම කියලත් වර්ජනය කළා -ප්‍රවාහන ඇමැති

■ දිසා වසන්ති එදිරිසිංහ ▸▸02 පිටුවට

ගාල්ලේ පහේ පන්තිවලට උකුණෝ රිංගයි

■ වරුණි පෙරමුණ

දකුණු පළාතේ ගාල්ල නගරය සහ ඒ ආශ්‍රිත පාසල්වල පස්වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුවියන්ගෙන් සියයට හැටක පිරිසක් උකුණන් හේතුවෙන් පීඩාවිඳින බවට සමීක්ෂණයකින් හෙළිවී තිබේ. ▸▸02 පිටුවට

ගාම් තෙල් මිශ්‍ර පොල්තෙල් යළිත් කඩවල

▸▸06 පිටුවට

නුවර වැව පණ අදී...

■ සාලිය කුමාර ගුණසේකර

මේ දිනවල පවතින දැඩි වියළි කාලගුණික තත්ත්වය හමුවේ අනුරාධපුර, නුවර වැවේ ජල මට්ටම විශාල ලෙස පහළ බැස ඇති අයුරු දැකගත හැකිය. මීට මාස කීපයකට ඉහතදී ජලයෙන් පිරී තිබූ වැව අද තණකොළ පිරියක් ලෙස දිස්වේ. වැවට ජලය ගලා එන ජල මාර්ග රැසක් සිඳී ගොස් ඇත.

ආර්ථික විශ්ලේෂඥයා සත්මහලින් පැන දිවිනසා ගනී

■ එම්. අස්ලම්

කොළඹ 07,රොස්මීඩ් පෙදෙසේ මහල් නිවාස සංකීර්ණයක සත්වැනි මහලෙන් පැන ආර්ථික විශ්ලේෂඥයකු සියදිවි නසාගෙන ඇත. මෙලෙස සියදිවි නසාගෙන ඇත්තේ කිරුළපන ප්‍රදේශයේ පදිංචි අමල් ගුණරත්න නමැති අයකු වන අතර ඔහු ප්‍රධාන පෙළේ වාණිජ බැංකු මූල්‍ය ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවලද සේවය කර ඇත. ▸▸02 පිටුවට

මුස්ලිම් මරණ භූමිදානයට අලුත් ගැසට්ටුවක්

▸▸05 පිටුවට

ඇහැලියගොඩ පොලිසියේදී කාන්තාවෝ දෙදෙනෙක් සැරයන්ට පෙරළගෙන ගහලා

■ තිස්ස රවීන්ද්‍ර පෙරේරා

ඇහැලියගොඩ පොලිසිය තුළදී පරිභව වචන කියමින් කලහකාරීව හැසිරුණු කාන්තාවන් දෙදෙනකු පොලිස් නිලධාරියකුගේ කම්මුලට පහරදී නිල ඇඳුම ඉරා දමන්නට උත්සාහ කළ සිද්ධියක් පෙරේදා (23 වැනිදා) වාර්තා වී ඇත. ▸▸02 පිටුවට

පඬුකරඳ ගස පණ පිටින්දැයි බලන්න නියෝග

■ සාලිය කුමාර ගුණසේකර

ගම්පහ, දාරුවට ප්‍රදේශයේ තිබී ඉවත් කරන ලද කඩයා සෙලඹකා ගස වළ දැමූ ස්ථානයේ සජීවී හෝ අජීවී තත්ත්වයෙන් පවතීද යන්න පිළිබඳ පරීක්ෂා කර මෙමස 28 වැනිදා අධිකරණයට වාර්තා කරන ලෙස ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට සහ දැව සංරක්ෂාවට ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණය ඊයේ (24 වැනිදා) නියෝග කළේය. ▸▸02 පිටුවට

කැටගොඩගේ යෝජනාව කොටඩ යයිද?

■ කේ.එස්. උදයකුමාර

විසුරුවා හැර නිබෙන පළාත් පාලන ආයතන ආපසු කැඳවීමට විෂය භාර අමාත්‍යවරයාට බලය පැවරෙන ප්‍රතිපාදන ඇතුළත් කර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත කැටගොඩ විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ▸▸02 පිටුවට

සජබ-ජාජබ සර්ව පාක්ෂ සමුළුව වර්ජනයේ

▸▸05 පිටුවට

ගෝල්ෆේස් ආ දැරිය අතින් අල්ලන් යන්න හදලා

■ එම්. අස්ලම්

සිය දෙමාපියන් සමඟින් ගාලු මුවදෙර පිටියට පැමිණ සිටි හත් හැවිරිදි දැරියක් පහැරගෙන යාමට උත්සහා කළැයි කියන පුද්ගලයකු කොටුව පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ. ▸▸02 පිටුවට

ලංකාව හත්පාරක් කොළවලින් වහන නාස්තිය නවතී

ජන සංගණනය ටැබ් එකෙන්

■ සාලිය කුමාර ගුණසේකර

ජන හා නිවාස සංගණනයකදී ලංකාවේ සමස්ත භූමිය හත් වරක් වසා දැමීමට තරම් ප්‍රමාණයක් භාවිත වන බැවින් මෙවර සංගණනය සඳහා ටැබ් යන්ත්‍ර භාවිත කිරීමට ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව කටයුතු කරයි ඇත. ▸▸02 පිටුවට

කොස්තාපල්වරයකු බොරු නඩුවකට පටලවා

පොලිසිය උසාවියෙන් සමාව ගනී

■ උපාලි ආනන්ද කරුණාදාස- අනුරාධපුර

ගංජා මිළි ග්‍රෑම් 85010 ක් සන්තකයේ තබා ගැනීම ජවාරම් කිරීම සහ ප්‍රවාහනය කිරීම යන චෝදනාවන්ට තන්තිරිමලේ පොලිසියට අනුයුක්තව සේවය කළ පොලිස් කොස්තාපල්වරයෙකු අනුරාධපුර කොට්ඨාස දූෂණ මර්දන අංශය මගින් අනීතිකව අත්අඩංගුවට ගෙන නඩු පැවරීම තුළින් ඔහුට සිදුව ඇති අසාධාරණය සම්බන්ධයෙන් පොලිස්පතිවරයා සහ පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් තමා අධිකරණයෙන් සමාව අයදින බව පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන කාර්යාංශයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඩී. එස්. වික්‍රමසිංහ විවෘත අධිකරණයේදී පැවැසීය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ තන්තිරිමලේ පොලිසියේ එවකට සේවය කළ මැදවච්චිය ඇටවීරගොල්ලෑව පදිංචි පොලිස් කොස්තාපල් (83840) ජේ. ඩී. සඳුන් යන අයට එරෙහිව මැදවච්චිය මහෙස්ත්‍රාත් අධිකරණය හමුවේ පැවති නඩුවක් මැදවච්චිය මහෙස්ත්‍රාත් ප්‍රියන්ත හාල්යාල ඉදිරියේ යළි කැඳවූ අවස්ථාවේදීය.

මෙහිදී විත්තිකරු වෙනුවෙන් කරුණු දක්වමින් නීතිඥ නලින් දිමුතු බංඩාර කියා සිටියේ මෙම නීති විරෝධී ක්‍රියාව හේතුවෙන් තම සේවාදායකයාගේ රැකියාව අහිමිව කලක් රිමාන්ඩ් බන්ධනාගාරයේද පසුවූ බවයි. තම සේවාදායකයාගේ බීරියද පොලිස් නිලධාරිනියක් බව අධිකරණයට කියා සිටි නීතිඥවරයා මෙම නීති විරෝධී අත්අඩංගුවට ගැනීම නිසා තම සේවාදායකයාගේ දරුවා පාසලට අතුළත් කර ගැනීමට පවා නොහැකි වූ බවද කීවේය.

තමා අනීතිකව අත්අඩංගුවට ගෙන බන්ධනාගාර ගත කිරීමෙන් තම මූලික අයිතිවාසිකම් කඩවී ඇති බව පවසමින් ඊට වගකිව යුතු පොලිස් නිලධාරීන් 7 දෙනාගෙන් රුපියල් කෝටි 10 ක් වන්දි ඉල්ලා පොලිස් කොස්තාපල් ජේ. ඩී. සඳුන් මහතා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් නඩුවක්ද පවරා ඇත.

පොලිසිය ගැන පොලිසියට කියන්න
011-2013046/
011-2 2430913/ 118
අපරාධයක්/ හදිසි අවශ්‍යතාවක් නම්
119

බිලිඳුන් වෙනුවෙන් ගැබිනි මව්වරුන් 20කට පරිත්‍යාග

■ එෆ්.අස්ලම්

මහවිලච්චිය ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ පොලිස් වසම් තුනක දුගී ගැබිනි මව්වරුන් සඳහා අවශ්‍ය උපකරණ ප්‍රදානය කිරීමක් ඔයාමඩුව පොලිස් ස්ථානයේදී පසුගියද සිදුවිය.

ඔයාමඩුව, මහවිලච්චිය හා තන්තිරිමලේ පොලිස් වසම්වල පදිංචි නිසි ආදායම් තත්ත්වයක් නොමැති ගැබිනි මව්වරුන් විසිදෙනකු මේ සඳහා තෝරාගනු ලැබීය.

ඔයාමඩුව පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක දිමුතු ගුණසේකරගේ මෙහෙයවීම මත අනුරාධපුර දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ලයනල් විජේසේනගේ ප්‍රධානත්වයෙන් මෙම උපකරණ ප්‍රදානය සිදුකෙරුණු අතර මේ සඳහා මූල්‍ය පරිත්‍යාගය සිදුකර ඇත්තේ කිරිබත්ගොඩ ප්‍රදේශයේ ව්‍යාපාරිකයකි.

පරිත්‍යාග ද්‍රව්‍ය අතර බිලිඳු දරුවන්ට අවශ්‍ය බේසම්, ඇඳුම් කුඩ, ඇතුළු රුපියල් විසි දහසක් වටිනා භාණ්ඩ තිබිණි.

පෙන්ෂන් ගිය අයි.පීලා,එස්.අයිලා පාරිතෝෂිතය නැතිව දුකෙන්

සමහරු කුලී වැඩවල

■ නුවන් ජයසේකර - මීගහජදුර

පසුගිය 2020 වසරේ සිට මේ දක්වා විශ්‍රාම ගිය තමන්ට ලැබිය යුතු පාරිතෝෂිත මුදල මෙතෙක් ලබා නොදීම නිසා තමන් දැඩි අසරණ තත්ත්වයට පත්ව ඇතැයි විශ්‍රාමික උප පොලිස් පරීක්ෂකවරුන් හා පොලිස් පරීක්ෂකවරු පවසති.

ඔවුන් පෙන්වා දෙන්නේ 2020 වසරේ සිට මේ දක්වා විශ්‍රාම ගිය කිසිදු උප පොලිස් පරීක්ෂකවරයකුට හෝ පොලිස් පරීක්ෂකවරයකුට මේ දක්වා මෙම පාරිතෝෂිත මුදල ලබා දී නොමැති බවයි. වසර ගණනාවක් පුරා පොලිස් දෙපාර්තමේන්තුව යටතේ සේවය කර විශ්‍රාම ගිය පසු විශ්‍රාම වැටුප හිමිවන තෙක් විශ්‍රාම ගිය දිනයේ සිට දින 60ක් තුළදී මෙම පාරිතෝෂිත මුදල ලබා දිය යුතු බව එම විශ්‍රාමික නිලධාරීහු පවසති. විශ්‍රාම ගිය බොහෝ පොලිස් නිලධාරීන් සිය ජීවන තත්ත්වය පවත්වාගෙන යාමට නොහැකිව දැඩි අසරණ තත්ත්වයට පත්ව ඇති බවත්,ඇතැමුන් ඔවුන්ට හිමි විශ්‍රාම වැටුප හිමිවන තෙක් එදිනෙද කුලී වැඩට යන බවත් ඔවුහු පෙන්වා දෙති. මේ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ කාරුණික අවධානය යොමු කර තමන්ගේ පාරිතෝෂිත මුදල කඩිනමින් ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස විශ්‍රාමික උප පොලිස් පරීක්ෂකවරුන් හා පොලිස් පරීක්ෂකවරුන් ඉල්ලා සිටිති.

අනුරපුර රෝහලේදී මාධ්‍යවේදියකු ඝාතනයට තැත්කිරීම

මාධ්‍යවේදීන්ගෙන් උතුරුමැද D.I.Gට පැමිණිල්ලක්

අනුරාධපුර ශික්ෂණ රෝහලේදී ප්‍රාදේශීය මාධ්‍යවේදී තම්සීර් මොහොමඩ් ඝාතනය කිරීමට තැත්කිරීම පිළිබඳ අනුරාධපුර මාධ්‍යවේදීහු ඊයේ (24ද) උතුරුමැද නියෝජ්‍ය පොලිස්පති ලක්සිරි විජේසේන වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළහ.

පසුගිය පොසොන් සමයේදී අනුරාධපුර මහ නගර සභාවේ තාවකාලික වෙළෙඳසල් ගැනුම්කරුවන්ට ලබාදීමේදී සිදුවූ බව කියැවෙන අක්‍රමිකතාවක් පිළිබඳ ප්‍රවෘත්තියක් මාධ්‍ය මගින් ප්‍රචාරය වීම මෙම මරණ තර්ජනයට හේතුවී තිබේ. සැකකරු ජූලි මස 20 වැනි දින අනුරාධපුර ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකක භූමියේදී මාධ්‍යවේදියාට තියුණු ආයුධයකින් පහරදී තිබේ. මාධ්‍යවේදියා ඉවතට පැන ප්‍රහාරයෙන් වැළකී ඇති අතර ඒ මොහොතේ රෝගීන් බැලීමට පැමිණ සිටි පිරිස් එක් රැස්වීම නිසා සැකකරු පලාගොස් ඇත. මෙම සිද්ධිය සම්බන්ධයෙන් මාධ්‍යවේදියා පොලිසියට පැමිණිලි කර තිබේ.

මාධ්‍යවේදියාට සිදුකළ මරණීය තර්ජනය පිළිබඳව අනුරාධපුර මාධ්‍යවේදීහු ඊයේ (24ද) උතුරුමැද නියෝජ්‍ය පොලිස්පතිවරයාට ලිඛිත පැමිණිල්ලක් භාරදුන් අවස්ථාවේ නියෝජ්‍ය පොලිස්පතිවරයා පැවසුවේ මේ වනවිටත් අදාළ සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් කණ්ඩායම් දෙකක් යොදවා ඇති බවයි.

සැකකරු වහාම අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන බවද නියෝජ්‍ය පොලිස්පතිවරයා සඳහන් කළේය.

ඔබගේ ගමේ නගරයේ පොලිසියෙන් සිදුවන අසාධාරණකම් මෙන්ම පොලිස් නිලධාරීන්ගේ රටම නොදකින හොඳ නරක අපට ලියන්න කියන්න.
අරුණ RIB, අංක 91, විජේරාම මාවත, කොළඹ 07.
011-5978984
aruna.editor@liberty.lk

අරුණ වාණිජ ලෝකය

මහජන බැංකුව Export Hubs පිහිටුවයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම බැංකුවක් වන මහජන බැංකුව, සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන්ට එකම වහලක් යට සියලු පහසුකම් සැලසීම සඳහා අපනයන කේන්ද්‍ර (Export Hub) හඳුන්වා දෙයි.

ඒ අනුව මහජන බැංකුවේ පළමු අපනයන කේන්ද්‍රය නුගේගොඩ ශාඛාවේදී පසුගියද විවෘත කෙරිණි. ආරම්භයේදී දිවයින පුරා ප්‍රාදේශික 7ක පිහිටි ශාඛා 7ක අපනයන කේන්ද්‍රයන් පිහිටුවනු ඇත.

මේ තුළින් විශේෂ මූල්‍ය අනුපාත, බැංකු පහසුකම්, ඇපකර පහසුකම්, උපදේශන සේවා, පරිපූරක සේවා සහ අපනයනකරුවන් සහ ආනයනකරුවන් සඳහාම නිර්මාණය කර ඇති ඩිජිටල් බැංකු පහසුකම් (ආයතනික අන්තර්ජාල බැංකුකරණය) ඇතුළුව පූර්ණ මූල්‍ය විසඳුම් පිරිනැමීම විශේෂත්වයකි.

BCI Campus වෙතින් උපාධි සිසුන්ට පොලී රහිත ණය

Benedict XVI ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතනය, මෙරටේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ වඩාත් පිළිගැනීමට ලක්ව ඇත්තේ BCI Campus යන නාමයෙනි. එය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත කරනු ලැබූ උපාධි පිරිනමන, මීගමුව ප්‍රදේශයේ පිහිටි ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතනයකි. උපාධි අපේක්ෂකයන්ගේ ඉල්ලුම අනුව නව උපාධි අධ්‍යයන වැඩසටහන් කිහිපයක් සහ එම අධ්‍යයන කටයුතු පහසුවෙන් ඉටු කර ගැනීමට හැකි පැහැදිලි ගමන් මගක් එම ආයතනය විසින් ඉදිරිපත් කර ඇත.

මෙම උපාධි BCI Campus හි ව්‍යාපාරික පීඨය, පරිගණක පීඨය, ශාස්ත්‍ර පීඨය යන පීඨ මගින් පිරිනමනු ලබන අතර මේ හරහා ව්‍යාපාර කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, ප්‍රාථමික සහ මුල් ළමාවිය අධ්‍යාපනය සහ ලිබරල් කලා පිළිබඳව විෂය ධාරාවන් ඇතුළු ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක අධ්‍යයන ක්‍රමවේදයන් ඔස්සේ උපාධි අපේක්ෂකයන් වෙත විවිධ උපාධි රැසක් පිරිනමනු ලබයි.

Cinec Innovation & Invention Edu Expo 2023- Cinec Campus පරිශ්‍රයේදී

Cinec උසස් අධ්‍යාපන ආයතනය විසින් සංවිධානය කරනු ලබන Innovation & Invention Edu Expo 2023 අධ්‍යාපන ප්‍රදර්ශනය ජූලි මස 27, 28, 29 යන දිනවලදී මාලබේ Cinec Campus පරිශ්‍රයේදී උදෑසන 08 සිට රාත්‍රී 07 දක්වා පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

Cinec Campusහි සිසු සිසුවියන් විසින් කරන ලද නවෝත්පාදන හා නිර්මාණාත්මක ප්‍රදර්ශන කුටි විශාල සංඛ්‍යාවකින් සහ විවිධ වැඩමුළු හා ව්‍යාපෘතිවලින් මෙය සමන්විත වේ. Cinec Campusහි ප්‍රධාන පීඨ වන නාවික, ඉංජිනේරු, කළමනාකරණ, තොරතුරු තාක්ෂණ, සෞඛ්‍ය විද්‍යා, ඉංග්‍රීසි භාෂා, අධ්‍යාපන, ගුවන් යානා නඩත්තු ඉංජිනේරු පීඨවල අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් විසින් ඉදිරිපත් කරනු ලබන නිර්මාණාත්මක සහ නවෝත්පාදන ප්‍රදර්ශන කුටි එදින පැමිණෙන සිසු සිසුවියන් සහ ඔවුන්ගේ දෙමාපියන් සඳහා විවෘතව ඇති අතර මෙමගින් විෂයානුබද්ධ සහ ඊට පරිබාහිර විශාල දැනුමක් ලැබිය හැකි බව Cinec Campusහි ජ්‍යෙෂ්ඨ උපදේශක අද්මිරාල් තිසර සමරසිංහ මහතා ප්‍රකාශ කළේය.

මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය දැන් AIC Campus වෙතින්

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතනයක් වන AIC Campus, ඇමරිකාවේ විස්කොන්සින් පාක්සයිඩ් විශ්වවිද්‍යාලයේ (UW-Parkside) මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (B.Sc Psychology) ශ්‍රී ලංකාවේ සිසු සිසුවියන් වෙත පිරිනැමීම සඳහා කටයුතු සම්පාදනය කර ඇති බව එම ආයතනය සතුටින් නිවේදනය කරයි.

මෙම සුවිශේෂී උපාධි පාඨමාලාව හඳුන්වා දීමේ උත්සවය විස්කොන්සින් පාක්සයිඩ් විශ්වවිද්‍යාලයේ පීඨාධිපති මහාචාර්ය එම්මානුවෙල් ඔටු මහතාගේ ප්‍රධානත්වයෙන් සහ AIC Campus හි ඉහළ කළමනාකාරීත්වය ඇතුළු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පසුගියද කොළඹ ගෝල්ෆේස් හෝටලයේදී පැවැත්විණි. මෙම පාඨමාලාව මගින් මෙරට සිසු සිසුවියන්ට විදෙස්ගත වීමකින් තොරව ඇමරිකානු උපාධියක් ලබා ගැනීමේ අවස්ථාව උදාවන බවද විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි.

විස්කොන්සින්-පාර්ක්සයිඩ් විශ්වවිද්‍යාලයේ (UW-Parkside) මෙම මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ඇමරිකානු ප්‍රමිතියෙන්ම ක්‍රියාත්මක කිරීමට AIC Campus කටයුතු කරයි.

'BOC ගම්මාන' වැඩසටහන් මාලාවේ 5 වැනි අදියර කුරුකැටියාව ගම්මානයේදී

'ජාතියේ මහා පහන් ටැඹ' ලංකා බැංකුව විසින් දියත් කරනු ලබන 'BOC ගම්මාන' ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියේ පස්වැනි BOC ගම්මානය වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුකැටියාව සමෘද්ධි ගම්මානයේදී විවෘත කෙරිණි.

ලංකා බැංකුවේ සංවර්ධන බැංකු අශය විසින් ක්‍රියාත්මක කරනු ලබන 'BOC ගම්මාන' වැඩසටහන මගින් අඩු වරප්‍රසාද සහිත ග්‍රාමීය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව හා ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරයි. මෙහිදී ඉලක්කගත කණ්ඩායම් වෙත ළඟාවීම සඳහා විශේෂ වැඩසටහන් මාලාවක් 'BOC ගම්මාන' වැඩසටහන තුළ ව්‍යුහගත කර ඇත. මෙරට ග්‍රාමීය ජනතාව දේශීය ආර්ථිකයේ වැදගත් කොටසක් නියෝජනය කරන බැවින් ග්‍රාමීය සංවර්ධනය ජාතික ආර්ථිකය නැංවීමෙහිලා අත්‍යවශ්‍ය අංගයකි. රටේ ප්‍රමුඛතම බැංකුව සහ ප්‍රමුඛතම රාජ්‍ය බැංකුව ලෙස ග්‍රාමීය ආර්ථිකයේ දියුණුව සහ ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම තම වගකීමක් කොට සලකන ලංකා බැංකුව සිය ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ලෙස 'BOC ගම්මාන' වැඩසටහන දියත් කරයි.

කදිර දිව්‍යරාජ සිනමා කෘතිය සමග පෙළගැසෙන 'රයිගම් දෙවැනි 1'

සැබෑ ශ්‍රී ලාංකික ව්‍යවසායකයෙකු ලෙස රයිගම් සමූහ ව්‍යාපාරයේ සභාපති ආචාර්ය රවී ලියනගේ තම ව්‍යවසායකත්ව ශක්තිය සිනමා කර්මාන්තය වෙත මේ මොහොතේ යොමුකරන්නේ, මන්දගාමී ගමනක යෙදෙන දේශීය සිනමා කර්මාන්තයට යම් අස්වැසිල්ලක් වෙමින් සම්මානිත මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ නිර්මාණ කුසලතාවයෙන් බිහිකළ කදිර දිව්‍යරාජ සිනමා සිත්තම දේශීය සිනමා ක්ෂේත්‍රයට තිළිණ කරමිනි.

මෙම සද්කාර්යය සඳහා ඔහු තම රයිගම් රාජධානියේ ශක්තිය මුසුකර ගන්නේ, එම සිනමා සිත්තමේ තේමාවට ගැලපෙන රයිගම් 'දෙවැනි බැත' නිෂ්පාදනය වැඩිදියුණු කිරීම තුළින් හඳුන්වා දෙන 'රයිගම් දෙවැනි 1' සහල් නුඩ්ල්ස් මහා පාරමිතාවක් ලෙස සම්මාදම් කරගනිමිනි.

'රයිගම් දෙවැනි බැත' වසර 10ක කාලයක් මුළුල්ලේ පාරිභෝගික සිත් සතන් සනසමින් ඉතා ඉහළ ප්‍රතිචාර ලබමින් වෙළඳපොළේ අද්විතීය ස්ථානයක වැජඹෙන අතර ගෙවුණු කාලය පුරාවටම එහි අනර්ඝත්වයට සමකළ හැකි කිසිදු සහල් නුඩ්ල්ස් නිෂ්පාදනයක් වෙළෙඳපොළට එක්නොවීමද එහි සුවිශේෂී ජයග්‍රහණයකි. 100% ක් සහල්පිටි පමණක් අන්තර්ගත දෙවැනි බැත ආරම්භයේ සිටම එහි අසුරණයේ ඉතා පැහැදිලි අභියෝගයක් සටහන් කර ඇත. ඒ එහි සහල් පිටි හැර වෙනත් කිසිදු ද්‍රව්‍යයක් අඩංගු බව ඔප්පු කරන ඕනෑම තැනැත්තෙකුට රුපියල් මිලියනයක ත්‍යාගයක් ලබාදීමේ පොරොන්දුවයි. එය පාරිභෝගික විශ්වාසය රැකීමේ පොරොන්දුවයි.

යුනියන් ඇෂුවරන්ස් ඉහළම වටිනාකමක් සහිත පාරිභෝගික සන්නාම 100 අතරට

ජූඩ් ගෝමිස් ප්‍රධාන විධායක නිලධාරී

මහේන් ගුණරත්න ප්‍රධාන අලෙවි නිලධාරී

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ජීවිත රක්ෂණ සමාගමක් වන යුනියන් අෂුවරන්ස්, අඛණ්ඩව 15 වන වරටත් 'ශ්‍රී ලංකාවේ ඉහළ ම වටිනාකමක් සහිත පාරිභෝගික සන්නාම' සියයෙන් එකක් ලෙස ගෞරවණීය පිළිගැනීමකට ලක්වූ බව ඉමහත් සතුටින් ප්‍රකාශ කර සිටිමු.

මෙම ගෞරවණීය සම්මානය LMD විසින් පිරිනමනු ලැබුවේ, ගෝලීය සන්නාම තක්සේරු උපදේශන ආයතනයක් වන Brand Finance සමග ඒකාබද්ධවය.

ඉහළම වටිනාමක් සහිත පාරිභෝගික සන්නාම 100 අතරට යුනියන් අෂුවරන්ස් නම් කෙරුණේ, ශ්‍රී ලංකාවේ සන්නාම වපසරිය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක ප්‍රතිඵලයක් ලෙස යුනියන් අෂුවරන්ස් සමාගමේ කැපී පෙනෙන සන්නාම විශ්වසනීයත්වය, උපායමාර්ගික ආයෝජන සහ වෙළෙඳපොළ තුළ කැපී පෙනෙන ක්‍රියාකාරීත්වය තහවුරු වීමෙන් පසුවය.

මෙම ජයග්‍රහණය අසමසම රක්ෂණ විසඳුම් සමගින් සියලු ම ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත ආරක්ෂා කිරීමට සහ ඔවුන්ගේ යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා සමාගමේ ඇති නොසැලෙන කැපවීම පිළිබඳ සාක්ෂියකි.

පීපල්ස් ලීසිං මුතුර් ශාඛාවෙන් Wadi'ah Gold Safekeeping පහසුකම

පීපල්ස් ලීසිං සමාගමේ මුතුර් ශාඛාව වෙතින් Wadi'ah Gold Safekeeping පහසුකම ගනුදෙනුකරුවන්ට පසුගියද විවෘත කෙරුණි. එම ශාඛා කළමනාකාර අතුල වීරසිංහ මහතාගේ මගපෙන්වීම යටතේ සිදුවුණු Wadi'ah Gold Safekeeping පහසුකම ගනුදෙනුකරුවන්ට සැපයීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිතයන් ලෙස පීපල්ස් ලීසිං සමාගමේ ඉස්ලාමීය මූල්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර ෆස්මිල් මවුලානා මහතා හා පීපල්ස් ලීසිං සමාගමේ ප්‍රාදේශීය ප්‍රධාන කළමනාකාර ඒ.බී. සුතර්සන් මහතා සහභාගී වූහ

Green Climate Fund සහතිකකරණය DFCC බැංකුව හිමිකරගනී

දේශගුණික විපර්යාස හමුවේ ඉහළ යන උෂ්ණත්වයට සහ ආපදාකාරී කාලගුණික තත්වයන්ට ලංකාවද මුහුණපා සිටින බව හරිත දේශගුණික අරමුදලේ විධායක අධ්‍යක්ෂ හෙන්රි ගොන්සාලෙස් පවසන්නේය. දේශගුණික විපර්යාසයන් අවම කිරීමට අදාළ ව්‍යාපෘති වලදී හරිත දේශගුණික අරමුදල සමග ඩී.එෆ්.සී.සී. බැංකුව සෘජු ප්‍රවේශ ආයතනයක් ලෙස කටයුතු කරන බවද ඔහු පැවසුවේය.

මෙරට පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා හරිත දේශගුණික අරමුදල විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 250 ක් දක්වා සහනදායි මූල්‍ය පහසුකම් සපයන්නේය. ඒ අනුව, අදාළ පහසුකම් ලබා ගැනීම සඳහා හරිත දේශගුණික අරමුදලේ සහතිකකරණය ඩී.එෆ්.සී.සී. බැංකුවට ලබාදී තිබේ.


ජෙෆ්රි බාවාගේ ගෘහ නිර්මාණ ශිල්පීය සැලසුම් අනුව නිර්මාණය කරන ලද ගොඩනැගිලි

උද්‍යානයේ ඉදිකර තිබෙන කුඩා චෛත්‍ය

උද්‍යාන පිවිසුමේ පුවරුව

රට සල්ලි අද්දන්න "පොපම්" හදපු සල්ලි වත්ත

■ සාලිය කුමාර ගුණසේකර

දඹුල්ල - කණ්ඩලම මාර්ගයේ පිහිටා තිබෙන වියළි කලාපීය පාරිසරික උද්‍යානයක් වන "පොපම් ආබරේටම්" (Popham Arboretum) සංචාරක උද්‍යානය මේ වන විට දෙස් විදෙස් සංචාරකයන්ගේ පමණක් නොව පරිසරය සම්බන්ධයෙන් කටයුතු කරන පරේක්ෂකයන්ගේ අධ්‍යයන මධ්‍යස්ථානයක් බවට පත්ව ඇත්තේය.

එංගලන්ත ජාතික නාවික හමුදු නිලධාරියකු වූ සෑම් පොපම් ලංකාවට පැමිණීමෙන් පසුව දඹුල්ලේ පරිසර පද්ධතියට ඔහු මහත් සේ ඇලුම් කළේය. ඒ අනුව ඔහු 1963 වසරේදී දඹුල්ල - කණ්ඩලම මාර්ගයේ පිහිටා තිබෙන අක්කර හතහමාරකින් යුතු ඉඩමක් මිලදීගෙන අඹ වවන්නට පටන් ගත්තේය.

අඹ වගාව අතර පලු, වීර ආදී වියළි කලාපීය ස්වභාවික ශාක වැටී තිබෙන අයුරු සෑම් පොපම් නිරීක්ෂණය කළ අතර එම ශාක අතර වැවෙන තණ කොළ ආදිය උගුල්ලා දමා ස්වභාවික ශාකවලට වැඩෙන්නට පරිසරය නිර්මාණය කළේය. ඔහු මෙම වියළි කලාපීය සදාහරිත වනාන්තරයට කොතරම් ඇලුම් කළේද කිවහොත් කුඩා මැටි පැල්පතක් තනාගෙන එම ඉඩමේ ජීවත් වූවේය. සිය ඉඩමේ කුඩා දාගැබක් තනා ඊට වන්දනාමාන කළේය. වැසි රහිත කාලයේදී පැල්පත අසල විශාල ගසක් ළඟට ගොස් වැසි ඉල්ලා කන්නලව කළේය. ඒ තරමටම ඔහු ස්වභාවික පරිසරයට ඇලුම් කරන්නට විය. එපමණක් නොව ශාක සම්බන්ධව අධ්‍යයන කටයුතුද කළේය.

සෑම් පොපම්

වනාන්තර පද්ධතියේ සෑම් පොපම් ගලින් ගොඩනැගිල්ලක් ඉදිකරනු ලැබුවේ ලෝක ප්‍රකට ගෘහ නිර්මාණ ශිල්පියකු වූ ජෙෆ්රි බාවාගේ සැලසුමකට අනුවය.

ශාක සම්බන්ධව සෑම් පොපම්ගේ ඇල්ම කොතරම්ද කියතොත් ලංකාවේ ශාක නාමාවලියට අදාළව පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ව්‍යාපෘතියක සම්බන්ධීකාරකවරයකු ලෙසද ඔහු එක්දහස් නමසිය හැට ගණන්වලදී කටයුතු කළේය.

සෑම් පොපම් මෙම වියළි කලාපීය කුඩා වනාන්තරය 1989 වසරේදී ජාතික මූලික අධ්‍යයන ආයතනයට භාර දුන්නේය. එවකට එම ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරනු ලැබුවේ මහාචාර්ය සිරිල් පොන්නම්පෙරුමය. ඔහු මෙම පරිසර පද්ධතියට තවත් අක්කර විසිහතක භූමි ප්‍රදේශයක් එකතු කිරීමට කටයුතු කළේය.

වැසි ඉල්ලා කන්නලව් කරන ලද ස්ථානය

ශාක විශේෂ තුන්සියපනහකට අධික ප්‍රමාණයක් මෙම වනාන්තරයේදී දැක ගැනීමට හැකියාව ඇත්තේය. වියළි සදාහරිත වනාන්තරවල වැවෙන කළුවර, මී, බුරුත, පලු, වීර, මාදං ශාක මෙම වනෝද්‍යානයේ බහුලය. උණහපුළුවා, කබල්ලෑවා, මිමින්නා, මුවා ආදී සතුන් මෙම වනාන්තරයේ බහුලව ජීවත් වෙති.

පසුකාලීව මෙම වනාන්තර පද්ධතියේ කටයුතු අඩපණ වීමත් සමග එය පරිසර සංවිධානයකට භාර කෙරිණි. තමන් නිර්මාණය කරන ලද මේ පරිසර පද්ධතිය පේරාදෙණිය උද්භිද උද්‍යානයට භාර ගන්නා ලෙස සෑම් පොපම් 2006 වසරේදී එම උද්‍යානයේ අධ්‍යක්ෂවරයා සහ පසුව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කළ මහාචාර්ය සිරිල් විජේසුන්දරගෙන් ඉල්ලීමක්ද කර තිබිණි.

පසු කාලීනව යළි ජාතික මූලික අධ්‍යයන ආයතනයේ පාලනයට ගත් මෙම "පොපම් ආබරේටම්" සංචාරක උද්‍යානය තුළ අද වෙද්දී ශාක පිළිබඳව අධ්‍යයන සහ පරේක්ෂණ කටයුතු රැසක් සිදු කෙරෙන්නේය. උද්‍යානයේ දිවා රාත්‍රී සෆාරි පහසුකම්ද සලසා ඇත්තේය. ජාතික මූලික අධ්‍යයන ආයතනයේ ශාක වර්ගීකරණය සහ සංරක්ෂණ ව්‍යාපෘතියේ ප්‍රධානි මහාචාර්ය සිරිල් විජේසුන්දර යටතේ අද වෙද්දී මෙම උද්‍යානය පාලනය කෙරෙන්නේය. සෑම් පොපම් විසූ කුඩා පැල්පත අද සුවිසල් කෞතුකාගාරයකි. ඔහුගේ ඡායාරූප, භාවිත කරන ලද ඇඳ ඇතුළු දෑ එහි සංරක්ෂණය කර ඇත්තේය.

මෙම උද්‍යානයයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියක් හරහා රුපියල් මිලියන දහතරක මුදලක් වැයකරන ලදී. එම අරමුදල් සපයන ලද ව්‍යාපෘතිවල අවසානය සනිටුහන් කිරීමේ උත්සවය පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රණසිංහ ඇතුළු විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

මෙරට බොහෝ දෙනා පරිසරය වනසන සමයක රටට සුවිශේෂී පරිසර පද්ධතියක් නිර්මාණය කළ සෑම් පොපම් ඉකුත් වසරේ (2022) මැයි මාසයේදී එංගලන්තයේදී මියගියේය.

නායකයන්ගේ නම් කියා කොටගල නම ජාත්‍යන්තරයට ගෙන ගියා

භවිෂනා විදෙස් නායකයින්ගේ රුව හඳුනා ගනිමින්

භවිෂනා ලද සම්මානය

■ සිතාර ඉරාෂ් - වටවල

පින්තූරයක් දුටු සැනින් හඳුනා ගැනීමට අප කාහටත් හැකිය. ලෝක රාජ්‍ය නායකයන්ගේ රුව වරක් දුටු පමණින් නැවත හඳුනාගැනීමට නම් බොහෝ අපහසුය. ඊටත් වඩා එම රුව හඳුනාගෙන ලෝක වාර්තා තැබීම කියන කාරණය ලෙහෙසි පහසු වැඩක් නම් නොවේ. මේ කියන්නට යන්නේ එවන් අරුම පුදුම වැඩක් කළ සිඟිත්තියක් පිළිබඳවය. ඒ වයස අවුරුදු තුනක් තරම් වූ සෙන්තුල් කුමාර් භවිෂනා නම් දියණියකි. මේ ඇය ලක් මැණියන්ගේ නාමය ලෝකයට ගෙන ගිය පුවත ගැනය.

සෙන්තුල් ජීවත් වන්නේ හැටන් කොටගල ප්‍රදේශයේය. විනාඩියයි තත්පර හයකින් සෙන්තුල් විසින් ලෝක රාජ්‍ය නායකයන් හතළිස් දෙනකුගේ රුව හඳුනාගෙන තිබුණාය.

ඉන්දියාවේ සිට ක්‍රියාත්මක වන International Book Of Records නමැති ජාත්‍යන්තර වාර්තා පොතෙහි වාර්තාවක් පිහිටුවීම සඳහා ඇය අන්තර්ජාලය හරහා ඉකුත් අප්‍රේල් මස (06) දින ඉදිරිපත් වී තිබුණාය.

ඒ අනුව සෙන්තුල් සිය පරිගණකයෙන් ලෝක රාජ්‍ය නායකයන්ගේ ඡායාරූප බලා එම රාජ්‍ය නායකයන්ගේ නාමයන් විනාඩියයි තත්පර හයකින් නම් කර එම වාර්තාව තැබූ බව එම දැරියගේ පියා වන සෙන්තුල් කුමාර් කියා සිටියේය. දියණිය විසින් තැබූ ජාත්‍යන්තර වාර්තාවට හිමි සහතිකය සහ පදක්කම මේ වන විට ලැබී ඇති බව දැරියගේ පියා කියා සිටියේය.

"මේ මගේ ලොකු දරුවා තව දරුවෙක් අපිට ඉන්නවා. ඒ දෙන්නා තමයි අපේ ඇස් දෙක. ලොකු දරුවා තමයි මේ ලෝක වාර්තාව පිහිටවෙව්වේ. ඇය හරිම දක්ෂ දරුවෙක් එයා පුංචි කාලේ ඉඳලාම ඉගෙන ගන්න දේවල්වලට තමයි හිත යොමු කළේ. චූටිම කලේත් අපි ලැප්ටොප් එක බලද්දී ප්‍රශ්න අහනවා හැම දෙයක්ම. ඔන්න ඔහොම තමයි රාජ්‍ය නායකයොත් මතක තියාගෙන තියෙන්නේ. හොඳ මතකයක් තියෙන දරුවෙක් තමයි සෙන්තුල්.

එන වසරේ පෙර පාසල් යවන්නත් ඕනේ. මම හිතනවා එයා ලංකාවේ හොඳම තැනකට එවී කියලා යැයි භවිෂනාගේ පියා සෙන්තුල් කුමාර් එසේ කීවේය. භවිෂනාගේ පියා කොටගල තැපැල් කාර්යාලයේ සේවය කරන්නේය. මව ගුරු වෘත්තියේ නියැළෙන්නීය.

අවුරුදු තුනක් වයසැති දැරියක් ජාත්‍යන්තර වාර්තාවක් තැබීම සම්බන්ධයෙන් කොටගල වෙළෙඳ සංගමයේ සභාපති විශ්වනාත් පුෂ්පා ඇතුළු සංගමයේ සමාජිකයන් ඇයගේ නිවස වෙත ගොස් එම දැරියට උපහාර දැක්වීමක්ද සිදු කළහ.

පත්තිනියගේ ඇස් වහපු කපුවා කපෝති

■ විජේරත්න හල්බලුව - හාරිස්පත්තුව

දේවාලයක් පවත්වාගෙන යන කපුවකු විසින් තවත් දේවාලයක දේව ප්‍රතිමා දෙකක් සොරාගෙන ඇතැයි අලවතුගොඩ පොලිසිය පවසයි. මෙම සැකකාර කපුවා අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව ඔහු විසින් සිදුකළ බව පැවසෙන තවත් සොරකම් රැසකද හෙළිකර ගැනීමට පොලිසියට හැකිව තිබිණි. විවිධ අන්දමේ සොරකම් සිදුකරමින් සිටි සැකකාර කපුවා පොලිස් දැලට කොටුවී තිබුණේ මහමග නවතා තිබුණු යතුරුපැදියක් සොරා ගැනීම නිසාවෙනි.

සිය යතුරුපැදිය සොරකම් කරගෙන ගොස් ඇතැයි එහි හිමිකරු විසින් කළ පැමිණිල්ලකට අනුව අලවතුගොඩ පොලිසියේ නිලධාරීන් විමර්ශන ආරම්භ කරන ලදී. පසුව එවැනි යතුරුපැදියක් වත්තේගම, පිටියේගෙදර ප්‍රදේශයේ මහමග දමාගොස් තිබියදී වත්තේගම පොලිසිය සොයාගෙන තිබේ. ඉන්පසු අලවතුගොඩ පොලිසියේ නිලධාරීන් එම යතුරුපැදිය රැගෙන ගොස් තිබුණු මාර්ගය දෙපස පිහිටි ආරක්ෂිත කැමරා පරීක්ෂාවට ලක්කර ඒ ඔස්සේ එම යතුරුපැදිය සොරාගෙන යමින් සිටි පුද්ගලයාගේ ඡායාරූපයක් ලබාගෙන ඇත. පසුව ප්‍රදේශවාසීන්ගේ සහාය මත එහි සිටින පුද්ගලයා හඳුනාගෙන ඇත්තේය. එලෙස හඳුනා ගත් පුද්ගලයා එම ප්‍රදේශයේම දේවාලයක් පවත්වාගෙන යන අයෙකු බව පොලිසිය තහවුරු කර ගෙන ඇත්තේය.

ඒ ඔස්සේ පරීක්ෂණ පැවැත්වූ අලවතුගොඩ පොලිසිය මෙම පුද්ගලයා කොටුකර ගැනීමට යෙදුවේ අපූරු උපක්‍රමයකි. ඒ පොලිසියේ උපාය දූතයකු දේවාලයට යවා උකුවෙල ප්‍රදේශයට ශාන්තිකර්මයක් සඳහා පැමිණෙන ලෙස ඔහුට ඇරයුම් කළේය. එයට එකපයින් කැමැති වූ සැකකාර කපුවා ශාන්තිකර්මය සිදු කිරීමට යමින් සිටියදී අත්අඩංගුවට ගෙන තිබිණි.

සැකකාර කපුවා අත්අඩංගුවට ගෙන කරන ලද ප්‍රශ්න කිරීම්වලදී ඔහු පාපොච්චාරණය කර ඇත්තේ තමන් මින් පෙර සොරකම් ගණාවක් කළ බවයි.

මාතලේ සිට නුවර දෙසට පයින් එන අතරේ සොරකම් කළ යතුරුපැදිය දුටු බවත් පසුව එය රැගෙන ගිය බව සැකකරු පවසා තිබේ. යතුරුපැදියේ අංක තහඩු දෙක ගලවා වැසිකිළි වළකට දැමූ බවත් කියා ඇත්තේය.

තවද මෙම පුද්ගලයා විසින් බකමුණ කළුගඟ පාරේ නිවෙසකින් දුරකතනයක් සොරාගෙන ඇති අතර අලුවිහාරේ ප්‍රදේශයේ නිවෙසකින්ද දුරකතනයක් සොරාගෙන තිබේ. එම දුරකතන දෙකද මේ වන විට පොලිසිය විසින් සොයාගෙන ඇත. තවද ලග්ගල පත්තිනි දෙවාලයේ තිබුණු දේව ප්‍රතිමා දෙකක්ද සොරාගෙන ඇති මොහු මැණික් ගලක් බව පැවසෙන පාෂාණයක් ද සොරකම් කළ බවට පවසා තිබිණි. එම මැණික් ගල ඔහු සිටින දේවාලේ බිත්තියක කපරාරුව මත සඟවා තිබූ බව පොලිසිය පවසයි.



සුමතිපාල- ජෝතිපාල



01 වැනි පිටුවෙන්...

ලක්ෂ 10කින්...

මන්ත්‍රිවරයා මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ ඉකුත් ද පැවැති පාර්ලිමේන්තු ගෘහ්‍ය කාරක සභාවටය. මේ වන විට රුපියල් දෙලක්ෂයක් වන මන්ත්‍රි රක්ෂණාවරණය ප්‍රමාණවත් නොමැති බවත් එහෙයින් එම රක්ෂණාවරණය වැඩි කළ යුතු බවටත් මන්ත්‍රිවරයා යෝජනා කර තිබේ.

පවතින තත්ත්වය මත මෙම වසරේදී එය ක්‍රියාත්මක කිරීමට නොහැකි බවත් ලබන වසරේදී ඒ සම්බන්ධයෙන් සලකා බැලිය හැකි බවත් කථානායකවරයා එම අවස්ථාවේ ප්‍රකාශ කර තිබෙන බවත් ඉහත ආරංචි මාර්ග කීවේය.

මෙම රක්ෂණාවරණය රුපියල් ලක්ෂ දහයක් දක්වා වැඩි කිරීමට ගෙන ඇති කැබිනට් තීරණය ක්‍රියාත්මක වීමට නම් ඒ සඳහා පාර්ලිමේන්තු ගෘහ්‍ය කාරක සභාවේදී අනුමැතිය හිමි විය යුතුය. මන්ත්‍රි රක්ෂණාවරණය වැඩි කිරීම පිළිබඳව ඉකුත් අප්‍රේල් මස පැවැති ගෘහ්‍ය කාරක සභාවේදීත් සාකච්ඡා කර තිබූ නමුත් කිසිදු තීරණයකට එළැඹී නැත.

කැටගොඩගේ යෝජනාව...

තිබෙන මහනගර සභා හා පළාත් පාලන ආයතන සංශෝධිත පනත් කෙටුම්පතේ අන්තර්ගත වගන්තිවලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන උල්ලංඝනය වන බවත් එම කෙටුම්පත සම්මත කරන්නේ නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක විශේෂ බහුතර ඡන්දයකින් අනුමත වී එය ජනමත විචාරණයකින්ද අනුමත විය යුතු බවත් නීතිපතිවරයා ඊයේ (24 වැනිදා) ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දුන්නේය.

අදාළ පනත් කෙටුම්පතේ අන්තර්ගත විධිවිධානවලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වන බවට තීන්දුවක් ලබාදෙන ලෙස ඉල්ලා ගොනුකර තිබුණු පෙත්සම් 27 ක් ඊයේ යළි විභාගයට සඳහා කැඳවූ අවස්ථාවේදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ආචාර්ය අවන්ති පෙරේරා විසින් මෙම දැනුම් දීම සිදු කළාය.

ප්‍රියන්ත ජයවර්ධන, කුමුදුනි වික්‍රමසිංහ සහ අචල වෙංගප්පුලි යන මහත්ම මහත්මීන් ගෙන් සමන්විත ත්‍රිපුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල ඉදිරියේ පෙත්සම් විභාගය පැවැත්විණි.

එහිදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරිය අධිකරණය හමුවේ දන්වා සිටියේ ජනතාවගේ ඡන්ද බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර තිබෙන ජනතා පරමාධිපත්‍යයේ කොටසක් බවයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රජය විසින් මහජනතාවට තමන්ගේ නියෝජිතයන් නිදහස්ව හා සාධාරණව තෝරා ගැනීමට අවස්ථාව සලසා දිය යුතු බව අවධාරණය කර ඇතැයිද ඇය පෙන්වා දුන්නාය.

විසුරුවා හැර තිබෙන පළාත් පාලන ආයතන යළි කැඳවීම සඳහා විෂය භාර අමාත්‍යවරයාට යෝජිත මෙම පනත් කෙටුම්පත තුළින් බලය පවරා තිබේ.

ඒ තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් 4 (ආ), 10, 12 (1), 14 (1) අ යන වගන්ති උල්ලංඝනය වීමක් සිදුවන බව සඳහන් කළ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරිය එම පනත් කෙටුම්පත සම්මත කිරීමට නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර ඡන්දයකින් අනුමත වී ජනමත විචාරණයකින්ද අනුමත විය යුතු බවත් සඳහන් කර සිටියාය.

ඉන්අනතුරුව පෙත්සම්විභාගයඅවසන්කළශ්‍රේෂ්ඨාධිකරණය අදාළ පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ රහසිගත නිගමනය පාර්ලිමේන්තුවේ කථානායකවරයා වෙත දැනුම් දෙන බවත් නිවේදනය කළහ.

අදාළ පනත් කෙටුම්පත අභියෝගයට ලක්කරමින් සමගි ජන බලවේගය මහ ලේකම් රංජිත් මද්දුම බණ්ඩාර, ජාතික ජන බලවේගයේ සාමාජිකයි න්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ඇතුළු පාර්ශ්ව 27 ක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පෙත්සම් ගොනුකර තිබිණි.

ඇහැලියගොඩ ...

මෙම සිද්ධියට හෝමාගම, පනාගොඩ පදිංචි කාන්තාවන් දෙදෙනකු ඇතුළු සිවුදෙනෙකු පොලිස් අත්අඩංගුවට ගෙන තිබේ.

බීමතින් වෑන් රථයක් පදවාගෙන පැමිණි පුද්ගලයකු ඇහැලියගොඩ පොලිස් රථවාහන අංශය මගින් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත. වෑන් රථයේ සිටි බීමත් පුද්ගලයන් හා කාන්තාවන් වෑන් රථ රියැදුරු අත්අඩංගුවට ගැනීමට විරෝධය පාමින් පොලිස් ස්ථානය තුළට පැමිණ කලහකාරීව හැසිරී ඇත.

එහිදී රාත්‍රි රාජකාරි සඳහා වාර්තා කර සිටි සැරයන් ආරියවංශ විසින් මෙම පිරිසට චෝදනාගාරයෙන් පිටතට යන්නැයි නියෝග කළ පසුව කාන්තාවන් දෙදෙනා ඔහුගේ කම්මුලට පහරදී බිම දමාගෙන පහරදී ඇත.

පහර කෑමෙන් පොලිස් සැරයන්ට මුහුණේ හා අත්වල සීරීම් තුවාල සිදුවී තිබේ.

බණ්ඩාරගමින් පුපුරන ද්‍රව්‍ය තොගයක් සොයා ගැනේ

■ බිමල් ජයසිංහ-බණ්ඩාරගම

ඉතා රහසිගත ලෙස ගබඩා කර තිබූ පුපුරන ද්‍රව්‍ය තොගයක් බණ්ඩාරගම ගුන්ගමුව ප්‍රදේශයෙන් සොයාගත් බව කළුතර අපරාධ කොට්ඨාසය සඳහන් කරයි. ඒවා රැගෙන ආ බව කියන පුද්ගලයකු පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත.

එම සැකකරු සමග ඇමෝනියා කිලෝ 8 යි, ගෑම් 500 ක් කළු කුඩු නොහොත් වෙඩි බෙහෙත් ග්‍රෑම් 444 ක්, ඩෙටනෙටර් 45 ක්, වෝටර් ජෙල් කරල් 23 ක්, විවිධ ප්‍රමාණවලින් යුත් සේවා නූල් කොටස් 14 ක් පොලිස් භාරයට ගෙන ඇත.

නීති විරෝධී ආකාරයෙන් පුපුරන ද්‍රව්‍ය තොගයක් සඟවා ඇති බවට බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාසයේ පොලිස් කොස්තාපල් (77780) සම්පත් නිලධාරියාට ලද රහසිගත තොරතුරක් අනුව දින ගණනාවක් මුළුල්ලේ සිදු කළ දීර්ඝ විමර්ශනයකින් අනතුරුව මෙම වැටලීම සිදුකර ඇත.

කුඩා කබඩ් එකක ඉබි යතුරු දමා සඟවා තිබියදී එම පුපුරන ද්‍රව්‍ය තොගය සොයා ගත් පොලිසිය ඊට අදාළ බලපත්‍ර සැකකරුගෙන් ඉල්ලා සිටියත් කිසිදු බලපත්‍රයක් ඉදිරිපත් කිරීමට සැකකරු අපොහොසත්ව තිබූ බව පොලිසිය කියයි.

නීති විරෝධී ආකාරයෙන් ගබඩා කර තිබූ මෙම පුපුරන ද්‍රව්‍ය තොගය කිසියම් අපරාධයක් කිරීමේ අරමුණින් ගබඩා කර තබා ගත්තද ? එසේත් නැත්නම් මුදලට අලෙවි කිරීම සඳහා ගබඩා කර තබා ගත්තාද ? යන්න වැඩිදුර විමර්ශන කරන බව පොලිසිය කියයි. සැකකරු හොරණ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

කළුතර අපරාධ කොට්ඨාසයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක තිලංග සංජීව, උප පොලිස් පරීක්ෂක මධුෂාන් පොලිස් සැරයන්වරුන් වන 55301 ගුණේන්ද, 41104 සමන් තිලක, 69479 ප්‍රසන්න ,69415 ජයසූරිය පොලිස් කොස්තාපල්වරුන් වන 98857 අන්ජුල, 97057 ප්‍රසන්ජන වැටලීම සිදුකළහ.

පොලිස් භාරයට ගත් පුපුරන ද්‍රව්‍ය තොගය

01 වැනි පිටුවෙන්...

ගාල්ලේ පහේ පන්තිවලට...

මෙසේ උකුණන් බෝවීම නිසා ප්‍රධාන වශයෙන්ම එම ළමුන්ගේ අධ්‍යාපනයට සහ නින්දට දැඩි ලෙස බාධා මතුවී ඇත.

රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ සිසුන් සහ ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා කාර්යාලයේ නිලධාරීන් එක්ව ගාල්ල නගරය සහ ඒ ආශ්‍රිත පාසල් කිහිපයක පස්වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවන් හාරසිය විස්සක් යොදාගෙන මෙම සමීක්ෂණය සිදු කළ බව ප්‍රජා වෛද්‍ය විශේෂඥ අමිල චන්ද්‍රසිරි ප්‍රකාශ කළේය.

ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරමින් සිදුකළ මෙම සමීක්ෂණයට අනුව මෙසේ ගැහැනු ළමුන්ගෙන් සියයට හැටක ප්‍රමාණයකගේ හිස්වල අධික ලෙස උකුණන් සිටීමෙන් ඔවුන් බරපතළ ගැටලුවලට මුහුණ දෙන බව අනාවරණය වී ඇත.

තෙල් සහිත හිස පිරිසිදු නොකිරීම, දුවිලි හිස මත රැඳීම, හිස නිසි ලෙස පීරන්නේ නැතිවීම වැනි කරුණු මෙසේ ළමුන්ගේ හිස්වල උකුණන් ශීඝ්‍ර වශයෙන් බෝවීමට හේතු ලෙස පෙන්වා දිය හැකි බව මෙම සමීක්ෂණය සඳහා සහභාගි වූ චර්ම රෝග විශේෂඥ වෛද්‍ය අචලා ලියනගේ පැවසුවාය.

කෙසේ වුවද දකුණු පළාතේ සෞඛ්‍ය සහ අධ්‍යාපන නිලධාරීන් එක්ව මෙම ගැටලුව පිළිබඳව කඩිනමින් සොයා බලා එම තත්ත්වයට පිළියම් යෙදීමට සැලසුම් කර ඇති බවද ප්‍රජා විශේෂඥ වෛද්‍ය අමිල චන්ද්‍රසිරි වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

සුද්ද සිංහලෙන්ම කියලත්...

■ දීපා වසන්ති එදිරිසිංහ

මගී ජනතාව අපහසුතාවට පත් නොකරන්නැයි දුම්රිය දෙපාර්තමේන්තුවට සුද්ද සිංහලෙන් කියා ඇති බවත්, එහිදී කිසියම් ප්‍රශ්නයක් වේ නම් එය විසඳ ගත යුතු පිළිවෙළ ගැනද කලින් දන්වා ඇති බවත්, ජනමාධ්‍ය ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා ඊයේ (24 වැනිදා) දින කොළඹදී පැවැසීය.

ඊයේ දුම්රිය රියැදුරන් ක්‍රියාත්මක කළ හදිසි වැඩ වර්ජනය හේතුවෙන් මගී ජනතාව අපහසුතාවට පත්වීම සම්බන්ධයෙන් අදහස් දක්වමින් අමාත්‍යවරයා මෙසේද සඳහන් කළේය.

'දුම්රිය දෙපාර්තමේන්තුවේ මොනවහරි ප්‍රශ්නයක් තියෙනවා නම් පළමුව එය දුම්රිය සාමාන්‍යාධිකාරිවරයාට කියලා සාකච්ඡාවෙන් විසඳ ගැනීම කරන්න. එහෙම විසඳුමක් ලැබෙන්නේ නැත්නම් ඒ ගැන අමාත්‍යාංශ ලේකම්වරයාට යොමුකරලා ප්‍රශ්නයට විසඳුම් ලබාගන්න. එහෙමත් නැත්නම් විෂයභාර අමාත්‍යවරයා ලෙස හැමදම මැදිහත්වෙලා කැබිනට් පත්‍රිකා දමමින් ඒ තියෙන ගැටලු විසඳීම කරනවා.

දැන් මේ කිසිවක් නොමැතිව දුම්රිය මගීන් කොළඹට ගෙනත් එකපාරට දුම්රිය නතර කරනවා නම් වැඩට යන මිනිසුන් දහස් ගණන් අතරමං කරනවා නම්, මෙයට එරෙහිව දැඩි තීන්දුවකට ආ යුතුයි. පසුගිය කාලේ බොහෝ සහයෝගයෙන් රියැදුරන් කටයුතු කළා. කවදාවත් වර්ජනයකට ඔවුන් ගියේ නැහැ. මෙහි යම්කිසි දේශපාලන වුවමනාවක් තිබෙන්න පුළුවන්.' යැයි අමාත්‍යවරයා පැවැසීය.

මගී ජනතාව දුම්රිය සේවාව පෞද්ගලීකරණය කරන්න යැයි ඉල්ලීම් කළද තම අදහස වූයේ පෞද්ගලීකරණය කිරීම නොව දුම්රිය දෙපාර්තමේන්තුව අධිකාරියක් කර ගොඩනැංවීමට හැකියාව ඇති බවය. යැයි ඇමැතිවරයා කීය.

එසේ තීන්දුවක් ගෙන තිබියදීත් ලංකාණ්ඩුවේ දුම්රිය සේවය මේ ආකාරයට මගී ජනතාව පීඩාවට පත්කරන්නේ නම් ඒ ගැන කැබිනට් මණ්ඩලය ට දන්වා දැඩි තීන්දුව ගැනීමට සිදුවන බවද ඔහු පෙන්වා දුන්නේය.

'බොහෝම පැහැදිලිව මේ ටික සුද්ද සිංහලෙන් කියලා තියෙද්දිත් මා සෙ ක ට වරක් අමාත්‍යවරයා ලෙස සෑම වෘත්තිය සමිතියකටම සාකච්ඡාවක් ලබාදී තිබියදීත් මෙහෙම එකපාරට තීන්දු ගන්නවා නම්, රටේ නීතියක් රීතියක් තිබිලා මොකටද? මේ ආකාරයට ලක්ෂ ග ණ නින් මගී ජනතාව අපහසුතාවට පත්කරනවා නම් මේ දුම්රිය සේවය ගැන රටට කියා තීන්දුවක් ගත යුතුයි.

රටේ ජනතාව මෙය පුද්ගලීකරණය කරන්න කිව්වා. මමයි එහිදී කිව්වේ මේක පෞ ද්ගලිකරණය නොකර බේරගත හැකියි කියලා. කොහොමහරි දැන් ඒ දේ වෙන්නේ නැත්නම් විකල්පයකට යා යුතුයි.'

ලංකාව හත්පාරක්...

මෙවර ජන හා නිවාස සංගණනය පවත්වනු ලබන්නේ 15 වැනි වරටය. අවසන් වරට ජන හා නිවාස සංගණනයක් පවත්වනු ලැබුවේ 2012 සහ 2013 වසරවලදීය.

මේ වසරේ (2023) සහ ලබන වසරේදී (2024) ජන හා නිවාස සංගණනය පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර, මෙම සංගණනයට අදාළ කටයුතු ආරම්භ කර ඇත්තේ ඉකුත් 2018 වසරේදීය. මුලින්ම ලංකාවේම සිතියම් සකස් කර ඇති අතර, දෙවැනි අදියර යටතේ මේ වසරේදී ග්‍රාම නිලධාරීන් යොදාගෙන සිතියම්වල තිබෙන ගොඩනැගිලි ලැයිස්තුගත කිරීම සිදු කෙරෙන බව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

මේ අනුව ජන සංගණනය ලබන වසර (2024) මැදදී සිදු කිරීමට සැලසුම් කර තිබේ. ග්‍රාම නිලධාරි වසම් අනුව ටැබ් යන්ත්‍ර ලබාදීමට සැලසුම් කර ඇතැයිද එම දෙපාර්තමේන්තුව කියයි.

ටැබ් යන්ත්‍ර යොදාගෙන බදුල්ල, ගාල්ල, යාපනය යන දිස්ත්‍රික්ක ආශ්‍රිතව සංගණනයක් සිදු කළ බවද එම දෙපාර්තමේන්තුව කියයි.

ලංකාවේ පළමුවරට නිල වශයෙන් ජන සංගණනයක් සිදුකර ඇත්තේ 1871 වසරේදීය. දෙපාර්තමේන්තුව විසින් රටේ ජනගහනය සෑම වසරකම ජූලි මාසයේදී ඇස්තමේන්තුගත කිරීමක් සිදු කෙරෙන අතර, එහිදී ජාති, ආගම් අනුව වෙන් වෙන්ව ජනගහනය ඇස්තමේන්තුගත කිරීමක් සිදු නොකෙරේ.

මෙවර ජන හා නිවාස සංගණන සඳහා ඇස්තමේන්තුගත වියදම 2019 වසරේ සිට ඉදිරියට රුපියල් මිලියන 2840 ක් ලෙස ගණන් බලා තිබේ. ඉකුත් 2022 වසර වන විටදී රටේ ඇස්තමේන්තුගත ජනගහනය දෙකෝටි විසි එක් ලක්ෂ අසූ එක් දහසකි. (22,181,000)

රියැදුරු වර්ජනයෙන්...

ප්‍රධාන මාර්ගයේ ගමන්වාර 36ක්, මුහුදුබඩ මාර්ගයේ ගමන්වාර 16ක්, පුත්තලම් මාර්ගයේ ගමන් වාර 8ක්, කැලණිවැලි මාර්ගයේ ගමන්වාර 4ක් සහ උතුරු මාර්ගයේ එක් ගමන් මාර්ගයක් වශයෙන් අවලංගු වූ බව දුම්රිය ස්ථානාධිපති සංගමයේ ලේකම් කසුන් චාමර ජයසේකර පැවසීය. මරදාන විදුලි බලවේග ධාවනාගාරයේ දුම්රිය එන්ජින් රියැදුරන් අසනීප නිවාඩු වාර්තා කර මෙම වර්ජනය සිදුකර තිබුණේ අතිකාල දීමනා කප්පාදු කිරීම, නියමිත උසස්වීම් ලබා නොදීම හා අවිධිමත් ලෙස සේවා වාර ධාවනාගාර අතර මාරු කිරීමට විරෝධය පල කරමිනි.

මෙම වර්ජනය හේතුවෙන් ඊයේ උදෑසන සහ සවස දුම්රිය ගමන්වාර ගණනාවක් අවලංගු වූ අතර මේ හේතුවෙන් මගීන්ට දැඩි පීඩාවකට මුහුණ දීමට සිදුවිය.

කෙසේ වෙතත් පෙර දැනුම් දීමකින් තොරව මෙම වර්ජනය සිදුකර තිබෙන බවත් මෙය වෘත්තිය ක්‍රියාමාර්ගයකදී අනුගමනය කළ යුතු පිළිවෙත නොවන බවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශකයෙකු සඳහන් කළේය.

මෙම වර්ජනය ක්‍රියාත්මක කළ වෘත්තිය සමිති ප්‍රධානීන් හඳුනාගෙන තිබෙන බවත් ඔවුන් සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් පරීක්ෂණයක් ආරම්භ කර තිබෙන බවත් එම ප්‍රකාශකයා කීවේය.

කෙසේ වෙතත් දුම්රිය එන්ජින් රියැදුරන් හා දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා සමගින් ඊයේ පැවති සාකච්ඡාවෙන් පසු වර්ජනය අත්හැරීමට තීරණය කෙරිණි.

පත්තර මල්ලි 25 වසර සැමරුම අද

දිනපතා පුවත්පත් සිරස්තල විද්‍යුත් මාධ්‍යයට ගෙන ඒමේ ප්‍රමුඛයා වන මාධ්‍යවේදී නුවන් ලියනගේ ගේ පත්තර මල්ලි වැඩසටහනට වසර 25ක් පිරීම නිමිත්තෙන් ඒ පිළිබඳ විශේෂ සැමරුම් වැඩසටහනක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේ අද (25 වැනිදා) හවස 03.00ට පැවැත්වේ. එහි ප්‍රධාන දේශනය ලංකාදීප කර්තෘ සිරි රණසිංහ විසින් පවත්වන අතර එහිදී 'නුවන් ලියනගේ රේඩියෝ භූමිකාව' යන මැයින් නාලක ගුණවර්ධන කෙටි දෙසුමක් පවත්වනු ඇත. ඊට අමතරව නුවන් ලියනගේ විසින් රචිත ගී කීපයක් තිළිණ රුහුණගේ ගේ සංගීත අධ්‍යක්ෂණයෙන් ගැයීමට නියමිතය.

දිනපොත

නීතිඥ කල්‍යානන්ද තිරාණගමගේ කෘතී ද්විත්වය එළි දැක්වීම

නීතිඥ කල්‍යානන්ද තිරාණගමගේ රචිත 'ද්විඝටනාත්මක භෞතිකවාදය' සහ 'වානරයාගෙන් මිනිසා කරා පරිවර්තනය වීමෙහිලා ශ්‍රමය ඉටුකළ මෙහෙවර' (පරිවර්තන) යන කෘති ද්විත්වය එළි දැක්වීමේ උත්සවය ජාතික පුස්තකාල සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේදී අද (25) සවස 3.30ට පැවැත්වේ.

රූකඩ පැංචා ළමා චිත්‍රපටය 30 වැනිදා කලමුල්ලේදී

වින්දන ආරියවංශ අධ්‍යක්ෂණය කළ 'රූකඩ පැංචා' ළමා චිත්‍රපටය කලමුල්ල පියවර පුස්තකාලයේදී ලබන 30 වැනිදා සවස 3.00ට ප්‍රදර්ශනය කෙරේ. කළුතර කලමුල්ල පියවර පුස්තකාලය සංවිධානය කරන 'විනැණ සන්ධ්‍යාව' මාසික සාහිත්‍ය කලා වැඩසටහන යටතේ මෙය නොමිලේ ප්‍රදර්ශනය කරනු ලබයි.

01 වැනි පිටුවෙන්...

පඬුකරඳ ගස...

දරළුව දුම්රිය ස්ථානයට ආසන්නයේ තිබූ කෘඩියා සෙලනිකා ගස ගලවා ඉවත් කිරීම සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගම්පහ දිසා වන නිලධාරිවරයා ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණයේ ගොනු කරන ලද පැමිණිල්ලට අනුව එම නඩුව ඊයේ (24 වැනිදා) විභාග කෙරිණි. දරළුව ප්‍රදේශයේ තිබූ කෘඩියා සෙලනිකා ශාකය අතුරුදන් බවට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණයේ බී වාර්තාවක් මුලින්ම ගොනුකර තිබිණි.

අතිරේක මහෙස්ත්‍රාත්වරයකුගේ අධීක්ෂණය යටතේ අදාළ පරීක්ෂණය සිදුකරන ලෙසද මෙහිදී නියෝග කරන ලදී.

කෘඩියා සෙලනිකා ගස තිබූ ස්ථානයේ සිට මීටර් 500 ක් පමණ දුරින් වළදමා ඇතැයි මෙහිදී මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමු පියවරේ (කඩවත - මීරිගම කොටසේ) නිලධාරීන් විසින් අධිකරණයට දැනුම් දුන්නේය.

ඒ අනුව අදාළ ස්ථානයේදී ගස සජීවීව පවතීද, නැතිද යන්න පරීක්ෂා කිරීමට නියමිතය. එතෙක් එම ස්ථානයට පොලිස් ආරක්ෂාව යොදවන ලෙසද අධිකරණය නියෝග කළේය.

වළදැමූ ගස නැවත රෝපණය කළයුතු බවට පුරාවස්තු සුරැකීමේ සංවිධානය විසින් අධිකරණයට දැනුම්දීම හේතුවෙන් ගස සජීවී තත්ත්වයෙන් පවතීද, අජීවී තත්ත්වයෙන් පවතීද යන්න පිළිබඳ පරීක්ෂා කිරීමට නියෝග කෙරිණි.

මෙහිදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගම්පහ දිසා වන නිලධාරි ඉසුරු අලවත්ත අධිකරණය හමුවේ කියා සිටියේ ශාකය නැවත රෝපණය කිරීම සම්බන්ධයෙන් කිසිදු විරුද්ධත්වයක් නොමැති බවත්, ඒ සඳහා ගස සජීවී වියයුතු බවත්ය.

ආර්ථික විශේෂඥයා...

මොහු කලක පටන් මානසික ආතතියෙන් පෙළී තිබෙන අතර ඔහු ඒ වෙනුවෙන් මානසික වෛද්‍යවරයකුගේ නිර්දේශ මත උපදේශකවරයකුගේ ප්‍රතිකාර සඳහා යොමුව ඇතැයි පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී ඇත.

තම දෙමාපියන් සමග රොස්මිඩ් පෙදෙසේ රොස්මිඩ් නිවාස සංකීර්ණයේ පදිංචිව සිටින මොහු මාසයකට වරක් මෙම උපදේශන සේවා ලබාගෙන ඇත්තේ දෙමාපියන් සිටින නිවසේදීය.

පෙරේදා උදෑසනද තම බිරිඳ සහ දරුවන් සමගින් රොස්මිඩ් පෙදෙසේ නිවසට පැමිණ ඇත්තේ මානසික ප්‍රතිකාර සඳහා යොමුවී ඇති බවත් එසේ පැමිණ සිටියදී සත්වැනි මහලේ පිහිටි නිවසේ බැල්කනියට ගොස් එයින් පහළට පැන ඇති බවත් පොලිසිය කියයි.

එම අවස්ථාවේදී ඔහුගේ බිරිඳ ද සිට ඇති අතර ඇයද පොලිසිය හමුවේ පවසා ඇත්තේ ඔහු උඩු මහලින් පහළට පැන සියදිවි නසාගත් බවය.

කුරුඳුවත්ත පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ආලෝක බණ්ඩාර සේනානායක ඇතුළු නිලධාරීන් විසින් මේ පිළිබඳ මූලික පරීක්ෂණ සිදුකළ අතර මරණය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය කොළඹ පොලිස් මෘත ශරීරාගාරයේදී සිදුවිය. එහිදී අනාවරණය වී තිබුණේ මරණයට හේතුව සියදිවි නසාගැනීමක් බවය.

ගෝල්ෆේස් ආ දැරිය ...

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ උඩුපුස්සැල්ලාව රොටස්වත්තේ පදිංචි පුද්ගලයකි.

රත්මලාන ප්‍රදේශයේ පදිංචි 07 හැවිරිදි මෙම දැරිය ගාලු මුවදොර ක්‍රීඩාංගණයේ සෙල්ලම් කරමින් සිට ඇත. එම අවස්ථාවේදී එම ස්ථානයට පැමිණි සැකකාර පුද්ගලයා දැරියගේ අතින් අල්ලාගෙන ඇයව කැටුව යාමට උත්සාහ දරා ඇත.

මෙය දුටු දෙමාපියන් කෑගැසීමත් සමග අවට පිරිස් එක්ව සැකකරු අල්ලාගෙන කොටුව පොලිසිය වෙත භාර දී ඇති අතර සැකකරු අද (25 වැනිදා) කොටුව මහෙස්ත්‍රාත් හමුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

පැය 24ක දී දියේ ගිලී 6 දෙනක් මරුට

■ එච්.අස්මී,
■ ලක්ඛිත විද්‍යාසේකර - කළුතර,
■ රේමන් අතෝනිසු - මිගමුව

රටේ සිදුවන අනතුරු වලින් වසරකට 12 000 ක් පමණ මිය යන බවත් ඒ අතරින් 1200 ක් පමණ මිය යන්නේ දියේ ගිලීමෙන් බවත් සෞඛ්‍ය අමාත්‍යාංශය කළ සමීක්ෂණ මඟින් හෙළි වී ඇත. මුහුදු, ගංගා හා වැව් අමුණුවල දියනැමීම ගොස් සිදුවන මරණ වලට වඩා නිවාසවල ඇති ළිංවලට වැටීමෙන් සිදුවන මරණ වැඩි බව ද අනාවරණය කරගෙන තිබේ.

මේ අතර පෙරේදා (23 වැනිදා) දිනයේ පමණක් දියේ ගිලීම් වලින් පුද්ගලයන් හය දෙනකු මියගොස් තවත් දෙදෙනකු අතුරුදන් වී ඇත. මීගමුව, වත්තල, කඩුවෙල,වස්කඩුව, පානදුර යන ප්‍රදේශවලින් මෙම සිදුවීම් වාර්තා විය.

මීගමුව ඒත්තුකාල මුහුදු වෙරළේ අනාරක්ෂිත ස්ථානයක දිය නැමට පැමිණි තරුණයන් තිදෙනකු දියේ ගිලී ජීවිතක්ෂයට පත්ව තිබුණි.

මෙලෙස මියගොස් ඇත්තේ එපාලෙයි බටහිර,සුන්නානමිති පදිංචි ජෙයිස්වරන් ජෙයලක්ෂ්මන් (23) , කොස්ලන්ද චන්දපුරම් හි පදිංචි සත්‍යමූර්ති සිරිවින්ත්(20) සහ හැටන් ඩගම පදිංචි වවේවිල් අරවින්දකුමාර්(20) යන තරුණයන් තිදෙනෙකි.

මේ අතර වත්තල දික්ඕවිට මුහුදේ දිය නැමට ගිය සිව් දෙනකු ද රළ පහරකට හසුව ගසාගෙන ගොස් තිබේ. ප්‍රදේශවාසීන් කඩිනමින් මැදිහත් වී මුවුන් සිව් දෙනා මුදගෙන රාගම රෝහල වෙත ඇතුළත් කර තිබුණත් ඒ අතරින් දෙදෙනකු ජීවිතක්ෂයට පත්ව තිබේ.

මෙම තරුණයන් සිව් දෙනාම අගොඩ මුල්ලේරියාව ප්‍රදේශයේ පදිංචි මිතුරන් වන අතර ඔවුන් වත්තල දික්ඕවිට මුහුදට පෙරේදා (23 වැනිදා) පැමිණ තිබුණේ රා පානය කර දිය නැම සඳහාය. එලෙස පැමිණි ඔවුන් මුහුදු ආසන්නයේ සිටි අයගේ අවවාද පවා නොසලකා දියනැම අනාරක්ෂිත බවට සඳහන්කර ඇති ස්ථානයක නැමට ගොස් ඇත.

එම අවස්ථාවේදී සිව් දෙනාම රළ පහරකට ගසාගෙන ගොස් ඇති අතර ප්‍රදේශවාසීන් මැදිහත් වී කඩිනමින් ඔවුන් ගොඩට ගෙන රාගම රෝහල වෙත රැගෙන ගොස් ඇත.

ඒ අතරින් මුල්ලේරියාව උඩුගම්පොළ පදිංචි ගයාන් සංජය නමැති 23 හැවිරිදි තරුණයා පෙරේදා (23 වැනිදා) ම මියගිය අතර රෝහල් ගතකර සිටි මුල්ලේරියාව ප්‍රදේශයේ පදිංචි උදර පින්තූ ජයවර්ධන නමැති 20 හැවිරිදි තරුණයා ඊයේ (24 වැනිදා) ජීවිතක්ෂයට පත්විය.

තවද කඩුවෙල පත්තිනි දේවාලය අසල කැලණි ගඟේ දිය නැමට ගිය කාන්තාවක ද දියේ ගිලී අතුරුදහන් වී ඇත. මෙලෙස අතුරුදන් වී ඇත්තේ කඩුවෙල ප්‍රදේශයේම පදිංචි සිනිවාසගම චන්දානි හේමලතා නමැති 61 හැවිරිදි කාන්තාවකි. ඇය නිරන්තරයෙන් මෙම ස්ථානයේ දිය නැමට යන කාන්තාවක් බව සඳහන් කරන කඩුවෙල පොලිසිය ඇය සොයා විශේෂ මෙහෙයුමක් දියත් කර තිබේ.

මේ අතර පානදුර නල්ලුරුව මුහුදේ දිය නැමට ගිය 17 හැවිරිදි තරුණයකු ද දියේ ගිලී අතුරුදන් වී තිබේ. මෙලෙස අතුරුදන්ව ඇත්තේ පානදුර ප්‍රදේශයේම පදිංචි තරුණයකු වන අතර අතුරුදන් තරුණයා සොයා නාවික හමුදාව, පොලිසිය මෙහෙයුම් දියත් කර ඇත.

වස්කඩුව මුහුදේ දිය නැමට ගොස් මුහුදේ ගිලෙමින් සිටි රුසියානු ජාතික සංචාරක යුවළක් බේරාගැනීමට ගිය පිහිනුම් උපදේශකවරයකු ද මුහුදේ ගිලී මියගොස් තිබේ.

මෙසේ මිය ගොස් ඇත්තේ කළුතර දකුණු ශ්‍රී සුමංගල පාරේ පදිංචිව සිටි කළුතර සුපර් බීච් ක්‍රීඩා සමාජය නියෝජනය කරන පාපන්දු ක්‍රීඩකයකු වූ ගමීලන්ගේ ධනුෂ්ක ප්‍රියදර්ශන නමිවූ 38 හැවිරිදි දෙදෙනෑ පියෙකි .

වස්කඩුව ප්‍රදේශයේ සංචාරක හෝටලයක පිහිනුම් උපදේශකවරයකු ලෙස සේවය කරමින් සිටි ධනුෂ්කට සංචාරකයක යුවළක් මුහුදේ ගසා ගෙන යන බවට සැලවී ඇති අතර ඒ අවස්ථාවේ දී මුවුන් බේරාගැනීමට ඔහු මුහුදට පැන තිබේ.

මේ පිළිබඳ මරණ පරීක්ෂණය කළුතර තොටමුණ නදීසි මරණ පරීක්ෂක එස් .ඒ.කුමසාරු ඉදිරියේ පැවැත් වුණි. වූ අතර එහිදී සාක්ෂි දෙමින් ධනුෂ්කගේ මිතුරකු මෙන්ම ඔහු සේවය කරන හෝටලයේ පිහිනුම් උපදේශකයකු වන ගිවන්ත මනෝජ් සිල්වා (44) මෙසේ කීවේය.

"මමත් ධනුෂ්කත් එකම හෝටලයේ වැඩ කරනවා .ධනුෂ්ක එහි පිහිනුම් නටාක භාරකරුයි. 23 උදේ සංචාරකයන් දෙදෙනකු මුහුදේ ගසාගෙන යන බවට ආරංචියක් ආවා .ඒ වහාවිටත් ධනුෂ්ක එතැනට ගිහින් තිබුණා .මමත් වෙරළට දුවගෙන ගියා . මීටර් 100ක් විතර දුරින් සංචාරකයන් දෙදෙනකු සහ ධනුෂ්ක සිටිනවා දුටුවා .ඔවුන් දියවැලකට හසුවී සිටින බවත් ගොඩබිමට ඒමට අපහසුවෙන් සිටින බවත් තේරුණා . මම වෙරළේ තිබූ ජීවිත ආරක්ෂක වළල්ල අරගෙන පිහිනා ගොස් එය සංචාරක කාන්තාවට දිගු කළා .ඇය එය අල්ලා ගත් පසු මම ඇය ගොඩබිමට ගෙන ආවා. නැවතත් වළල්ල රැගෙන ගොස් පිරිමි සංචාරකයාත් බේරා ගත්තා. ඊට පසු ධනුෂ්ක බේරා ගන්න ගියා . අඩි 4ක් විතර තියෙද්දි ධනුෂ්ක යට ගියා . මම වතුරේ කිමිදිලා ධනුෂ්ක ගොඩට ගේන්න උත්සහ කළා .එතැන දියවැලක් කරකැවුණා.ඒත් මම අමාරුවෙන් ඔහු අරගෙන ආවා ."

සැම පැය අටකදීම දියේ ගිලී තිදෙනකු මියයනවා

- විශේෂඥ වෛද්‍ය සමිත සිරිතුංග

■ වරුණි පෙරමුණ

සෑම පැය අටකටම වතාවක් දියේ ගිලීම් හේතුවෙන් මෙරට පුද්ගලයින් තිදෙනකු මිය යන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝ නොවන රෝග ඒකකයේ අනතුරු වැළැක්වීමේ අංශ ප්‍රධානි විශේෂඥ වෛද්‍ය සමිත සිරිතුංග පවසයි.

අද (25 වැනිදාට යෙදී තිබෙන ලෝක දියේ ගිලීම් වැළැක්වීමේ දිනයට සමගාමීව ඊයේ (24 වැනිදා) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවැති මාධ්‍ය හමුවේදී අදහස් දක්වමින් හෙතෙම මේ බව සඳහන් කළේය .

වසරකට 1200ක් ගිලිලා මැරෙනවා

වැඩි දෙනෙක් බිලිවෙන්නේ ළිංවලට

කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk

කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදාහැරීම් : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk

Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

වී අටුව මීයන්ට නොදෙනු පිණිස කුඹුර පාළුවෙන්නට හරිමු!

පාරිභෝගික අධිකාරියේ වැටලීම් අංශය මේ මොහොතේ සිටින්නේ නිවාඩු පාඩුවේය. 'වැටුප් සහිත' මෙකී විශේෂ නිවාඩුව ඔවුනට ලබාදී ඇත්තේ වෙළඳ අමාත්‍ය නලීන් ප්‍රනාන්දු විසිනි. ඇමැතිවරයාට අනුව මෙවැනි විශේෂ නිවාඩුවක් ලැබීම පිණිස ඔවුන් සපුරා ඇති සුදුසුකම වනුයේ අල්ලස් ගැනීමය. වැටලීම් සිදුකරන මූලාමෙන් වෙළෙඳසැල් හිමියන්ගෙන් අල්ලස් ලබාගැනීමට පාරිභෝගික අධිකාරියේ ඇතැම් නිලධාරීන් කටයුතු කරන බැවින් වැටලීම් නවතාලන බව ඇමැතිවරයා පැවසූ පුවත් ටයේ 'අරුණ' මුල් පිටුවේ පළව තිබිණි.

පසුගිය මාස කිහිපය පුරාම පිටකොටුව ප්‍රදේශයේ මෙරට තහනම් කරන ලද ආලේපන සහ සුවඳ විලවුන් අලෙවි කරන ලද වෙළෙඳසැලවල සිදුකළ වැටලීම්වලදී වැටලීම් නිලධාරීන් විසින් වෙළෙඳසැල් හිමියන්ගෙන් අල්ලස් ලබාගෙන ඇති බවට නමාට චාරිනා වූ බවද ඇමැතිවරයා මෙකී වැටලීම් නැවැත්වීමට හේතු පැහැදිලි කරමින් පවසා තිබිණි.

නලීන් ප්‍රනාන්දු ඇමැතිවරයා යනු මේ වෙළෙඳ ක්ෂේත්‍රයට අහසින් කඩා වැටුණු අයකු නොවන්නේය. ඔහු සතොස සභාපතිවරයා වශයෙන් කලක් කටයුතු කර, රූපියල් සත හා බඩු භාණ්ඩ අතර සකලවිධ සෙල්ලම් කොදිරා දැන හඳුනන්නකි. හෙතෙම මුදලාලි මානියා ක්‍රියාත්මක වන ආකාරය දන්නේය. එසේම මෑත යුගයේ සිටි අනෙකුත් සියලු වෙළෙඳ අමාත්‍යවරුන්ට වඩා පාරිභෝගික අධිකාරියේ හැසිරීම ගැන වෙනම ආකාරයේ කියවීමක් කළ අයෙකි. උපාධි ආදියෙන් සමන්විත උගත් මිනිසුන් පිරිසක් පාරිභෝගික අධිකාරියෙන් බඳවාගෙන, පාලන මිලට වඩා රූපියල් පහක් වැඩිපුරට විකිණෙන බිත්තරයක් ඇල්ලීම, රූපියල් දෙකක් වැඩි මිලට විකිණෙන හාල් ඇටයක් ඇල්ලීම වැනි සිල්ලර කටයුතුවලට යොදු ඔවුන්ව හෑල්ලුවට ලක් නොකර එයට වඩා යමක් ඔවුන්ගෙන් ලබාගත යුතු යැයි වරක නලීන් ප්‍රනාන්දු පැවසීම එයට උදාහරණයකි. ඒ අනුව පාරිභෝගික අධිකාරිය මෙන්ම වෙළෙඳ ප්‍රජාවද නොහඳුනන්නේ යැයි කිසිසේත් සිනිය නොහැකි වෙළෙඳ අමාත්‍යවරයා අඳළ වැටලීම් නිලධාරීන් ගැන කියන්නා වූ මේ කරුණ නිතලුවක් ලෙසින්ද ගත නොහැකිය. පාරිභෝගික අධිකාරියේ ඇතැම් නිලධාරීන් සිය වැටලීම් බලය අයුතු ලෙස යොදු ගනිමින් ඔසකට තම වැටුපටද වැඩි මුදලක් අනියමින් සපයාගන්න බවට වෙළෙඳ අමාත්‍යවරයා සිතාගෙන සිටින වගක් පෙනෙයි. එනිසා 'ජරාව කෑමට' අවස්ථාවක් නොදී වැටලීම් නවතාදැමිය යුතු යැයි ඇමැතිවරයා සිතනවා ඇත.

එහෙත් මේ සඳහා කළ යුතු ප්‍රතිකර්මය වැටලීම් නවතා දැමීමමද යන පැනය පවතී නැගෙයි.

වී අටුව මීයන් විසින් කා දමන්නේ නම් එයට ඇති ප්‍රතිකර්මය 'දෙන්නං තොපිට කන්න' යැයි කියා මිළඟ කන්නයේදී කුඹුර අහහැර අටුව තිස්වන්නට හැරීම ද? ඇමැතිවරයා විසින් පාරිභෝගික අධිකාරියේ වැටලීම් නවතා දැමීමට ගෙන ඇති තීරණය සහ අටුව හොරාකන මීයන්ට 'ඇඩෙ පහර ගැසීම' පිණිස කුඹුර පාළුවන්නට හැරීම අතර වෙනසක් අපි නොදකිමු.

ඇමැතිවරයා විසින් කළ යුතුව තිබුණේ වැටලීම් සඳහා ලැබී ඇති බලය කප්රුකක් බවට පත්කරගන්නා නිලධාරීන් වේ නම් ඔවුන් විසින් කරන්නා වූ අල්ලස් ගැනීම් ආදී ක්‍රියා අතරින මඟුකරගැනීම පිණිස කටයුතු යෙදීමය. 'වැටලීම් වටලන' එවැනි ක්‍රමවේදයක් සකසා අල්ලසට යටවන නිලධාරීන්ට නිසි දඬුවම් ලබාදෙන්නේ නම් ගැටලුවට සැලකිය යුතු විසඳුමක් එතැනින් ලබාගත හැකිවනවා පමණක් නොව අල්ලසට බිය නිසා හෝ අල්ලසට අකැමැතිවන නිලධාරීන් හැදෙනු ඇත. ඒ කිසිවක් නොකර වැටලීම් නැවතීම යනු පාරිභෝගිකයාට ගිනි ගෙඩි දෙන 'වෙළෙඳ රිළවුන්' වෙනුවෙන් ඉණිමං බැඳීමකි.

පාරිභෝගික අධිකාරියේ නිලධාරීන් සම්බන්ධයෙන් ඇමැතිවරයා පවසන මෙය නවත් එක් කරුණකට වඩා දැඩැන්න චෝදනාවක්ද වන්නේය. මෙම අල්ලස් චෝදනාව ඇමැතිවරයා විසින් නගනු ලබන්නේ කුමන සාධක සාක්ෂි මතදැයි හෙළි කිරි මේ වග කීමක්ද ඔහු සතුය. එසේ නැතිවුණහොත් පාරි භෝගික අධිකාරියේ නිලධාරීන්ව හිසරදයක් බවට පත්ව ඇති වෙළෙඳ ප්‍රජාවකගේ චෝදනාවක් වශයිහාගයක් රහිතවම ඇමැතිවරයා විසින් පිළිගනු ලැබ ඇැයැයි අපට සිතන්නට සිදුවනු ඇත. ඒ අනුව ඔහු විසින් ඒකපාර්ශ්වික නිරණයක් ගෙන ඇතැයි සිතන්නට සිදුවනු ඇත. නැතහොත් වෙළෙඳුන්ගේ දම් ගැයකට ඇමැති හසුවී ඇති බවක් හෝ වෙළෙඳුන්ගේ අවශ්‍යතාවක් ඉටුකරදීමට ඇමැති ක්‍රියාත්මක වී ඇතැයි සිතන්නට සිදුවනු ඇත.

එසේම වෙළෙඳසැල් වටලනු වෙනුවට මිනිස් සමට අහිතකර වූ රූකලාභණ්ඩ අලේපන සුවඳ විලවුන් ආදිය සමාජයට ඒම වැළැක්වීම සඳහා වෙළෙඳ හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පාරිභෝගික අධිකාරියේ නිලධාරීන් හා එක්ව ඇරඹීමට ඇමැතිවරයා බලාපොරොත්තු වේ. එවැනි වැඩපිළිවෙළකදී සිදුකළ හැක්කේ ශරීරයට අහිතකර රූපලාවණ්‍ය ආලේපන ආදිය මොනවාද යන්න නිසි ආකාරයෙන් හඳුනාගත් පසු ඒවා භාවිත කරන්නන්ට ඒවායේ අහිතකර බලපෑම් පිළිබඳ දැනුවත් කිරීමය. එවැනි වැඩපිළිවෙළකින් ඒ බව සිහිපත් කරමින් ඒ ආකාරයේ නිෂ්පාදන භාවිතයෙන් ඉවත් වන්නට ඔවුන්ට ප්‍රබෝධ කළ හැකිය. එය ඉතා ඵලදායී ක්‍රමවේදයක් වනු ඇත.

රෝහලකදී බෙහෙතක් විසවීම රෝගීන් මැරෙන්න හේතුවක් නොවේ

ජාතික ඖෂධ නියාමන අධිකාරිය මේ වන විට ආන්දෝලනයට ලක් වූ ආයතනයක් බවට පත්ව ඇත. එම අධිකාරියට එල්ල වන චෝදනා ගැන 'අරුණ' එහි ප්‍රධාන විධායක නිලධාරී වෛද්‍ය වීජිත් ගුණසේකරගෙන් විමසීය.

අඟුරුදු ගාණක් තිස්සේ පාවිච්චි කරන බෙහෙත්වල තත්ත්වය කොහොමද එකපාරම බාල වුණේ..?

ඒක අපටත් ප්‍රශ්නයක්. ඖෂධය තත්ත්ව පරීක්ෂාවට ලක්කරල ඒක හොඳ ගුණාත්මක ඖෂධයක් කියලා අපි තහවුරු කළත්, ඇතැම් විට ඒවා ගබඩා කිරීමේදී නියමිත උෂ්ණත්වයෙන් ගබඩා කරල නියෙනවාද? ඒවා රෝගීන්ට ලබා දීමේදී නිසි ක්‍රමවේදයන් අනුගමනය කරනවාද? යන්න පිළිබඳව වහාම සොයා බැලීමක් කළ යුතුයි.

රෝහලක් ඇතුළෙ යම් ඖෂධයක් අසාත්මික වෙලා රෝගියෙක්ට මියයාමේ හැකියාවක් තියෙනවාද?

ඒක කොහෙත්ම වෙන්න බැහැ. මොකද හුගක් වෙලාවට සසාත්මික වෙන්නේ පෙනිසිලින් කාණ්ඩයේ ඖෂධ. මෙවැනි ඖෂධ රෝගියාට ලබා දෙන්න කලින් ඔහුගේ රෝග ඉතිහාසය හා අසාත්මික වීමේ ඖෂධ පිළිබඳව විමසා බැලීමක් කරනවා. අනික රෝහලක් ඇතුළෙ ඖෂධයක් අසාත්මික වුණොත් රෝගියා මියයැමට හේතුවක් වෙන්නේ නැහැ. ඒ සඳහා කරන්න විශාල වැඩ කොටසක් තියෙනවා.

ඖෂධ නියාමන අධිකාරියට කඩිමුඩියේ කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට තීරණය කළේ ඇයි?

නියාමන අධිකාරියට වෙනම කාර්ය මණ්ඩලයක් සිටිය යුතු බව තීරණය කළේ වසර 2015 දී. නමුත් එදා මේදා තුර සිටි සභාපතිවරු ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය මේ සඳහා අවශ්‍ය කටයුතු කළේ නැහැ. මේ නිසා මේ ආයතනය දිනෙන් දින කඩාවැටීමකට ලක්වුණා. මෙහි තත්ත්ව පාලන රසායනාගාරය 1990 ගණන්වල පටන් ගත්තේ. ආසියානු කලාපයේ හොඳම රසායනාගාරය ලෙසයි නැඳින්වුයේ. ආරම්භයේදී සේවකයෝ 100ක් විතර හිටියා. නමුත් අධිකාරිය වුණ දවසේ ඉඳලාම ඒක ටික ටික මැරිලා යන ආන්දම තමයි කටයුතු සිදුවෙලා තිබුණේ. නිලධාරීන් විශ්‍රාම යන වීට නැවත අලුතින් ගන්නේ නැති දෙක්ක තමයි නිර්මාණය වුණේ.

නව සේවකයන් බඳවා ගැනීමේ බලය පැවරෙන්නේ මෙහි සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයටයි. නමුත් ඔවුන් ක්‍රියාත්මක වෙලා නැහැ.

ඖෂධ නියාමන අධිකාරිය ඖෂධවේදය පිළිබඳ මහාචාර්යවරයෙක් නොසැලී බව පවසනවා. මේ චෝදනාවේ ඇත්ත නැත්ත කුමක්? මොකද කියන්නේ?

මේ කතාව පොඩි ඇත්තකයි, විශාල බොරුවකුයි තියෙන එකක්. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විවිධ ක්ෂේත්‍රයන්ගේ අය නියෝජනය කරනවා. මේ නියෝජනයන් අතරට ඖෂධවේදය පිළිබඳ මහාචාර්යවරයෙකුත් ඇතුළත් කර තියෙනවා. අන්න ඒ මහාචාර්යවරයා නියෝජනය නොමයි නැත්තේ. ඖෂධ නියාමන පනතේ 43 වැනි වගන්තියට අනුව ඖෂධයක් ලියාපදිංචි කිරීමේදී ඒ පිළිබඳව සොයා බැලීමට ඖෂධ පිළිබඳව විශේෂඥ කමිටුවක් සොයාබැලීමක් කරනවා. මේන්ම මේ කමිටුවේ නොමයි ඖෂධ පිළිබඳ මහාචාර්යවරු සිටින්නේ. ඔවුන් නොමයි ඖෂධ අනුමත කරන්නේ. මෙම කමිටුවේ මහාචාර්යවරු තුන්දෙනෙක් සිටිනවා. අධ්‍යක්ෂ මණ්ඩලයට ඇතැම් අවස්ථාවකදී ඖෂධ පිළිබඳ මහාචාර්යවරයෙකුගේ උපදෙසක් ලබා ගැනීමට අවශ්‍ය වුණොත් අපි ඖෂධ පිළිබඳ විශේෂඥ කමිටුවේ සිටින මහාචාර්යවරයෙකුගෙන් ලබා ගන්නවා.

හදිසි මිලදී ගැනීම් ක්‍රමවේදය මඟින් වංචනික ක්‍රියාවන්, කොමිස් ගැසීම් වැඩි වැඩියෙන් සිදුවෙන බවට චෝදනාවක් එල්ල වෙනවා. නියාමන අධිකාරිය හා හදිසි මිලදී ගැනීම් අතර තිබෙන සම්බන්ධය කුමක්ද?

නියාමන අධිකාරිය හදිසි මිලදී ගැනීම් කරන්නෙ නැහැ. අපි ප්‍රසම්පාදනය ආයතනයක් නෙවෙයි. නමුත් කවුරු හරි ප්‍රසම්පාදනයක් කරලා ඊට පදනම් ලියාපදිංචි සැපයුම්කරුවෙක් සිටියේ නැතිනම් ඒ අවස්ථාවේදී ඒ ඖෂධය මෙරටට ගෙන්වා ගන්න නියාමන අධිකාරියෙන් අවසර ඉල්ලනවා. ඉන්දියානු ඖෂධ සෝදිසා කුමය යටතේ ඖෂධ මිලදී ගැනීමේදී රාජ්‍ය ඖෂධ නිෂ්ගත සංස්ථාව, සෞඛ්‍ය අමාත්‍යාංශය අනෙත් ඉල්ලුවා මීට අවසර ලබා දෙන්න කියලා. ඒ අනුව අපි අවසර ලබා දුන්නා. මේ අනුව හදිසි මිලදී ගැනීමේදී නියාමන අධිකාරියේ ලියාපදිංචියක් නොමැති ඖෂධ ගෙනැල්ලක් සිදුවෙනවා.

ඒ විදිහට ලියාපදිංචි නොවූ ඖෂධ මෙරටට ගෙනැල්මේදී අහඹු ලෙස හෝ ඉන් නියැළියක් අරගෙන රසායනාගාරයන් තුළ පරීක්ෂා කිරීම්වලට ලක්කරනවද?

ඖෂධයක් නිෂ්පාදනය කිරීම ලෝක සම්මතයකට විය යුතුයි. good manufacturing practice (GMP) කියන සංකල්පය මත තමයි අපි ඖෂධ මෙරටට ගෙන එන්නේ. ඉන්දියාවේ මේ GMP සහතිකය සහිත සමාගම්වලින් තමයි අපි ඖෂධ ගෙනත් තියෙන්නේ. ඒ සහතිකය නැති සමාගමකින් ඖෂධ හදලා ඒක අපි ගෙනාවා නම් ඒක බරපතළ තත්ත්වයක්. අපේ රටේ යම් ඖෂධයක් ලියාපදිංචි නොවුවත් ඒ රටේ ලියාපදංචිය ලබා දීලා තිබෙන නිසා, අපි ඒ සහතික බලනවා. ඒ රටේ ඒ ඖෂධය භාවිත කරනවාද? තව රටවල් කීයකට යවනවාද? අනික යම් ඖෂධයක් කිසියම් රටක භාවිත කරලා ඉන් මිනිස් ජීවිතවලට යම් තරජනයක් වුණොත් ඒ බව ලෝකයේ සියලුම රටවල් වෙත ක්ෂණයකින් දැනුම් දීමට ජාලයක වෙලා තියෙනවා. අපි ඒවා නිතරම නිරීක්ෂණය කරලා මෙහි ප්‍රතිඵලයේ යම් ගැටලු තියෙනවාද කියලා සොයාබැලීමක් කරලා තමයි අපි මෙරට භාවිතයට අවසර දෙන්නේ. මේ ක්‍රමවේදය හරහා යම් ඖෂධය භාවිතයට නුසුදුසු කියලා වාර්තා වුණොත් ඒ සෑම රටකටම දැනුම් දීලා භාවිතයෙන් ඉවත් කරනවා.

කොහොම නමුත් මේ වන විට රෝගී ජනතාව රජයේ රෝහල්වලින් ප්‍රතිකාර ලබා ගැනීම ගිනියම් පත්වෙන කාරණයක් බවට පත්වෙලා. ජනතාවට ඇති වී තිබෙන මේ බිය නැති කිරීමට මෙනවගේ වැඩපිළිවෙළක් සකස් කර තියෙන්නේ..?

ඇත්තටම සෞඛ්‍ය අමාත්‍යාංශයේ වගකිව යුතු නිලධාරීන් ජනතාව දැනුම්වත් කිරීමට වහ වහා කටයුතු කළ යුතු වෙනවා. විශේෂයෙන්ම මාධ්‍ය මඟින් අසත්‍ය පැනයන්ට නොපමාව පිළිතුරු ලබා දිය යුතුයි. එහෙම නොවුණොත් වෙන්නේ වැරදි මතයන් සමාජගත වීමයි. දැනට වෙලා තියෙන්නෙත් එවැනි දේවල්. මේ තත්ත්වය වහාම නිවැරදි නොකළහොත් නිදහස් සෞඛ්‍ය සේවාවට සිදුවෙන්නේ බරපතළ හානියක්.

■ සංවාදය - ශ්‍රියානි විජේසිංහ

ජාතික ඖෂධ නියාමන අධිකාරිය හොර ගුණාවක් කියලා සජබ මන්ත්‍රිවරුන් පාර්ලිමේන්තුවේදී සඳහන් කළා. විපක්ෂනායකවරයා ඔහුගේ දේශනාලය වේදිකාවලින් බරපතළ ආයතනය විවේචනය කරනවා. ප්‍රධාන විධායක නිලධාරියා විදිහට එකට බබට පිළිතුරක් ඇති...

ඖෂධවලට ලියාපදිංචිය ඉල්ලූ ඇැතැම් ලිපිගොනු වසර ගණනාවක් පුරා සඟහර නිලධාරීන්ගේ මේසය යට ගොඩගැසී තිබුණා. ලියාපදිංචිය ඉල්ලූ ඇැතැම් සමාගම් මේ වන විටත් වැසී ගිහින්. ඉතින් මේ වගේ ප්‍රමාදවීම් දිහින් දිගටම සිදුවුණ. විවිධ පුද්ගලයන් අපට චෝදනා එල්ල කරන්න ප්‍රධාන හේතුව තමයි මේ ප්‍රමාදවීම. තමන්ගේ වගකීම් හරිහැටි ඉටු නොකරන නිලධාරීන් නිසා තමයි අපිට විවිධ පාර්ශ්වයන්ගේ චෝදනාවන්ට ලක්වෙන්න සිදුවෙලා තියෙන්නෙ.

පසුගිය දිනවල නියාමන අධිකාරියේ ඖෂධවේදීන් 23 දෙනෙකු සෞඛ්‍ය අමාත්‍යාංශයට බිව් හැරියේ මාරු කළා. ඒ බව කියන වගකීම් ඉටු නොකළ අයද?

වසර 2015 දී මෙය අධිකාරියක් බවට පත් වූ පසුව අපිටම කියලා සේවක මණ්ඩලයක් සිටිය යුතුව තිබුණා. මොකද එතෙක් අපිටම කියලා කාර්ය මණ්ඩලයක් තිරියේ නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබලදීම් පිරිසක් තමයි සේවය කළේ. ඒ අය සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැටුප් ගත්තා. අනෙකුත් දීමනා හා වරප්‍රසාදයන් අධිකාරියෙන් ගත්තා. මේක මුළුමනින්ම වැරදියි. කෝප් කමිටුවේදී මේ ගැන දිගින් දිගටම අපෙන් ප්‍රශ්න කළා. ඒ නිසා අපි ඖෂධවේදීන් 23 දෙනාම සෞඛ්‍ය අමාත්‍යාංශයට අන්තර්ග්‍රහණය කරලා තිබුණා ආයතන දෙකෙන් එකක් තෝරා ගන්න කියලා. අධිකාරියේ රාජකාරි කරන්න කැමති නම් ඉල්ලීමපතක් යොමුකරලා සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වෙන්න කිව්වා. නමුත් අයැැදුම්පත් යොමු කළේ මින් අටදෙනයි. ඒ අටදෙනාම සම්මුඛ පරීක්ෂණයෙන් තේරුණා. ඒ අයව අපි අධිකාරියේ සේවකයන් ලෙස බඳවා ගත්තා. අනින් අය සෞඛ්‍ය අමාත්‍යාංශයේම රැුණ.

සෞඛ්‍ය අමාත්‍යාංශයට අන්තර්ග්‍රහණය කිරීම ප්‍රධාන හේතුව ප්‍රමිතියෙන් බාල ඖෂධ සඳහා මේරටට ලියාපදිංචිය ලබාදීම හා අනයට ගනුදෙනු සිදුකර ගැනීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය කර ගැනීමට කියලා බවුහු චෝදනා කරනවා මේ ගැන මොකද කියන්නේ?

ඕනෑම කෙනෙක් තමා අකමැති දෙයක් සිදු වුණාම, කකුල් දෙක දෙපැත්තේ නියාගෙන ඉන්න ඉඩ නොදෙන්නාම විවිධ අසත්‍ය චෝදනාවන් නගනවා. ඒක ස්වාභාවිකයි. කවුරුහරි කියනවා නම් මේකැන හොරාකම් සිදුවෙනවා කියලා, හොරාකම් හොයන්න වෙනම ආයතන තියෙනවා. ඒ අයට පුළුවන් පරීක්ෂණ පවත්වන්න. අපි ඕනෑම වෙලාවක ලෑස්තියි පරීක්ෂණවලට මුහුණ දෙන්න.

ඖෂධයක් ලියාපදිංචි කිරීමට අපි ලොකු ගාණක් අයකරනවා. එසේ අය කරලත් එක ෆයිල් එකක වැඩ නිම කරන්න මාස ගාණක් ගත කරනවා. ඇතැම් නිලධාරීන් මාසෙකට එක ෆයිල් එකකවත් වැඩ කරන්නේ නැහැ. ඖෂධවල ලියාපදිංචිය ලබා ගැනීමට අනුමැතිය ඉල්ලා ෆයිල් 300ක් විතර නියාමන අධිකාරියට ලැබෙනවා. නියාමන අධිකාරියේ බවට පත් කරන්නත් කලින් ඉඳලා ලියාපදිංචිය ඉල්ලා තියෙන ෆයිල් පවා තියෙනවා. ඇතැම් සමාගම් මේ වන විට වහලා දලා. සෞඛ්‍ය අමාත්‍යාංශයට මාරු කළ ඇතැම් නිලධාරීන්ගේ මේසේ යට ෆයිල් 300ක් විතර ගොඩගසා තිබුණා. සමහර නිලධාරීන් සෙනසුරාදු පවා ඇවිත් පැය කීපයක් වැඩ කරලා යනවා. අපි ඖෂධයක් සඳහා ලියාපදිංචිය ලබා දෙන්න විශාල මුදලක් අය කරනවා නම් අපි ඒ අයට සාධාරණයක් ඉටු කරන්න අවශ්‍යයයි.

ප්‍රමිතියෙන් බාල ඖෂධ සම්බන්ධයෙන් නියාමන අධිකාරියට එල්ලවන චෝදනාවන් ගැන කතා කළොත්?

ප්‍රමිතියෙන් බාල ඖෂධ අපි කොයි වෙලාවකවත් රෝහල් වෙත බෙදාහරින්නේ නැහැ. තත්ත්ව පරීක්ෂණයේදී ප්‍රමිතියෙන් බාල ඖෂධ බව හෙළි වුණොත් අපි වහම ඒවා භාවිතයෙන් ඉවත් කරනවා. ඖෂධ භාවිත කළත් අපි අහඹු ලෙස වෙළෙඳපොළේ භාවිත කරන ඖෂධවල තත්ත්වය පරීක්ෂා කිරීමට ලක් කරනවා. ඒවායින් හෙළිවුණොත් එම ඖෂධත් තත්ත්වයෙන් බාල බව, අපි වහම ඒවා ඉවත් කරනවා. දැන් මේ දිගින් දිගටම චෝදනා එල්ල වෙලා තියෙන්නේ අපි අවුරුදු දහයක, දොළහක කාලයක ඉඳන් භාවිත කළ ඖෂධ.

ඇතැමුන් චෝදනා කරනවා නේද තත්ත්ව පරීක්ෂණවලින් බාල වුණේ ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ගෙන්වූ ඖෂධ කියලා....

ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයි. ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ගෙන්වූ ප්‍රොෆොෆෝල් ඖෂධය විතරයි තත්ත්වයෙන් බාල වුණේ. පසුගියදු ගැටලුකාරී තත්ත්වයක් ඇති කළ අක්මි දියරය අපි වසර අටක කාලයක ඉඳන් භාවිත කරන ඖෂධයක්.



ගපිරිගේ කවිය

උතුර පෙනීම...

උතුරේ වැසුණු පාසල් සංවේදනය
යුද්දෙන් උතුරු පැත්තට වුණු වසනය
ජන්දේ ළඟ නිසා එය පෙනෙනා ඉණය
ඕනෙම ආණ්ඩුවකට ඇත එපමණය

පාසල් ඊරිනෝ නම් තිරගෙවල් වැසේ
මේවා මැති ඇමතිවරු දැන් කියනු ඇසේ
උතුරේ දරුවොට නාමත් අඬනවා ඇසේ
ජන්දෙන් හරි මොකද ඒවා වුණොත් එසේ?

සංහිඳියා සමුළුව වර්ජනය කරන්න

ස.ජ.බ.-ජා.ජ.බ. තීරණය කරයි

■ විමුක්ති නානායක්කාර

ජාතික සංහිඳියා වැඩපිළිවෙළ පිළිබඳ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂ නායකයන් දැනුවත් කිරීම සඳහා කැඳවා ඇති සර්ව පාක්ෂික සමුළුව වර්ජනය කිරීමට සමගි ජන බලවේගය සහ ජාතික ජන බලවේගය තීරණය කර ඇති බව වාර්තා වේ. මෙම සර්ව පාක්ෂික සමුළුව කැඳවා ඇත්තේ ජනාධිපති රනිල් වික්‍රමසිංහය. ජනාධිපති කාර්යාලයේදී හෙට (26 වැනිදා) පස්වරු 5.30 ට සමුළුව පැවැත්වෙන අතර ඊට සියලුම පක්ෂ නායකයන්ට ආරාධනා කර තිබේ. එහෙත් සමගි ජන බලවේගය හා ජාතික ජන බලවේගය ඊට සහභාගි නොවී වර්ජනය කිරීමට තීරණය කර ඇත.

මෙරට ජාතික සංහිඳියා ප්‍රශ්නය ඊළඟ පරපුරට දුරුමකර නොදී විසඳීම සිය අරමුණ බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මෙම පක්ෂ නායකයන් සමඟ පැවැති සාකච්ඡාවේදී ප්‍රකාශ කළේය. එය දේශපාලනයට යොදු නොගන්නා බවද ජනාධිපතිවරයා මෙහිදී ප්‍රකාශ කළ අතර පක්ෂ නායකයන්ගේ එකඟතාව මත ආරම්භ වන සංහිඳියා ක්‍රියාවලිය දහඅතුන්වන ආණ්ඩුකුම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන බවද ඔහු පැවසුවේය.

සංචාරකයන් මිලියන 5ක් ඉලක්ක කර නව උපාය මාර්ගයක් දියත් කරනවා

- ජනාධිපති රනිල් වික්‍රමසිංහ

රටේ ආර්ථික වර්ධනයට දායක වීම සඳහා ඉහළ ක්‍රය ශක්තියක් සහිත සංචාරකයින් මිලියන 2.5ක් ඇතුළුව සංචාරකයන් මිලියන 5ක් ආකර්ෂණය කර ගැනීම අරමුණු කර ගනිමින් රජයේ නව සංචාරක උපාය මාර්ගය වන 'visit sri Lanka' අරගෝස්තු හෝ සැප්තැම්බර් මාසවලදී දියත් කරන බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ පැවසීය. ජනාධිපතිවරයා මේ බව සඳහන් කළේ බත්තරමුල්ල බෝට්ටර් එළි හෝටලයේ රැයේ (24 වැනිදා) සැවැති සම්මන්ත්‍රණයකට එක් වෙමිනි. ජනාධිපතිවරයා එහිදී මෙසේද කිවේය.

"අපේ රටට වාර්ෂිකව පැමිණෙන සංචාරකයින් මිලියන 2.5 ප්‍රමාණවත් වන්නේ නැහැ. අප දැන් වාර්ෂිකව සංචාරකයන් මිලියන 5ක් මෙරටට ගෙන්වා ගැනීමට ඉලක්ක කරගෙන සිටිනවා. ඉන් මිලියන 2.5ක් ඉහළ ක්‍රය ශක්තියක් සහිත සංචාරකයන් විය යුතුයි. ඉන්දියානු ඇස්තමේන්තුවලට අනුව ශ්‍රී ලංකාවට වාර්ෂිකව සංචාරකයින් මිලියන 10ක් පමණ ගෙන්වා ගත හැකියි. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් ආසියාවෙන් සහ ඉන්දියානු සාගර කලාපයෙන් පැමිණෙන සංචාරකයන්. එබැවින් සංචාරක ක්ෂේත්‍රය තුළ විශාල පරිවර්තනයක් ඇති කිරීමට අප බලාපොරොත්තු වෙනවා.

අප ඉලක්ක කරන මිලියන 05ක හා මිලියන 10ක සංචාරකයන් දෙස බැලීමේ දී, ඒ අතර විවිධ වර්ගයේ සංචාරකයින් සිටිය හැකියි. සුපරාමැති සංචාරක වාහාපාරයක් සඳහා අපේ රටට හොඳ පසුබිමක් නිබෙනවා. අපේ සංචාරක ක්ෂේත්‍රය තුළ සුපරාමැති සංචාරක වාහාපාරය ඉලක්ක කරන්නේ නම් සංචාරකයන් විශාල ප්‍රමාණයක් ආසියාවෙන් අපේ රටට පැමිණෙනවා. අප ඒ පිළිබඳ පුළුල අවධානයක් යොමු කළ යුතුයි.

ඒ සඳහා අප වැඩි වශයෙන් කාර්ය මණ්ඩල පුහුණු කළ යුතුයි. ඒ සඳහා අප සූදානම් විය යුතුයි. හෝටල් පාසල් වැඩිදියුණු කිරීම සඳහා ද අප අවධානය යොමු කර තිබෙනවා. ඒ වගේම පෞද්ගලික අංශය ද දැයක කර ගනිමින් සුපරාමැති පාසලක් ආරම්භ කිරීමටද රජය බලාපොරොත්තු වෙනවා."

මාධ්‍යයට කතා නොකරන්නැයි නිකුත් කළ චක්‍රලේඛය හකුලා නොගතහොත් වැඩවර්ජනයක්

සෞඛ්‍ය වෘත්තීය සමිති අනතුරු අඟවයි

■ චාමර පල්ලේගෙදර

සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට ඇති භාෂණයේ සහ ප්‍රකාශණයේ නිදහස සීමා කිරීමේ අදහසින් පසුගිය 20 වැනිදා නිකුත් කළ චක්‍රලේඛය අත්හිටුවීමට පියවර නොගතහොත් නැවත නොදන්වා ඒකාබද්ධ වැඩවර්ජනයක් ක්‍රියාත්මක කරන බවට සෞඛ්‍ය වෘත්තීය සමිති නායකයින් ඇතුළු පිරිස සෞඛ්‍ය අමාත්‍යාංශය පරිශ්‍රයේ "වෘත්තීය සමිති මර්ධනය කරන, සෞඛ්‍ය ලේකම්වරයාගේ දැවැන්ත වැඩවර්ජන ක්‍රියාවලියකට එළඹෙන බවද සෞඛ්‍ය වෘත්තීය සමිති සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාට යොමු කළ ලිපියේ සඳහන් වේ. සෞඛ්‍ය අයිතීන් රැක ගැනීමේ අරගලයක් ඒකාබද්ධව දියත් කිරීමට ඒකමතිකව තීරණය කරමින්, සෞඛ්‍ය වෘත්තීය සමිති 70කට අධික සංඛ්‍යාවක් විරෝධතා සංදේශකට එක්වන බව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් රැස්වීම (24) භාර දුන්නේය.

එම සංදේශය භාර දී සෞඛ්‍ය වෘත්තීය සමිති නායකයින් ඇතුළු පිරිස සෞඛ්‍ය අමාත්‍යාංශය පරිශ්‍රයේ "වෘත්තීය සමිති මර්ධනය කරන, සෞඛ්‍ය ලේකම්වරයාගේ එකලේඛය අහෝසි කරණු" ලෙස කෝපී වේලාවක් විරෝධය පළ කළේය. වෘත්තීය සමිති මර්ධනය කරන සෞඛ්‍ය ලේකම්වරයාගේ එකලේඛය හරහා වර්තමාන සෞඛ්‍ය සේවාව තුළ හෙළිවෙමින් පවතින දූෂණ, වංචා සහ අනෙකුත් අකටයුතුකම් මහජනතාවට සාධාරණ වීම වැලැක්වීම යන බව සෞඛ්‍ය වෘත්තියවේදීන්ගේ විද්වත් සංගමයේ සභාපති රවි කුමුදේශ් පැවසීය. එම නිසා මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා කඩිනම් අවස්ථාවක් ලබා දෙන ලෙසද සෞඛ්‍ය වෘත්තීය සමිති සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාට යොමු කළ ලිපිය මගින් ඉල්ලා සිටී.

විරෝධතාවට ගහන්න ගෙනා

කඳුළු ගෑස් උණ්ඩයක් පිපිරි පොලිස් නිලධාරියකුට තුවාල

■ එම්. අස්ලම්

කොළඹ පුරහල ප්‍රදේශයේ පැවැති විරෝධතාවක් විසුරුවා හැරීම සඳහා නොඑන ලද කඳුළු ගෑස් උණ්ඩයක් පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයට ආපසු රැගෙන යන අවස්ථාවේ පුපුරා යෑමෙන් සිදුවූ අනතුරකින් පොලිස් නිලධාරියකු තුවාල ලබා කොළඹ ජාතික රෝහල වෙත ඇතුළත් කර ඇත. කොළඹ විභාගමහා දේවී උද්‍යානය අසල සිට පාගමනින් පැමිණ පුරහල ප්‍රදේශයේදී විරෝධතා දැක්වීමක් පෙරේදා (23 වැනිදා) සංවිධානය කර තිබිණි. ඒ වෙනුවෙන් පොලිස් කැරලි මර්දන ඒකකයේ නිලධාරීන් රාජකාරියේ යොදවා තිබිණි.

එහිදී විරෝධතාකරුවන් ජල ප්‍රහාර එල්ල කර විසුරුවා හැරුණු අතර විරෝධතාවෙන් පසු එම ස්ථානයට රැගෙන ආ කඳුළු ගෑස් උණ්ඩ ආපසු ක්ෂේත්‍ර බලකා මූලස්ථානය වෙත රැගෙන යනු ලැබිය. එසෙස කඳුළු ගෑස් උණ්ඩ රැගෙන ගිය නිලධාරියකු පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේදී රථයෙන් බැස යන අවස්ථාවේ උණ්ඩයක් පුපුරා ගොස් තිබෙන බව නාරාහේන්පිට පොලිසිය පවසයි.

පිරමීඩ ගනුදෙනුවලින් කෝටි ගණනක් වංචා කළ සැකකාර යුවළක අත්අඩංගුවට

■ ඉෂාර රත්නකාර

නිහිවිරෝධී පිරමීඩ ගනුදෙනු කර රුපියල් කෝටි ගණනක මහජන මුදල් ලබාගත් බවට චෝදනා ඵල්ල වී තිබෙන භයානකයක නියෝජිතයන් ලෙස කටයුතු කළ යුවළක් බුධාහි සිට මෙරටට පැමිණිමේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රැයේ (24 වැනිදා) අත්අඩංගුවට ගනු ලැබිය.

ප්‍රසාද් ජයවීර සහ භද්‍රිකා මධුෂනි නමැති සැකකාර යුවළ කටුනායක ගුවන් තොටුපොළේදී එලෙස අත්අඩංගුවට ගත් බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය වෙත රැයේ දන්වා සිටියේය. අත්අඩංගුවට ගත් සැකකරුගේ ගිණුම්වල තිබූ රුපියල් කෝටි 11කට අධික මුදලක් නීතිවිරෝධී පිරමීඩාකාර ගනුදෙනු සිදුකරන මෘදකාංගයක් භාවිත කරමින් එකී තවත් සැකකරුවකුගේ ගිණුමකට හුවමාරු කර ඇතැයිද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට දන්වා සිටියේය.

අදළ භයානකයේ ගනුදෙනු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තහනම් කර තිබෙන බවත්, ඒ සම්බන්ධයෙන් අවුරුදු 10කට වැඩි බන්ධනාගාර දඬුවම් විය හැකි බවත් අත්අඩංගුවට ගෙන සිටින පිරිසට අමතරව තවත් පිරිසක් අත්අඩංගුවට ගැනීමට නියමිත බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට දන්වා සිටියේය. සැකකාර යුවළ එක් අයකුට රුපියල් ලක්ෂ 50 බැගින් ගෙවී ඇති තුනක් මත මුදාහරින ලෙස නියම කළ අධිකරණය මවුන්ට විරෙස ගහවීම තහනම් කරමින් නියෝගයක් නිකුත් කළේය.

අර්ථකථනයක් නැති නිසා බාල ඖෂධ යන්න ප්‍රතික්ෂේප කරනවා

- ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල

බාල ඖෂධ යනු කුමක්දැයි අර්ථ කථනයක් නැති බැවින් බාල ඖෂධ යන්න තමන් ප්‍රතික්ෂේප කරන බව සෞඛ්‍ය ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල ප්‍රකාශ කර තිබේ. ඇමැතිවරයා මේ බව පවසා ඇත්තේ පසුගියදා පාර්ලිමේන්තුවේ පැවැති සෞඛ්‍ය අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේදීය. ජේරාදෙණිය රෝහලේ දරුවකු මිය යෑමේ සිද්ධිය සම්බන්ධයෙන් අදහස් දක්වා ඇති ඇමැතිවරයා එම වාර්ථාවේම සිටි රෝගීන් 12 දෙනෙකුට එම ඖෂධය ලබාදී තිබූ බව සඳහන් කර ඇත.

ඉන්දියානු ණය ආධාරය නොමැති කාලසීමාවේදීන් මෙරටට ආනයනය කරන ඖෂධවලින් සියයට 80ක් භාහතයය කරන්නේ ඉන්දියාවෙන් බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් මෙහිදී සඳහන් කර ඇත. නිලධාරීන් මේ බව සඳහන් කර ඇත්තේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නැඟූ ප්‍රශ්නයකටය. මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් එම නිලධාරීන් පෙන්වා දී ඇත්තේ ඖෂධ ගෙන්වීමට අවශ්‍ය අංශ කටයුතු නොකළේ නම් මිනිසුන් මිය යන්නේ ඖෂධ නොමැති කමින් බවය.

පුංචි ඡන්දයේ පෙත්සම් හෙට තෙක් කල් තැබේ

■ ශෂි. එස්. දය්‍යා කුමාර

නියමිත පරිදි ඉකුත් මාර්තු මස 9 වැනිදා පළාත් පාලන ඡන්ද විමසීම් නොපැවැත්වීම තුළින් මහජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට නිගමනය කළ අභියාචනාධිකරණය විසින් නියම කරන ලදී.

ජාතික ජන බලවේගය වෙනුවෙන් එහි පාර්ලිමේන්තු මන්ත්‍රීනි ආචාර්ය හරිනී අමරසූරිය සහ විපදු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති පෙත්සම ඉදිරිපත්කර තිබිණි. පැහැරදී සංවිධායකයේ විධායක නිලධාරී ජනරාල් (විශ්‍රාමික) තවත් පෙත්සමක් ඉදිරිපත් කර තිබිණි.

ප්‍රමාණවත් ඉන්ධන තොග තියෙනවා

- ඇමැති කංචන විජේසේකර

■ අඛිකා ජයවීර

රජය සතුව මේ වනවිට ප්‍රමාණවත් තරම් ඉන්ධන තොග පවතින බව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය පවසයි. විදුලිබල හා බලශක්ති ඇමැති කංචන විජේසේකර සිය ට්විටර් ගිණුමේ සටහනක තබමින් සඳහන් කර ඇත්තේ පෙරේදා (23 වැනිදා) පෙරවරු 8.30 වනවිට රජය සතුව ඩීසල් මෙට්‍රික් ටොන් 133,936ක් සහ සුපර් ඩීසල් මෙට්‍රික් ටොන් 6,192ක් පවතින බවය.

ඔක්තෝබර් 92 වර්ගයේ පෙට්‍රල් මෙට්‍රික් ටොන් 35,402ක් සහ ඔක්ටේන් 95 වර්ගයේ පෙට්‍රල් මෙට්‍රික් ටොන් 5,367ක් රජය සතුව පවතින බවද විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය කියා සිටී. ඊට අමතරව ගුවන් යානා ඉන්ධන මෙට්‍රික් ටොන් 30,173ක් ද රජය සතුව පවතී. පසුගිය සති කිහිපය තුළ රජය සතු ඉන්ධන සංචිතයේ යම් අඩුවීමක් නිබුණද එය මේ වනවිට යථා තත්ත්වයට පත්කර ඇති බව විදුලිබල හා බලශක්ති ඇමැතිවරයා වැඩිදුරටත් එම පණිවිඩයේ සඳහන් කර ඇත.

මුස්ලිම් මරණ භූමිදානයට නව නිර්දේශ ඇතුළත් ගැසට් පත්‍රයක්

■ චාමර පල්ලේගෙදර

යම් රෝගී තත්ත්වයකට රජයේ ලියාපදිංචි වෛද්‍යවරයකුගේ අධික්ෂණය යටතේ ප්‍රතිකාර ලබමින් සිටියදී මියයන මුස්ලිම් ජාතිකයින්ගේ මරණය භූමිදාන කටයුතු සඳහා නිර්දේශ කිරීම සම්බන්ධයෙන් නව නිර්දේශ ඇතුළත් ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට අමාත්‍යාංශය තීරණය කර ඇත. වීයැසෝගර ඇමැති අගමැති දිනේෂ් ගුණවර්ධනගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ රැයේ (24 වැනිදා) පැවැති රාජ්‍යමණ්ඩල මෙම තීරණය ගෙන ඇත.

මුස්ලිම් මරණ සම්බන්ධ මරණ සහතික නිකුත් කිරීමේදී මතුව ඇති ගැටලුවක් පිළිබඳව නීලධාරීහු මෙහිදී පෙන්වා දුන්හ. මුස්ලිම් ජාතිකයෙකු මරණයට පත් වී පැය 24ක් තුළ භූමිදාන කටයුතු කළ යුතු වුවද අදාළ මරණ සහතික නිකුත් කිරීමේදී සිදුවන පමාව හේතුවෙන් අවසන් කටයුතු සිදු කිරීමට බාධා එල්ල වී ඇති බව මෙහිදී සාක්ෂිකාරවරු බදන් වී ඇත. එම නිසා ප්‍රතිකාර ලබමින් සිටියදී මියයන මුස්ලිම් ජාතිකයෙකුගේ මරණයක් අදළ වෛද්‍යවරයකුගේ නිර්දේශය මත භූමිදාන කටයුතු සිදු කිරීමට අවශ්‍ය නිර්දේශ ඇතුළත් ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට පියවර ගන්නා ලෙස අගමැතිවරයා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් රංජිත් අලෙක්ගට දැනුම් දී ඇත.

ගුභාචාරය

2023 ජූලි මස 25 වැනිදා අඟහරුවාදා

රාහු කාලය

සවස 3.24 සිට සවස 4.58 දක්වා

රාහු 3.10 සිට අලුයම 4.37

සුබ දිශාව - නැගෙනහිර

මරු - බස්නාහිර

මේෂ

ප්‍රේම සිහිවිලි

ප්‍රේම සිහිවිලි හේතුවෙන් ඇති වූවද එය ස්වාවර වීමේ ප්‍රවණතාවන් මොහෝ දුරට නීතාවනු ඇත. එහෙත් වඩාත් ප්‍රැල්ලිනේ ලෙස කටයුතු කිරීමට අවධානය යැත. පසුවේ මෙම අමාරුගති කෙමෙන් සැස්ස වන වට පසවේ.

වෘෂභ

අහඹු මුදල් වාසි

නිවාස කේෂ්ත්‍රයන් හෝ නම නිවස සම්බන්ධ කටයුතුවල විවිධ බාධාකාරී තත්ත්වයන් ඇති කළ හැක. හදිසි හෝ අහඹු මුදල් වාසිවලට ඉඩ ඇත. මෙලු කටයුතුවලදී මහන්න සම්බන්ධතාවන්ට උඳෙ කාලය වඩාත් ගැළපේ.

මිථුන

සන්සුන් ගති

නරගකාරී කටයුතු හෝ සන්නිවේදන කේෂ්ත්‍රයන්හි වැඩකරන අය වඩාත් ක්‍රියාශීලී වනු ඇත. ඔබත් වෙනින සන්සුන් ගති ස්වභාවයන් නිරවුල් බව සැස්ස කාලයේදී තරමක පෙනසකට පත්විය හැකිය. රැකියා කටයුතු පිළිවෙල යැන සැලකිලිමත් වන්න.

කටක

හොරිස්සුම් ගති

අභිමානයන් පිළිබඳ හැඟීමින් සිටියය පාළනයක් ඇති කරගන්න. මෙහි හොරිස්සුම් ස්වභාවයෙන් ගේතුවිය හැක. දැඩි කාලයට වඩා සැස්ස කාලය මොහෝදුරට නිදහස්ව නිබඩව ගෙවෙනු ඇත. ගායන, කතනයෙහි යෙදෙන අය වඩාත් කැපෙර වේ.

සිංහ

නොගැළපීම්

දවසේ වියඳම පිළිබඳව විශේෂයෙන් සැලකිලිමත් වන්න. ඉක්මන් ගති පැවතුම් අතාගයන් හා නොගැළපෙන බවක් දැනේ. මිතු කතා වන විලාසයන් සැස්ස වන විට වෙනස් වීය හැකිය. විවාහ යෝජනාවන්හිදී හැඟීම් ඔසිය විය හැකිය.

කන්‍යා

බාධක කරදර අවමවේ

නති මහටවම කටයුතු ගොනුකරන්න බාධක කරදර ගොනුවෙන්ට අවම කරගත හැකිවේ. විවාහ යෝජනාවන්හිදී ඔබේ ගති පැවතුම් අතාගයන් හා නොගැළපෙන බවක් දැනේ. මිතු කතා වන විලාසයන් සැස්ස වන විට වෙනස් වීය හැකිය. විවාහ යෝජනාවන්හිදී හැඟීම් ඔසිය විය හැකිය.

තුලා

හවස් කාලය සුබයි

රාජ්‍ය ආයතනයන් හා සම්බන්ධ අයට සැස්ස කාලය වඩාත් ගුභ වේ. එහෙත් ගැටළු ගැටුම්වලින් තොරව විසඳ ගැනීමට උත්සාහ කරන්න. දරුවන්ගේ කටයුතුවල සංවේදනය මෙන්ම ප්‍රමාදවීම්වලද ඉඩ ඇති කෙරේ.

වෘශ්චික

දුරබැහැරින් වාසි

රැකියාවේ කටයුතුවල නරගකාරී බව මෙන්ම ක්‍රියාශීලී බව කදඋරටත් පවතිනු ඇත. එහෙත් මානසිකව එතරම් නිදහසක් ගුණකියාව ඉව දැනීම් සහතික වේ. වැය තත්ත්වයට වැඩිදාකියක් යෙදෙන්. දුරබැහැරින් වාසි දැකිවේ.

ධනු

සහෝදර ගැටුම්

සුසුරුදු පාෂ්ණ ගෘහ්ය කදඋරටත් පවත්වාගෙන යාමට හැකි වේ. ජලය, දුව සම්බන්ධ රැකියාවල නියුතු අයට ආරෝක්‍ය ප්‍රතිලාභ අත්වීමේ ඉඩකඩ පවතී. සැස්ස කාලය විශේෂයි. සහෝදර ගැටුම් පාලනය කරගන්න.

මකර

අනෙක්‍යතය සබඳතා

කතාබහ පාලනයේ අවශ්‍යයි. නීරණ කල් නැතිව සම්මතවට විශේෂයි. අනෙක්‍යතය සබඳතා නරගෙන් දුණුසිඹියට හැකිය. නීදහසේ ගත කළ කාලය සැස්ස වන විට පෙනස් වේ. වැඩියෙන් වැයකිරීමට සිදුවේ.

කුම්භ

විවාහ යෝජනා

නමන් හා වැඩකරන අය මෙහෙයවීමේදී වඩාත් කල්පනාකාරීවන්න. පෙනෙන්නම වෙනොත් ආරක්ෂිතව කරන්න. ජලය සම්බන්ධ කරද පිටා සැස්ස කාලයේදී මහඟෙගෙවු ඇත. විවාහ යෝජනා ගැළපීම් ඉතා අසිරු වනු ඇත.

මීන

ස්ත්‍රී ගැටලු

ආර්ථික වශයෙන් වඩාත් ස්ථාවර භාවයකට ඉඩකඩ සැලසේ. එහෙත් සාමාජිකයන් කරදරකාරී දිනයක් විය හැකිය. සැස්ස කාලයේදී ජලය හා සම්බන්ධ කටයුතු පාලනය කරගන්න. ආහාරගෙන විධිමි ස්වභාවයන් ඇතිවේ. නිරිවැටීම්, ස්ත්‍රාය ගැටලු ගැන අවධානයෙන් සිටිම ගුණයි.

සංගීතේ වලියක් ගිහින්...

පුතා ගෙදර එද්දී කඩුපහරින් තාත්තා මරුට

අම්මටත් බරපතළයි

මියගිය සරත්

■ අතීන මානගේ

සංගීත සංදර්ශනයකදී ආරවුලක් ඇතිවීමෙන් සිදුවූ පහරදීමකින් තංගල්ල කුඩාවැල්ලේ දෙදෙනු පියෙකු ඊයේ(24) අලුයම මියගිය ගොස් ඇති අතර ඔහුගේ බිරිය බරපතළ තුවාල ලබා රෝහල්ගත කර ඇත.

මෙලෙස ඝාතනයට ලක්ව ඇත්තේ තංගල්ල, මධ්‍යම කුඩාවැල්ල, කෝංගහවත්තේ පදිංචිව සිටි මරක්කල මානගේ සරත් රෝහණ (64) දෙදෙනු පියෙකි.

කුඩාවැල්ල ප්‍රදේශයේ පැවැති සංගීත සංදර්ශනයක් නැරඹීමට මියගිය පුද්ගලයාගේ පුතා සහ තවත් පිරිසක් ගොස් ඇත. එහිදී ඔහින් බස්වීමක් සිදුව ඇති අතර මියගිය පුද්ගලයාගේ පුතා එතැනින් ඉවත් වී ගොස් ඇත. ඔහු නිවෙසට යාමට පෙර එම නිවෙසට පැමිණි කණ්ඩායමක් පියාට හා මවට කඩුවකින් පහරදී ඇතැයි පොලිසිය කියයි. බරපතළ තුවාල ලැබූ දෙදෙනා තංගල්ල මූලික රෝහලට රැගෙන ගොස් නිබඳිනි. සරත් රෝහණ නම් පුද්ගලයා රෝහලේදී ජීවිතක්ෂයට පත්ව ඇත. ඔහුගේ බිරිය වන සන්ධ්‍යා හෙට්ටිහේවා නම් 61 හැවිරිදි කාන්තාවක වැඩිදුර ප්‍රතිකාර සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලට මාරු කර යවා තිබිණි.

මියගිය අයගේ නිවස

තංගල්ල කොට්ඨාස ස්ථානීය අපරාධ පරීක්ෂණාගාරයේ නිලධාරිනු ස්ථානීය පරීක්ෂණය සිදුකළාය. ඝාතනයට සැකපිට වික්ටර් සුද්ද නම් අන්වර්ථ නාමයකින් හඳුන්වන පුද්ගලයකු සොයා තංගල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කේ.බී. කීර්තිරත්නගේ උපදෙස් අනුව මූලස්ථාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

මිලියන 30ක අයථා වත්කම් සිද්ධිය;

නාමල් ඇතුළු පිරිසට එරෙහි නඩුව සැප්.13 යළි කැඳවයි

■ කේ.එස්. උදයකුමාර

පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු වශයෙන් කටයුතු කරමින් අයථා ලෙස උපයාගත් රුපියල් මිලියන 30ක් ගවර්ස් කෝපරේට් සමාගමේ ආයෝජනය කිරීම තුළින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ වරදක් සිදු කළේ යැයි චෝදනාකොට නිටපු අමාත්‍ය හා පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ ඇතුළු විත්තිකරුවන් පිරිසකට එරෙහිව නීතිපතිවරයා විසින් ඉකුත් යහපාලන රජය සමයේ ගොනුකර තිබූ නඩුව නැවත සැප්තැම්බර් මස 13 වනදු කැඳවන ලෙස කොළඹ මහාධිකරණ විනිසුරු නවරත්න මාරසිංහ රැයේ (24) නියෝග කළේය.

මෙම නඩුව රැයේ කොළඹ මහාධිකරණය හමුවේ කැඳවනු ලැබූ අවස්ථාවේදී නාමල් රාජපක්ෂ මන්ත්‍රිවරයා ඇතුළු විත්තිකරුවන් අධිකරණය හමුවේ පෙනී සිටියහ.

මෙම නඩුවේ පැමිණිල්ලේ සාක්ෂි විමසීම අවසන් වී නිබෙන අතර අපරාධ නඩු විධාන සංග්‍රහයේ 200 වන වගන්තිය යටතේ විත්තියේ සාක්ෂි කැඳවීමකින් තොරව විත්තිකරුවන් නිදහස් කරන ලෙස ඉල්ලීමක් කිරීමට සූදානම් වන බව මීට පෙර විත්තියේ නීතිඥවරු විසින් අධිකරණයට දැනුම් දී තිබුණි. ඒ අනුව නඩුව නැවත සැප්තැම්බර් මස 13 වනද කැඳවීමට නියෝග කළ මහාධිකරණ විනිසුරුවරයා එදින මෙම ඉල්ලීම සම්බන්ධයෙන් තරුණු දක්වන ලෙසත් නියෝග කළේය.

පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකු වශයෙන් කටයුතු කරමින් අයථා ලෙස උපයාගත් රුපියල් මිලියන 30ක මුදලක් ගවර්ස් කෝපරේට් සමාගමේ ආයෝජනය කිරීම තුළින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ වරදක් සිදු කළේ යැයි චෝදනා කොට නිටපු අමාත්‍ය නාමල් රාජපක්ෂ ඇතුළු විත්තිකරුවන් හය දෙනෙකුට එරෙහිව නීතිපතිවරයා විසින් ඉකුත් යහපාලන රජය සමයේ මෙම නඩුව ගොනුකර තිබුණි.

සීල් මකා ඉන්දියන් බිත්තර ඇගේ ගහන්න හැදූ ගබඩාවකට සීල්

■ මනුසත් සේරසිංහ - කුලියාපිටිය

මුද්‍රා මකන ලද ඉන්දියන් බිත්තර තොගයක් අලෙවිය සඳහා සූදානම් කර තිබූ දුම්මලසූරිය ඇතුංගහකොටුව ප්‍රදේශයේ ගබඩාවකට මුද්‍රා තැබීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පෙරේදා (23) පියවර ගෙන තිබුණි.

ගොවිපොළවල නිෂ්පාදිත බිත්තර ලෙස හුවා දක්වමින් මුද්‍රා මකන ලද ඉන්දියානු බිත්තර අලෙවි කරන බවට ලද තොරතුරක් මත සමස්ත ලංකා බිත්තර නිෂ්පාදකයන්ගේ සංගමය එම ස්ථානයට ගොස් පරීක්ෂා කර තිබේ.

එහි නරක් වූ සහ ඇතුළත සෙලවෙන බිත්තර සහිත බිත්තර පිරවූ පෙට්ටි සියයකට ආසන්න ප්‍රමාණයක් තිබී ඇති අතර එහිදී අහඹු ලෙසින් ගත් බිත්තරයක් කඩා බැලීමේදී අධික දුගඳක් වහනය වී ඇත.

කෙසේ වෙතත් බිත්තර අලෙවිකරුගෙන් මේ පිළිබඳ කළ විමසීමේදී ඔහු කියා සිටියේ මිනුණු පොත හරහා ලද දුරකථන අංකයකින් ඉන්දියන් බිත්තර බැව් දැන දැනම ඒවා යළි වෙළෙඳපොළට යැවීමට මිලදී ගත් බවය.

එමෙන්ම මුද්‍රා මැකීම සඳහා එක් බිත්තරයකට රුපියල් 4ක් වැයවන බවද ඔහු පැවසීය.

එම පුද්ගලයාගෙන් බිත්තර මිලදී ගෙන යළි කොළඹ ප්‍රදේශයේ අලෙවිකිරීමට රැගෙන ගිය තරුණයන් කිහිපදෙනෙක්ද කියාසිටියේ බිත්තර බොහෝමයක් කුණුවී නිබීම නිසා ඇතැම් වෙළෙඳසල්වලින් තමන්ට පහරකෑමටද සිදුවූ බවය.

බිත්තර නිෂ්පාදකයන්ගේ සංගමය එහිදී කියා සිටියේ මෙවැනි සිදුවීම් වෙළෙඳ ඇණිවරයාගේ දැනුවත් භාවයෙන් යුතුව සිදුවන බවට තමන්ට සැක පහළ වන බවත් රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයාද මෙවැනි ක්‍රියාවලට වගකිවයුතු බවත්ය.

සිද්ධිය වූ ස්ථානයට බොහෝ පිරිසක් එක්වැස්වී උණුසුම්කාරී වාතාවරණයක් නිර්මාණය වෙමින් තිබියදී බිත්තර සංගමය වහා මැදිහත්ව දුම්මලසූරිය පොලිසිය කැඳවීමට කටයුතු කර තිබුණි.

ලියාපදිංචි නැති පෞද්ගලික පාසලකට කලක පටන් පෙළපොත් දීලා

■ නිලන්ත මදුරාවල

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ පොදුගලික පාසලකට වසර ගණනාවක සිට පෙළපොත් ලබාදීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර තිබේ.

සිසුන් අටසියයක් පමණ අධ්‍යාපනය ලබන මීරිගම ප්‍රදේශයේ පිහිටි මෙම පාසල අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි වී නොමැති බවත් මෙම පරීක්ෂණයට හේතු වී ඇත. ලියාපදිංචි නොමැති පාසලකට පෙළපොත් ලබා දිය නොහැකි බව මේ සම්බන්ධයෙන් අප කළ විමසුමකට පිළිතුරු දුන් අමාත්‍යාංශයේ උසස් නිලධාරියෙක් සඳහන් කළේය.

සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් ඉගැන්වීම් කෙරෙන මෙම පාසලේ සිසුන් විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වන විභාගවලට පෙනී සිටින අතර ඒ සම්බන්ධයෙන් ද පරීක්ෂාවට ලක් කෙරේ.

ෆාමිතෙල් කලවම් කර පොල්තෙල් යළි වෙළෙඳපොළට

පොල්තෙල් නිෂ්පාදකයෝ සහ අපනයනකරුවෝ අනතුරු ඇඟවති

■ චාමර පල්ලේගෙදර

ආහාරයට පොල්තෙල් කිලෝ ග්‍රෑමයකට රුපියල් විසිපහ බැගින් පනවන ලද බද්ද හේතුවෙන් ෆාමිතෙල් කලවම් කරන ලද පොල්තෙල් යළි වෙළෙඳපොළට අලෙවි කිරීමේ සූදානමක් ඇති බව පොල්තෙල් නිෂ්පාදකයෝ සහ අපනයනකරුවෝ පවසති.

මෙම බද්ද නිසා පොල්තෙල් මිල ඉහළ යන අතර පොල් ආශ්‍රිත නිෂ්පාදනවලින් වාර්ෂිකව ලැබෙන අපනයන ආදායම වන ඩොලර් මිලියන 700 අධික මුදලටද බලපෑම් එල්ල විය හැකි බව අපනයනකරුවෝ පෙන්වා දෙති.

පොල්තෙල් සඳහා පනවා ඇති තීරු බදු ප්‍රමාණය වැඩි වී ෆාම ඔයිල් සඳහා පනවා ඇති තීරු බදු ප්‍රමාණය අඩු වූ සෑම අවස්ථාවකම කුට වාහාරිකයන් විසින් පොල්තෙල් සඳහා ෆාම ඔයිල් කලවම් කර විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මක වූ බව පාරිභෝගික අයිනින් සුරාකීමේ ජාතික ව්‍යාපාරය කොළඹ රැයේ (24දු) පැවැත්වූ මාධ්‍ය හමුවකදී අනාවරණය කළේය.

එම ව්‍යාපාරයේ සභාපති රන්ජිත් විතානගේ මාධ්‍ය හමුවේදී අවධාරණය කර සිටියේ පැනවූ බද්ද ඉවත් කිරීමට නොහැකි නම් ෆාමිතෙල් සඳහා වන තීරු බද්ද රුපියල් විසිපහකින් වැඩි කරන ලෙසය.

බදු පැනවීමේදී අපනයනකරුවන් හෝ ආනයනකරුවන් සමග සාකච්ඡා කර නොමැති අතර මෙම නිරණයෙන් පොල්තෙල් කර්මාන්තයේ නිරත සෘජු සහ වක්‍ර රැකියාලාභීන් දැඩි අසිරුනාවට පත්ව තිබේ.

කෙසේ වෙතත් 2019 වසරේ පොල් සංවර්ධන අධිකාරියේ සංඛ්‍යා ලේඛනවලට අනුව වාර්ෂික පොල් අවශ්‍යතාවය ගෙඩි බිලියන 4යි දශම 9කි.

ගෘහාස්ථ පරිභෝජනයට අවශ්‍ය පොල් ගෙඩි සංඛ්‍යාව ගෙඩි බිලියන 1 දශම 8ක් වන අතර මෙරට පොල්තෙල් නිෂ්පාදනය කිරීම සඳහා පොල් ගෙඩි බිලියන 1 දශම 8ක් අවශ්‍ය වේ.

අපනයන ආශ්‍රිත නිෂ්පාදනය සඳහා අවශ්‍ය පොල් ගෙඩි සංඛ්‍යාව ගෙඩි බිලියන 1 දශම 3ක් වුවද වාර්ෂික පොල් අස්වැන්න වන්නේ ගෙඩි බිලියන 3යි දශම 1කි.

ඒ අනුව වාර්ෂික පොල් හිඟය ගෙඩි බිලියන 1යි දශම 8ක් වේ.

හිර තුනක් කර ගත් අනග පුතුයා කොටු

තුන් දෙනාටම දරුවො පහක් දීලා

■ සුරංග රාජනායක-ගම්පොළ

බහු විවාහ චෝදනාවකට වරෙන්තු වී වසර ඇටක් සොයමින් සිටි අයකු තුන්වැනි විවාහයක්ද කරගෙන දඹුල්ල, පැල්වෙහෙර, සේරුගස් යාය ප්‍රදේශයේ සැඟව සිටියදී ගම්පොල විශේෂ අපරාධ විමර්ශන අංශ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

ස්ත්‍රීර පදිංචියක් නොමැති 46 හැවිරිදි මොනු පළමු විවාහය නිස්සහොරාම යෝධකණ්ඩිය ප්‍රදේශයෙන් සිදුකර ගෙන ඇති අතර පසුව එම බිරිඳ අහෝසි දෙවන විවාහය ගම්පොල ගොඩවෙල ප්‍රදේශයෙන් සිදුකර ගෙන තිබේ.

එම දෙවන විවාහය පිළිබඳව පළමු බිරිඳ විසින් 2014 වසරේදී පොලිසිය වෙත පැමිණිලිකර තිබේ.

මේ අතර මොනු විසින් දෙවන බිරිඳ ද අහෝසි කළහ.

ප්‍රදේශයෙන්ද අතුරුදන්ව සිටි නිසා ඔහුට වරෙන්තු නිකුත් වී තිබිණි.

මොනුගේ පළමු විවාහයට වසර විසි හතරක් ගත වී ඇති අතර එයින් පළමු බිරිඳට දරුවන් දෙදෙනෙකු ද දෙවැනි බිරිඳට එක් දරුවකු ද තුන්වැනි බිරිඳට දරුවන් දෙදෙනකු ද සිටින බව හෙළිවී ඇත.

මෙම පුද්ගලයා අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

ගම්පොල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රදීප් රත්නායක, පොලිස් අධිකාරී අමරසිංහ යන නිලධාරීන්ගේ උපදෙස් මත විශේෂ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ටෝනි රණතුංග, පොලිස් සැරයන් 32571 වෝල්ටර්, 52460 අබයරත්න යන නිලධාරීහු පරීක්ෂණ සිදු කළහ.

භාණ්ඩ මිල ප්‍රදර්ශනය නොකළොත් වැඩ වරදී

නීති කැඩුවොත් මාස හයක් හිරේ

■ කේ. කේ. ආරියදාස-දඹුල්ල

පාරිභෝගික භාණ්ඩවල මිල ප්‍රදර්ශනය නොකරන සෑම වෙළෙඳසලකටම එරෙහිව නීතිය තදින් ක්‍රියාත්මක කරන බව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ තොරතුරු අධ්‍යක්ෂ අසේල බණ්ඩාර පැවසීය.

අධ්‍යක්ෂවරයා මේ බව ප්‍රකාශ කළේ දඹුල්ල ප්‍රදේශයේ පෙරේදා (23) වෙළෙඳසල් කිහිපයක මිල ප්‍රදර්ශනය කිරීම පිළිබඳව සොයාබැලීමේ අවස්ථාවටකට එක්වෙමින්ය.

මෙම මිල ප්‍රදර්ශනය කිරීමේ නීතිය නොග වෙළෙඳසල්, සිල්ලර වෙළෙඳසල්, ඖෂධාගාලා සහ අනෙකුත් සෑම පාරිභෝගික භාණ්ඩ අලෙවි කරන ස්ථානයකම ක්‍රියාත්මක කිරීම අනිවාර්ය අතර එසේ මිල ප්‍රදර්ශනය නොකරන වෙළෙඳසල්වලින් භාණ්ඩ මිලදී ගැනීම ප්‍රතික්ෂේප කරන ලෙස සමස්ත පාරිභෝගික ජනතාවගෙන් තමන් ඉල්ලීමක් කරන බවද හෙතෙම කීවේය.

මෙම නීතිය ක්‍රියාත්මක නොකරන වෙළෙඳසල් හිමියන් සඳහා මාස හයක සිර දඬුවම් නියම කළ හැකි බවද අධ්‍යක්ෂවරයා එහිදී සඳහන් කළේය. එමෙන්ම මෙහිදී වෙළෙඳසලක් සඳහා පැමිණ සිටි පාරිභෝගිකයෙකු අධ්‍යක්ෂවරයාට දැඩි ලෙස කියා සිටියේ පාරිභෝගික අධිකාරියේ කටයුතුවල විශ්වාසයක් ජනතාවට නොමැති බවය.

එමෙන්ම බිත්තර සඳහා පාලන මිලක් ලබා දී නිබුණද එම මිලට බිත්තර නිබෙ දැයි ඔහු ප්‍රශ්න කළේය.

එහිදී අධ්‍යක්ෂවරයා ඇතුළු නිලධාරීන් ඊට කිසිදු පිළිතුරක් ලබා නොදී එම ස්ථානයෙන් පිටවත්ව ගොස් තිබුණි.

නිවාස සිහින පෙන්වා කෝටි ගණන් සුද්ද කළ සැකකරු කඩුවෙලින් අල්ලයි

■ නිමල් ජයසිංහ-බණ්ඩාරගම

නිවාස ඉදි කර දෙන බව සහ ඉඩම් රැගෙන දෙන බව පවසා පුද්ගලයන් රැසකගෙන් රුපියල් කෝටි ගණනාවක් වංචා කළ පුද්ගලයකු කඩුවෙල නිවසක වෙස් වලාගෙන සැඟව සිටියදී අත්අඩංගුවට ගත් බව නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය කියයි.

සැකකරු සන්නකයේ තිබී දේදුනු උඩුයුම්බරලාගේ ක්‍රියාත්ත ලක්රුවන් සිරිසේන (ජාතික හැඳුනුම්පත් අංක (820304865) නමින් ව්‍යාජ හැඳුනුම්පතක් මෙන්ම love you විදේශ ගමන් බලපත්‍රයක් විමර්ශන නිලධාරීන් විසින් සොයාගෙන ඇත.

මාලඹේ උඩවත්ත ප්‍රදේශයේ සමාගමක් පවත්වාගෙන යමින් අන්තර්ජාලයේ දැන්වීම් පළ කර මෙම මහා වංචාව සිදු කර තිබූ බව පොලිසිය කියයි.

සැකකරුගේ එම වංචාවට හසුව රුපියල් කෝටි නූන හමාරකට ආසන්න ප්‍රමාණයක මුදල් අහිමි කරගත් පුද්ගලයන් 26 දෙනෙකු මිරිහාන විශේෂ අපරාධ විමර්ශන අංශය වෙත සහ මාලඹේ පොලිසිය වෙත පැමිණිලි කර තිබූ බව පොලිසිය කියයි.

එම පැමිණිලි අනුව පොලිසිය සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ඔහු කාර්යාලය පවත්වාගෙන ගිය මාලඹේ උඩවත්ත ප්‍රදේශය කරා ගියද සැකකරු ඒ වන විටත් එය වසා දමා ප්‍රදේශය හැර ගොස් තිබිණි.

ඔහු මුදල් ලබා ගත් කිසිම පුද්ගලයෙකුට නිවසක් සාදා නැති බව මේ වන විට සිදු කළ විමර්ශනවලදී අනාවරණයවී ඇතැයි පොලිස් නිලධාරියකු පැවැසීය.

සැකකරු වංචා සහගතව ලබාගත් සියලුම මුදල් කැසිනෝ ක්‍රීඩාව සඳහා යොමු කර තිබූ බව ප්‍රශ්න කිරීමේදී අනාවරණය වී ඇත. සැකකරුගේ නමින් නිබෙන බැංකු ගිණුම් සම්බන්ධයෙන් සහ සැකකරු තවත් මේ ආකාරයෙන් වෙනත් ප්‍රදේශවල සමාගම් පවත්වාගෙන යමින් මුදල් වංචා කර ඇත්දැයි සොයා තවදුරටත් විමර්ශන සිදුකරන බව පොලිසිය කියයි.

41 හැවිරිදි සැකකරු හඳුනාගැනීමේ පෙරවටුවක් සඳහා කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

නගර සභා ගොඩනැගිල්ලක වහලයක් උඩ හැඳුනුම්පත් හා පාස්පෝට් තොගයක්

වහලයේ තිබූ මුදල් පසුම්බි

■ හැමුණු චන්දලාල් - ගාල්ල

ගාල්ල, ඔරෙජ්පුවත්ත පිහිටි නගර සභා ගොඩනැගිල්ලක වහලයේ තිබී හිස් මුදල් පසුම්බි රැසක්, ජාතික හැඳුනුම්පත් තොගයක් සහ විදේශ ගමන් බලපත්‍ර කිහිපයක් නගර සභා සේවකයන් විසින් සොයාගෙන පොලිසිය වෙත භාරදී තිබේ.

එම ගොඩනැගිල්ලේ වහලය මත පිහිටි අතඟර දමා තිබෙන ජල ටැංකියක තිබූ ගසක් නගර සභා සේවකයන් විසින් ඉවත් කිරීමට යාමේදී මෙම හිස් පසුම්බි සහ හැඳුනුම්පත් තොගය හමුවී ඇත.

පොලිසිය පැවසුවේ සොරුන් විසින් නගරයේදී සහ බස් රථවලදී සොරාගත් පසුම්බි වලින් මුදල් ලබාගෙන සෙසු සියල්ල සම්ප්‍රදාය මෙම වහලය මතට විසිකර ඇති බවයි.

අදාළ හැඳුනුම්පත් අයිතිකරුවන්ට දැනුම් දීමට පියවර ගන්නා බවද පොලිසිය පැවසීය.

රජ කාලේ නිධන් හොයන කල්ලිය හඟුරන්කෙතදී අල්ලයි

නිධානය ඇති බව කියන ස්ථානය හාරා තිබූ අයුරු

■ සුරංග රාජනායක - ගම්පොළ

හඟුරන්කෙත, කොළඹ්ස්ස, නුගසෙවණ ප්‍රදේශයේ ඇළ රක්ෂිතයක නිධන් හාරමින් සිටි පුද්ගලයන් දෙලොස්දෙනකු පෙරේදා (23 වැනිදා) සවස අත්අඩංගුවට ගත් බව ගල්හා පොලිසිය සඳහන් කළේය. ඒ සඳහා යොදාගත් උපකරණ හා ඔවුන් පැමිණි වාහන ද පොලිසිය භාරයට ගෙන ඇත.

එලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ වැලිමඩ, නුවරඑළිය, දඹුල්ල, ගලේවෙල, අක්මීමන, කැකිරාව, පදවි ශ්‍රී පුර, පොලොන්නරුව සහ මැදිරිගිරිය ආදී ප්‍රදේශවල පදිංචිකරුවන් පිරිසකි. ඔවුන් විවිධ ස්ථානවල පිහිටි ඓතිහාසික ස්ථාන තෝරාගෙන නිධන් ගොඩගන්නා කණ්ඩායමක සාමාජිකයන් බව විමර්ශනවලදී අනාවරණය වී ඇත.

කොළඹ්ස්සේ නුගසෙවණ ප්‍රදේශයේ ද මහනුවර රජ සමයට අයත් නිධන් සඟවා ඇතැයි පැවසෙන අතර, එවැනි ස්ථානයක මෙම පිරිස හොර රහසේ දින ගණනාවක් පුරා කැණීම් සිදු කරමින් සිටියදී පොලිසියට ලද තොරතුරකට අනුව මෙම වැටලීම සිදුකර සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබේ.

මෙම ස්ථානයේ පුද පූජා පැවැත්වීම් සඳහා 69 හැවිරිදි පුද්ගලයකු ද සහභාගී වී ඇත. එම පිරිස ඇළ රක්ෂිතය තුළ දෝනාවක් හාරමින් සිට ඇති අතර, පොලිසිය පැමිණෙන විටත් අඩි පහළොවක් පමණ දුරට එය හාරා තිබී ඇත. වැටලීමේදී පිරිසක් පොලිසිය දැක පලා ගොස් ඇතත් එම අයද හඳුනාගෙන ඇතැයි පොලිසිය කීවේය.

පොලිස් නිලධාරීන් හාරයට ගත් දෑ අතර ජීප් රථයක්, ත්‍රිරෝද රථයක්, ගල්කඩන මැසිමක්, මන්ත්‍ර පොත් සහ යාගහෝම සඳහා ගන්නා ද්‍රව්‍ය තිබී ඇත. අත්අඩංගුවට ගත් සැකකරුවන් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

ගලහා පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සමන් ගුණසේකරගේ උපදෙස් මත අපරාධ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක සුගත් වීජේසිංහ ඇතුළු පිරිසක් මෙම වැටලීම සිදුකළහ.

නිධන් හෑමට යොදාගත් භාණ්ඩ

නුගසෙවණ රක්ෂිතයේ අඩි 15ක් දිග දෝනාවකුත් හාරලා

මෛත්‍රිට එරෙහි මූලික අයිතිවාසිකම් නඩුවේ තීන්දුව කල් යයි

■ කේ.එස්. උදයකුමාර

මහත් ආන්දෝලනයකට හුඹු දැන් රාජගිරිය රෝයල් පාර්ක් මිනිමැරුම් සිද්ධිය සම්බන්ධයෙන් මරණීය දණ්ඩනය නියම වී සිටි ජුඩ් ශ්‍රීමන්ත ජයමහ නමැති විත්තිකරුට හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් ප්‍රදානය කර තිබෙන සමාව බල රහිත කිරීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා ගොනුකර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගය අවසන් කළ ශ්‍රේෂ්ඨාධිකරණය එහි තීන්දුව ප්‍රකාශයට පත් කිරීම ඊයේ (24 වැනිදා) දින නියමයක් නොමැතිව කල් තැබුවේය.

කාන්තා මාධ්‍ය සංවිධාන එකමුතුව විසින් ඉදිරිපත් කර තිබූ මෙම පෙත්සම ඊයේ (24 වැනිදා) අස්. තුරෙරාජා, යසන්ත කෝදාගොඩ සහ ජනක් ද සිල්වා යන මහාධිකරුවන්ගෙන් සමන්විත විනිසුරු මඩුල්ල ඉදිරියේ විභාගයට ගන්නා ලදී.

පෙත්සම්කාර සහ වෙ උත්තරකාර පාර්ශ්ව විසින් වාචික දේශන ඉදිරිපත් කිරීම ඊයේ (24 වැනිදා) අවසන් කෙරුණි. ලිඛිත දේශන තිබේ නම් ඒවා අගෝස්තු 25 වැනිදට පෙර ගොනු කරන ලෙස දෙපාර්ශ්වයේ නීතිඥවරුන්ට නියෝග කළ විනිසුරු මඩුල්ල එහි තීන්දුව ප්‍රකාශයට පත් කිරීම දින නියමයක් නොමැතිව කල් තැබුවේය.

පෙත්සම්කාර සංවිධානය කියා සිටින්නේ අදාළ විත්තිකරුට සමාව ප්‍රදානය කිරීමේ දී හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන විසින් නීති නීතිමය ක්‍රියා පටිපාටිය අනුගමනය කර නොමැති බවයි. එමගින් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර තිබෙන මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වන බවට තීන්දුවක් ලබාදෙන ලෙසත් අදාළ විත්තිකරුට ප්‍රදානය කර තිබෙන සමාව බල රහිත කිරීමේ නියෝගයක් නිකුත් කරන ලෙසත් පෙත්සම්කරුවෝ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටිති.

ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් හයිබ්‍රිඩ් පහනක්

■ නිර්මානී තිලකසිරි

සාම්ප්‍රදායික පිත්තල පහන් වෙනුවට පිත්තල සහ ලාක්ෂා කර්මාන්ත දෙක ඒකාබද්ධ කරමින් පහන් නිෂ්පාදනයට සිදු කළ පර්යේෂණ සාර්ථක වූ බව ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ සභාපති සම්පත් ඇරගෙපොළ පැවසීය.

සාම්ප්‍රදායික පිත්තල නිෂ්පාදන සහ ලාක්ෂා නිෂ්පාදන සඳහා පවතින ඉල්ලුම මේ දිනවල විශාල ලෙස අඩුවී ඇති බැවින් ඒ වෙනුවට පිත්තල සහ ලාක්ෂා එකතුකර නව නිර්මාණයක් සිදු කළ බව ද හෙතෙම කීවේය. ජාතික ශිල්ප සභාවේ පී.කේ. විජේසිංහ ශිල්පියා විසින් මෙම නිර්මාණය සිදුකර ඇති අතර, ඉදිරියේදී එම පහන් වෙළෙඳපල වෙත නිකුත් කිරීමට නියමිත බව ද සභාපතිවරයා සඳහන් කළේය. නිෂ්පාදකයන්ට මෙම පහන් අලෙවියෙන් වැඩි ම්ලක් ලබාගැනීමේ අවස්ථාවක් පවතින බව ද ඒ මහතා පැවසුවේය.

පිත්තල පහනට හාදේකයක් ලෙස නිපදවා ඇති මෙම පහන පොල්තෙල් යොදගෙන දැල්වීමට හැකිය. එහි බඳේ කොටසක් ලාක්ෂාවලින් නිමවා ඇති අතර සෙසු කොටස් පිත්තල වලින් සකසා තිබේ.

'සුරකිමු ගංගා' ව්‍යාපෘතියට මූල්‍ය අර්බුදය හරහට

■ සාලිය කුමාර ගුණසේකර

රටේ පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් 'සුරකිමු ගංගා' ව්‍යාපෘතිය නතරවී ඇතැයි අනාවරණය වේ.

2021 වසරේ ඔක්තෝබර් මාසයේදී වලවේ ගඟ මූලික කරගනිමින් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය වූ මහින්ද අමරවීර විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබේ.

මෙරට ප්‍රධාන වැව් 103ක් දූෂණය වීම අවම කරමින් සංරක්ෂණය කිරීම උදෙසා 'සුරකිමු ගංගා' ව්‍යාපෘතිය ආරම්භ කෙරිණි. අදළ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන දෙදහසක මුදලක් වෙන්කර තිබිණි. එනමුත් මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙම ව්‍යාපෘතියට වෙන්කර තිබූ මුදල් සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත.

ප්‍රමිතියට පිටින් ගබඩා කර ජංගම රථයකින් වටේටම කුකුළු මස් හා අයිස්ක්‍රීම් බෙදලා සැකකරුවන්ට දඩ

ජංගම රථය

නිලධාරීන් ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කරන අයුරු

■ සරත් හෙට්ටිගේ - හේවාහැට

මිනිස් පරිභෝජනයට නුසුදුසු ලෙස ගබඩා කර ජංගම රථයකින් කුකුළු මස් හා අයිස්ක්‍රීම් බෙදහැරි පුද්ගලයන් තිදෙනකු නලානුමිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

අදළ බෙදහැරීමේ රථය තුළ තිබී කුකුළු මස් කිලෝ ග්‍රෑම් සියයක්, අයිස්ක්‍රීම් ලීටර් හතළිහක් සහ අයිස් පැකට් දෙදස්දෙසියක් එම නිලධාරීන් විසින් සිය භාරයට ගෙන ඇත.

සෞඛ්‍යවේදී අංශක 18ක උෂ්ණත්වයක ගබඩා කළ යුතු මෙම ද්‍රව්‍යයන් නිසි ප්‍රමිතියකින් තොරව ගබඩා කර ජංගම රථයකින් බෙදහැරීමින් සිටි බව නලානුමිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සඳහන් කරයි.

සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මහනුවර අතිරේක මහෙස්ත්‍රාත්වරයා විසින් ඔවුන්ට රුපියල් විසිපන්දහසක දඩ මුදලක් නියම කර ඇති අතර, නිලධාරීන් භාරයට ගත් ද්‍රව්‍ය විනාශ කිරීමට ද නියෝග කර තිබේ.

එම නියෝගය අනුව විනාශ කරන ලද ද්‍රව්‍ය තොගයේ වටිනාකම රුපියල් එක්ලක්ෂ විසිදහසක් පමණ වෙතැයි පැවසේ.

ෂාෆ්ටර්ගේ මරණයට හේතු හොයන විශේෂඥ වෛද්‍ය කමිටුව දෙදිනක් රැස්වෙයි

■ කමල් සුරවීර - මහනුවර

මහත් ආන්දෝලනයට හුඹු දැන් දිනේෂ් ෂාෆ්ටර් මහතාගේ මරණයට හේතුව තීරණය කර ගැනීම සඳහා පත්කළ පංච පුද්ගල අධිකරණ විශේෂඥ වෛද්‍ය කමිටුව පෙරේදා (23 වැනිදා) සහ ඊයේ (24 වැනිදා) දෙදින රේරුකැනියේ වෛද්‍ය පීඨයේදී රැස්ව තිබේ.

ෂාෆ්ටර් මහතාගේ මරණය සම්බන්ධයෙන් මෙතෙක් සොයා ගත් තොරතුරු මෙම සාක්ෂිකාරවේදී විශ්ලේෂණය කිරීමට නියමිත බව සඳහන්ය.

විශේෂඥ අධිකරණ වෛද්‍යවරුන් වන ජෙරාදෙණිය විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයේ අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුවේ මහාචාර්ය දිනේෂ් පුනාන්දු, කොළඹ විශ්වවිද්‍යාලයේ අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුවේ මහාචාර්ය අසේල මෙන්ඩිස්, කරාපිටිය විශ්වවිද්‍යාලයේ අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුවේ මහාචාර්ය ෂූ.සී.පී. පෙරේරා, කරාපිටිය විශ්වවිද්‍යාලයේ අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුවේ මහාචාර්ය සී. ඒර්. රුවන්පුර සහ මහනුවර ජාතික රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය එන්. සිවසුබ්මනියම් යන මහාචාර්යවරුන්ගෙන් එම කමිටුව සමන්විතය.

පාසල් වේලාවේ මහමගදී ඇසක් අන්ධ වූ සිසුවාට

සාධාරණය ඉටුවන්නේ කවදා ද?

සේමල් සිත්මක

අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරී, අතිරේක ලේකම් පී.එල්. පත්මකුමාර ඉකුත් 17 වැනිදා අපූරු ලිපියක් නිකුත් කළේය. එම ලිපිය නිකුත් කළේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළව තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයට සිදුකළ ඉල්ලීමකට අදාළව ය.

එම තොරතුරු ඉල්ලා තිබුණේ ඉකුත් ජනවාරි මාසයේ දී අනතුරට ලක්වූ කොච්චිකඩේ, දළුවකොටුව ලොයලා විදුහලේ උසස් පෙළ ශිෂ්‍යයකු වන සේමල් සිත්මක දරුවා සම්බන්ධයෙනි. ඇසක් මුළුමනින්ම අන්ධභාවයට පත් කරමින් එම ශිෂ්‍යයා අනතුරට ලක් වූයේ පාසල් කාල වේලාවේදී මහමගදීය. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ඉල්ලා තිබුණේ මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය කළ විමර්ශනයේ නිර්දේශ ඇතුළත් වාර්තාව සහ ඊට අදාළව පාසලෙන් හෝ කතෝලික පාසල් අධ්‍යක්ෂවරයාගෙන් ලැබී තිබෙන පිළිතුරය.

තොරතුරු නිලධාරියා ඊට ප්‍රතිචාර දක්වමින් සඳහන් කර ඇත්තේ "මීගමුව ලොයලා විදුහලේ උසස් පෙළ ශිෂ්‍යයා සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් මූලික විමර්ශනයක් සිදු කරනු ලැබ නොමැති බැවින් ඉල්ලා ඇති ආකාරයේ විමර්ශන නිර්දේශ ඇතුළත් වාර්තාවක් පොදු අධිකාරිය සතුව නොමැති බව කාරුණිකව දන්වා සිටිමි' යනුවෙනි.

සිය දරුවා මුහුණ දුන් අතිශයින් බරපතළ අනතුර සම්බන්ධයෙන් ලොයලා විදුහල් කළමනාකාරීත්වය එතරම් උනන්දුවක් නොදක්වා සිද්ධිය සුළුකොට තකමින් සිටින විට පියා වන මෙරිල් ප්‍රනාන්දුපුල්ලේ ඒ සම්බන්ධයෙන් ඉකුත් මාර්තු මස 9 වැනිදා අධ්‍යාපන අමාත්‍යාංශයට පැමිණිලි කර තිබේ. එම පැමිණිල්ලේ මෙසේ සඳහන් වෙයි.

"සේමල් සිත්මක වන මගේ දරුවා මීගමුව, දළුවකොටුව ලොයලා විදුහලේ 13 ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන අතර, පාසලේ ශිෂ්‍ය භට කෝප්‍රල්වරයෙක් ලෙස කටයුතු කරයි. ඉකුත් නිදහස් දිනයේ කොළඹ ගාලුමුවදොර පැවැති නිදහස් උළෙලේ ශිෂ්‍ය භට ආචාර පෙළපාළිය සඳහා දරුවා තෝරාගෙන සිටියේය. ඊට අදාළ කටයුත්තක් සඳහා විදුහල්පති පියතුමාගේ ලිපියක් ද රැගෙන ගම්පහ නයිවල පිහිටි ජාතික ශිෂ්‍ය භට බළකා කඳවුරට මගේ දරුවාත් සහ තවත් දරුවකුත් ඉකුත් ජනවාරි මස 4 වැනිදා යතුරුපැදියකින් ගොස් ඇති නමුත්, ඒ සම්බන්ධයෙන් දෙමව්පියන් වන අපට ද කිසිදු දැනුම් දීමක් නොකෙරිණි. දෙදෙනා ගමන් කරමින් සිටි යතුරුපැදිය දිවුලපිටිය, බල්ලපාන ප්‍රදේශයේ දී ටිපර් රථයක ගැටී ඇත. එම අනතුරින් බරපතළ තුවාල ලැබූ මගේ දරුවා සහ අනෙක් දරුවා දිවුලපිටිය රෝහලටත් අනතුරුව ගම්පහ රෝහලටත් ඇතුළත් කර තිබේ. මගේ දරුවාගේ හිසට අතිශය බරපතළ හානි සිදුව තිබූ නිසා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කරන ලදි. දරුවාගේ මොළයට බරපතළ හානි සිදුව තිබූ නිසා එදින ම පැය හයක ශල්‍යකර්මයක් කළ අතර, දැඩි සත්කාර ඒකකයේ දින 18ක් ප්‍රතිකාර ගත්තේය. ඉන්පසු දැඩි නිරීක්ෂණ ඒකකයට ද යොමු කළ පසු එහි මාසයක පමණ කාලයක් ප්‍රතිකාර ගත්තේය."

දරුවාගේ පියා මෙම පැමිණිල්ල කරන්නේ කළ හැකි අන් කිසිවක් නොමැති බැවින් සහ මෙවැනි අසාධාරණයක් තවත් දරුවකුට සිදු නොවිය යුතුය යන පහන් සිතුවිල්ල ද පෙරදැරිවය.



හිස් කබලේ කොටසක් මාස හයකට පසු සවිකරලා

අනතුරින් දරුණු ලෙස හිසට හානි වී තිබී ඇති අතර, මාසයකට අධික කාලයක් රෝහල්ගතව සිටි දරුවා යළි නිවසට එන්නේ හිස් කබලේ කොටසක් රෝහලේ පටක බැංකුවේ තබමිනි. එපමණක් නොව සේමල්ගෙ එක් ඇසක් මුළුමනින්ම අන්ධ තත්ත්වයට පත් වීමට තරම් අනතුර දරුණු ය. එම හිස් කබල කොටස සේමල්ගෙ හිසට සවි කෙරෙන්නේ අනතුරින් මාස හයකට පසුව ය .

උදේ පාසලට ගිය දරුවන් තමන්ගේ කිසිදු අනුදැනුමකින් තොරව නයිවල පිහිටි ශිෂ්‍ය භට බළකා කඳවුරට යැවීම සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් තිබෙන බව පියාගේ පැමිණිල්ලේ තවදුරටත් සඳහන්ය. පාසලට පැමිණෙන දරුවන්ගේ වගකීම විදුහල්පති පියතුමා ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය දැරිය යුතු නොවේ දැයි ඔහු ප්‍රශ්න කරන්නේ එබැවිනි.

එපමණක් නොව එම පියා සිය පැමිණිල්ලෙන් තවත් චෝදනාවක් සිදු කරයි. එනම් මෙම දරුවන් අනතුරට ලක්වීමේ වගකීම විදුහල්පති පියතුමා භාර නොගන්නා බවයි.

"අවස්ථා දෙකකදී රුපියල් විසි පන්දහස බැගින් ලබා දුන් නමුත්, දරුවා අනතුරට ලක් වීමේ වගකීම පියතුමා භාර නොගැනීම අපගේ සිත් සතන් කළඹන්නේ ය. මගේ දරුවාට සිදු වූ අනතුරේ වගකීමෙන් පාසලට මිදිය නොහැකිය යන්න මගේ විශ්වාසයයි. එහෙයින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා මාගේ දරුවාට සාධාරණයක් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.' යනුවෙන් ද පැමිණිල්ලේ සඳහන්ව තිබේ.

එම පැමිණිල්ලෙන් පසු අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ පී. සී. කේ. පිරිස්යාල, විෂය සමගාමී හා මාර්ගෝපදේශ එස්. ජී. සුබසිංහ, ජාතික පාසල් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තික්ෂණ ලියනගේ, පෞද්ගලික පාසල් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ඊ. එස්. පී. සිල්වා සහ රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරිනී පී. එන්.ඩී. පෙරේරා යන අයගෙන් සමන්විත පරීක්ෂණ කණ්ඩායම මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කෙරෙන්නේ අමාත්‍යාංශ ලේකම් නිහාල් රණසිංහගේ ද අනුමැතිය මත ය.

එම නිලධාරීන් සිද්ධිය සම්බන්ධ විමර්ශන කටයුතු සඳහා පාසලට යන්නේ ඉකුත් මාර්තු මස 22 වැනිදා වන අතර, පිටු අටකින් යුත් එම පරීක්ෂණ වාර්තාව මැයි මස 22 වැනිදාතමින් නිකුත් කර තිබේ.

සේමල් සිත්මක සිසුවාගේ හිසට ආබාධයක් සිදු වී ඇති බවත් ඔහුගේ හිස් කබලේ කොටසක් කොළඹ ජාතික රෝහලේ පටක බැංකුවේ තැන්පත් කර ඇති බවත් නිරීක්ෂණය කර ඇති පරීක්ෂණ කණ්ඩායම ඔහුගේ එක් ඇසක් සම්පූර්ණයෙන් අන්ධ වී ඇති බව දෙමාපියන් විසින් ප්‍රකාශ කරන ලද බව ද පරීක්ෂණ වාර්තාවේ සඳහන් කර ඇත.

සේමල් සිත්මක සමග අනතුරට ලක්වූ දුරේක්ෂ අභිෂේක් සිසුවාගේ පාදයක් ආබාධ වී ඇති බවද සේමල් සිත්මක සිසුවාට සිදුව ඇති හානිය අනුව මෙම වසරේ උසස් පෙළ විභාගයට පෙනී සිටීමට හැකි වේද යන්න පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් ඇති බව අනාවරණය වූයේ යැයි ද එහි තවදුරටත් සඳහන් වෙයි.

ජාතික ශිෂ්‍යභට බළකායේ නිලධාරීන් විසින් මෙම සිසුන් නිදහස් දින උත්සවයේ ආචාර පෙළපාළියට තෝරා ගෙන ඇති බව හෝ තෝරා ගැනීමේ පරීක්ෂණය සඳහා සහභාගි විය යුතු බව පාසලේ විදුහල්පති පියතුමා දැනුවත් කර ඇත්තේ නිශ්චිත ක්‍රමවේදයෙන් පරිබාහිරව බව ද කමිටුව නිගමනය කර තිබේ. එමෙන්ම සේමල් සිත්මක හා දුරේක්ෂ අභිෂේක් යන සිසුන් මීට පෙර ද යතුරුපැදියෙන් පුහුණුවීම් සඳහා ගොස් තිබෙන බව නිගමනය කරන කමිටුව තවත් වැදගත් නිගමනයක් කරයි. එනම් සිසුන් පාසලෙන් බැහැර වීම සඳහා යොදා ගත් ප්‍රවාහන මාධ්‍ය පිළිබඳව හා ඔවුන්ගේ භාරකාරීත්වය පිළිබඳව ඉතා අඩු අවධානයක් යොමු කිරීම මෙම අනතුරට එක් හේතුවක් ය යන්න ය. එම හේතුව පාදක කර ගනිමින් කමිටුව සඳහන් කරන්නේ සේමල් සිත්මක සිසුවා හට මූල්‍යමය වශයෙන් උපකාර කරන ලෙස එම විද්‍යාලයේ කළමනාකරු වෙත යෝජනා කිරීම සුදුසු බව ය.

අමාත්‍යාංශයෙන් අප ඉල්ලා සිටියේ මෙම පරීක්ෂණ වාර්තාව සහ එම පරීක්ෂණ වාර්තාව නිගමන ද සමග ලොයලා විදුහලට යැවීමෙන් පසු පාසල් කළමනාකාරීත්වයෙන් ලද ප්‍රතිචාරයයි. අනතුර සම්බන්ධ වගකීම භාර ගත නොහැකි බව පාසල් කළමනාකාරීත්වය අමාත්‍යාංශයට ලිඛිතව ම දැනුම් දී තිබේ. මූල්‍ය ආධාරයක් ලබා දීම ද ප්‍රතික්ෂේප කර තිබේ. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් යටතේ ඉල්ලා සිටියේ එම තොරතුරු ය.

එහෙත් එවන් විමර්ශනයක් පවත්වා නොමැති බැවින් විමර්ශන වාර්තාවක් නොමැති බව පොදු අධිකාරියක් ද ඇඳ ගනිමින් තොරතුරු නිලධාරියා දැන දැනම සත්‍ය තත්ත්වය සමාජගත වීම වළක්වාලීම සඳහා උත්සාහ කරන බව පෙනේ. එය වඩාත් ගම්‍ය වන්නේ සිසුවාට මූල්‍ය ආධාරයක් කිරීමට අදාළව කමිටුව කරන නිර්දේශය සම්බන්ධයෙන් පාසලේ ප්‍රතිචාරය ගැන කිසිදු සඳහනක් නොකිරීමට තොරතුරු නිලධාරියා සූක්ෂ්ම වීමෙනි.

විමර්ශනය සහ පරීක්ෂණය යන වචන දෙකේ අර්ථය දඩමීමා කර ගනිමින් තොරතුරු නිලධාරීන්ට සත්‍ය වසං කිරීමට හැකියාවක් පවතින බව මෙමගින් පෙනේ. ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා නොමැති බව තොරතුරු නිලධාරියා පවසන්නේ ඒ සම්බන්ධයෙන් පැහැදිලි පරීක්ෂණයක් කර තිබෙන තත්ත්වයක දී ය.

රෝහලේ ප්‍රතිකාර ලබන සිසුවා

විදුහල්පතිට සිසුන් ගැන වගකීමක් නැද්ද? පරීක්ෂණයක් කර දරුවාට සාධාරණයක් ඉටුකරන්න

- සේමල් සිසුවාගේ පියා

සිසුවාට මූල්‍ය උපකාරයක් කරන්න

අමාත්‍යාංශ කමිටුවෙන් යෝජනාවක්

හැත්තෑපන් ලක්ෂයක් සානුකම්පිත දීමනාවක් ලෙස ගෙවන්න බෑ සිසුන් ගියේ පාසලෙන් පරිබාහිර වැඩකට

චෝදනා බොරු

අසනීපය ගැන කනගාටුයි

- ලොයලා විදුහලේ අධ්‍යක්ෂ කෙනඩි පෙරේරා පියතුමා

රුපියල් හැත්තෑ පන් ලක්ෂයක් වැනි විශාල මුදලක් සානුකම්පිත දීමනාවක් ලෙස ගෙවීමේ කිසිදු හැකියාවක් නොමැති බව ලොයලා විදුහලේ අධ්‍යක්ෂ කෙනඩි පෙරේරා පියතුමා පවසයි.

පියතුමා මේ බව සඳහන් කරන්නේ දරුවාට සිදු වූ අනතුරට අදාළව වන්දි මුදලක් ඉල්ලා පාසලෙන් කර ඇති ලිඛිත ඉල්ලීමට ලිඛිතව ප්‍රතිචාර දක්වමිනි.

එම දීර්ඝ ලිපියේ මෙසේද සඳහන් වෙයි.

"ඔබගේ පුත්‍රයා ද ඇතුළු සිසුන් සහභාගී වූ එකී තෝරා ගැනීමේ පරීක්ෂණය කිසිසේත්ම අප විද්‍යාලය හෝ විද්‍යාලයීය ශිෂ්‍ය භට බණ්ඩය නියෝජනය කරමින් සහභාගී වූ කටයුත්තක් නොවූ බවත් එය මුළුමනින් ම ලෙයලා විද්‍යාලයීය ශිෂ්‍ය භට බණ්ඩයේ සාමාන්‍ය ක්‍රියාකාරකම්වලට පරිබාහිර කටයුත්තක් වූ බවත් සඳහන් කළ යුතුය.

සත්‍ය දැන දැනම පදනම් විරහිත අසත්‍ය කරුණු හුවා දක්වමින් හා මට සහ විද්‍යාලයට සාවද්‍ය චෝදනා එල්ල කිරීම සම්බන්ධයෙන් අප මහත් අපහසුතාවට පත්වූ බවත් එය ඔබේත් ඔබගේ දරුවන්ගේත් පාසල වන අප විද්‍යාලයේ කීර්ති නාමයට ද විශාල හානියක් බවත් කාරුණිකව සිහිපත් කර දෙමි.

අප විද්‍යාලය කතෝලික අධ්‍යාපන ආයතනයක් වන අතර, පාසල් සිසුන්ගෙන් ලැබෙන පහසුකම් ගාස්තු සහ රජයෙන් මෙන් ම අනෙකුත් ආකාරවලින් ලැබෙන මුදල්වලින් නඩත්තු වන ලාබ නොලබන ආයතනයකි. අප වැනි විද්‍යාලයකට ඔබ විසින් ඉල්ලා සිටින රුපියල් හැත්තෑ පන් ලක්ෂයක් වැනි විශාල මුදලක් සානුකම්පිත දීමනාවක් ලෙස ගෙවීමේ කිසිදු හැකියාවක් නොමැති බව කනගාටුවෙන් දැනුම් දෙමි.

කෙසේ වෙතත් පෞද්ගලිකව මමත්, අප විද්‍යාලයත් ඔබගේ පුත්‍රයා වෙනුවෙන් හැකි සෑම ආකාරයේ සහයක් ම ලබාදීමට උත්සාහ කරන බව දන්වා සිටිමි. ඔබගේ පුත්‍රයාගේ හදිසි රෝගී තත්ත්වය සම්බන්ධයෙන් සහ ඒ හේතුවෙන් ඔබත් ඔබේ පවුලේ සාමාජිකයනුත් පත් වී ඇති තත්ත්වය සම්බන්ධයෙන් අපගේ කනගාටුව පළ කරමු.

උසස් පෙළ විභාගයට පෙනී සිටීමට සුදුනම් වන සිසුවකුගේ එක් ඇසක් ජීවිත කාලයට ම අන්ධභාවයට පත් කරමින් ගඳ සුවඳ නොදැනෙන තරමට ස්නායු ආබාධ ඇති කරමින් ඒ දරුවා සිය ජීවිතයේ මුහුණ දුන් අතිශය හයංකරම අත්දැකීමෙන් තවමත් විඳවමින් සිටියි.

උසස් පෙළ විභාගය නොවැම්බර් මස 27 වැනිදා ආරම්භ කරන බව විභාග දෙපාර්තමේන්තුව මේ වන විට තීරණය කර ඒ සඳහා අයැදුම්පත් ද කැඳවා අවසන් ය. එහෙත් සේමල් සිත්මකට විභාගය සම්බන්ධයෙන් ඇත්තේ අපැහැදිලි අපේක්ෂාවකි. ඉකුත් ජනවාරි මාසයේ සිට ඔහු තවමත් සිටින්නේ ගෙදර ය.

ලොයලා විදුහල යනු කතෝලික සභාව යටතේ පාලනය වන ප්‍රදේශයේ කීර්තිමත් පාසලක් බව නොකිවමනා ය. මෙම පාසලට ඇතුළත් වීමේ ලංසු තැබෙන්නේ රුපියල් ලක්ෂ ගණනිනි. එමෙන් ම පාසලට ඇතුළත් වූ දින සිට සෑම වාරයක් පාසාම ගාස්තු ගෙවීමට ද සිදු වෙයි. සේමක සිත්මල් ද පළමු ශ්‍රේණියට ඇතුළත්ව දහතුන ශ්‍රේණිය දක්වා පැමිණ ඇත්තේ සෙසු දරුවන් සේම විශාල මුදලක් වැය කරමිනි. එහෙත් සේමල්ගේ අනතුරට අදාළව යම් හෝ මුදලක් වැය කිරීමට පාසල් කළමනාකාරීත්වය උත්සුක වූයේ නැත. අමාත්‍යාංශයේ නිර්දේශය අනුව හෝ මූල්‍යාධාරයක් දීම ප්‍රතික්ෂේප කර තිබේ. පසුගිය දිනක දෙමව්පියන් හමු වී ඇති ගුරුවරුන් පිරිසක් තවත් යම් මුදලක් පිරිනමා තිබේ. එහෙත් ඇසක් අන්ධ වීමේ වන්දිය රුපියල් ශතවලින් මැනිය නොහැකි බව සඳහන් කළ යුතුය.

එවන් අසරණ තත්ත්වයකට පත්ව සිටින දරුවකුට අදාළ සත්‍ය තොරතුරු දැන දැනම වසං කිරීමට කවර හෝ බලපෑමක් මත නිලධාරීන් මෙලෙස කටයුතු කිරීම කිසිසේත් අනුමත කළ නොහැකි ය.

රජයේ අනුමත ආධාර ලබන පෞද්ගලික පාසල්වල රජයේ වැටුප් ලබන ගුරුවරු හාරදහසකට අධික පිරිසක් වෙති. ඔවුන් වෙනුවෙන් පසුගිය වසරේ රජය දරා ඇති වියදම රුපියල් කෝටි දෙසිය පනස්තුන ඉක්මවයි. මහජන මුදලින් වැටුප් ලබන ගුරුවරුන්ට දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධ වගකීමෙන් මිදීමට කිසිසේත් හැකියාවක් නොමැත. සේමල් සිත්මකගේ අනතුර ඒ බව මනාව කියාපාන්නේ ය. අවම වශයෙන් මින් ඉදිරියට හෝ සේමල් සිත්මක වැනි තවත් දරුවකුට මෙතරම් බරපතළ අනතුරකට ලක් වීමට ඇති ඉඩකඩ අහුරාලීමේ වගකීමෙන් රජයේ වැටුප් ලබන ගුරුවරුන්ට මිදිය නොහැකි වන අතර ම, සත්‍ය තත්ත්වය වසං කිරීමට කැස කවන නිලධාරීන්ට එරෙහිව ද නීතිමය පියවර ගත යුතු නොවන්නේද?

■ නිලන්ත මදුරාවල

වසර 38ක් බලය හොබවන කාම්බෝජ අගමැති මෙවර මැතිවරණයෙනුත් දිනුම්

අගමැති හුන් සෙන්

ජයග්‍රහණය සමරන කාම්බෝජ මහජන පක්ෂ කාමාජිකයෝ

මැතිවරණයට කලින් විපක්ෂයේ ප්‍රධාන පක්ෂය තහනම් කරලා

■ මංජුලා විජයරත්න

කාම්බෝජ මහ මැතිවරණයෙන් එරට අග්‍රාමාත්‍ය හුන් සෙන් විශිෂ්ට ජයක් අත්කරගෙන තිබේ. කාම්බෝජ මහජන පක්ෂය නියෝජනය කරමින් මහ මැතිවරණයට ඉදිරිපත් වූ හුන් සෙන් මේ ජයග්‍රහණය වාර්තා කළේ ඔහුට එරෙහිව නැගෙන විවේචන මධ්‍යයේය. හුන් සෙන්ට විරුද්ධව විවේචන එල්ල වන්නේ ඔහු වසර 38ක කාලයක් මුළුල්ලේ බලයේ හිඳිමින් මර්දනකාරී පාලනයක් ගෙනගිය බවටය. හැත්තෑ හැවිරිදි සුන් සෙන් කලහකාරී සහ රණකාමී පාලකයකු හැටියටද ප්‍රකටය. තමන්ට එරෙහිව වෙනත් කිසිදු දේශපාලන බලවේගයකට ශක්තිමත්ව නැගී සිටින්නට හුන් සෙන් ඉඩ නොතැබුවේය. විදෙස් මාධ්‍ය වාර්තාවන්හි සඳහන් වන අන්දමට කාම්බෝජ මහජන පක්ෂයට කිසියම් ආකාරයකින් බලපෑමක් එල්ල කළ කිරීමට හැකියාව තිබී ඇත්තේ "කැන්ඩිල්ලයිට්" පක්ෂයටය.

එම පක්ෂයට මහ මැතිවරණයට ඉදිරිපත් විය නොහැකි ලෙස තහනම් කිරීමට හුන් සෙන් පියවරගෙන තිබිණ. ඒ, තාක්ෂණික කාරණා පදනම් කරගෙන කැන්ඩිල්ලයිට් පක්ෂයට පසුගිය මැයි මාසයේදී වාරණයන් පැනවීමෙනි. කැන්ඩිල්ලයිට් පක්ෂය හැරුණු විට තවත් පක්ෂ දහ හතක් මහ මැතිවරණයට තරග වැද තිබුණද එම පක්ෂ කාම්බෝජ මහජන පක්ෂයට එරෙහිව තරගයක් දීමට පවා නොහැකි ඒවාය. එනිසා මහ මැතිවරණය පසුගිය ඉරිදා පැවැත්වුණේ තනි අශ්වයකුගේ සටනක් හැටියටය.

විරුද්ධ පක්ෂ නොසෑහෙන මර්දනයකට ලක්කරමින් කාම්බෝජ මහජන පක්ෂය පමණක් පෙරමුණේ හිඳිමින් පැවැත් වූ මේ මැතිවරණය සාධාරණ සහ නිදහස් මැතිවරණයක්ද යන ගැටලුව මැතිවරණ නිරීක්ෂකයෝ මතු කරති. අල්ජසීරා පුවත් සේවය සඳහන් කරන්නේ දශක කිහිපයකට පසු කාම්බෝජය අවම සාධාරණත්වයක් සහ නිදහසක් යටතේ මහ මැතිවරණය පැවැත් වූ බවයි. විශ්වසනීයත්වයෙන් තොර මහ මැතිවරණයක් කාම්බෝජයේ පැවැත් වූ බව එරට විරුද්ධ පක්ෂ නායකයෝ සහ මානව හිමිකම් සංවිධාන නියෝජිතයෝ පවසති.

මිලියන 16ක් වන කාම්බෝජ ජනගහනයෙන් මිලියන 9.7ක් ඡන්දය ලබාදීම සඳහා ලියාපදිංචි වී සිටි බව සඳහන් වේ. ඡන්දය ප්‍රකාශ කිරීම අවසන් කෙරෙන විට ප්‍රකාශිත ඡන්ද ප්‍රතිශතය 84%ක් පමණ විණ. කාම්බෝජ මහජන පක්ෂයේ ප්‍රකාශකයකු ජාත්‍යන්තර මාධ්‍යයට පවසා තිබුණේ ප්‍රකාශිත ඡන්ද ප්‍රමාණයෙන් 78%ත් 80%ත් අතර ප්‍රමාණයක් තම පක්ෂය ලබාගෙන ඇති බවයි. එසේ වුවත් ඇතැම් ඡන්ද මධ්‍යස්ථානවල ප්‍රකාශිත ඡන්දවලින් විශාල ප්‍රමාණයක් අවලංගු ඡන්ද හැටියට සැලකීමට සිදු වූ බව සඳහන් වේ. ඡන්ද පත්‍රිකා නිවැරදි නොවන අන්දමට භාවිත කර, අවලංගු වීමට සැලැස්වීමෙන් ඡන්ද දායකයන් පෙන්වා ඇත්තේ කාම්බෝජ මහජන පක්ෂයට ඇති විරෝධය බව ජාත්‍යන්තර මාධ්‍ය පවසයි.

දීර්ඝ කාලයක් පාලන බලය අතැතිව සිටින නායකයන් අතර හුන් සෙන්ගේ නම ද කියැ වේ. ඔහු බලයට පැමිණියේ 1985 වසරේදීය. ඔහු යටතේ පළමුව එහි කොමියුනිස්ට් පාලනයක් ස්ථාපනය කෙරුණ ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මැදිහත්වීම් මධ්‍යයේ එකී තත්ත්වය වෙනස් කෙරිණ. ඒ අනුව බහු පක්ෂ දේශපාලන ක්‍රමය කාම්බෝජය තුළ ඇති කිරීමට ඔහු පියවර ගත්තේය. එසේ වුවත් හුන් සෙන් ඉතා ඉක්මනින් දරදඬු ඒකාධිපති පාලකයකු බවට පත් වූයේය. දේශපාලන විචාරකයන් බන්ධනාගාරගත කිරීමට හෝ ඔවුන්ට රටෙන් පිටවන ලෙස බල කිරීමට හෝ හුන් සෙන් මෑතක පියවර ගත් බව මාධ්‍ය වාර්තාවන්හි සඳහන් වේ. දේශපාලන විචාරක ඕජට් වෙල්ෂ් සඳහන් කරන්නේ හුන් සෙන් කාම්බෝජයෙහි වර්ධනය වෙමින් පැවැති ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයන් ඉවත් කිරීමට හෝ මර්දනය කිරීමට හෝ පියවර ගත්තේ විදේශ රටවල දැඩි දෝෂදර්ශනයට ලක්වෙමින් බවයි.

හුන් සෙන් වඩාත් සමීප සබඳතා ගොඩනගාගෙන තිබෙන්නේ චීනය සමගය. බටහිර රටවල මැදිහත්වීම් නොඉවසමින් ඒ රටවල් දැඩි ලෙස විවේචනය කරන්නට හුන් සෙන් කිසිවිටෙකත් මැළි නොවේ. බටහිර රටවල්, කාම්බෝජයේ විරුද්ධවාදීන්ය යන මතය ඔහු ව්‍යාප්ත කරමින් සිටියි. මේ අතර කාම්බෝජයේ අනාගත අග්‍රාමාත්‍යවරයා බිහි කිරීමේ ප්‍රයත්නයද මේ මැතිවරණ ජයග්‍රහණයෙන් හුන් සෙන් තහවුරු කරගෙන ඇති බව දේශපාලන විචාරකයෝ දැඩිව අවධාරණය කරති. හුන් සෙන්ගේ මීළඟ ව්‍යායාමය සිය පුතා, හුන් මානෙට් කාම්බෝජයේ අග්‍රාමාත්‍ය ධුරය සඳහා පත් කිරීමයි. හුන් සෙන්ගේ දරුවන් තිදෙනාගෙන් වැඩිමහල් දරුවා වන හුන් මානෙට් මේ වනවිට හතළිස් පස් හැවිරිදි වියේ පසු වෙයි. ඔහු කාම්බෝජ යුද හමුදාවේ ඉහළ නිලයක් හොබවන බවද සඳහන් වේ.

හුන් සෙන් බටහිරට බැණ වැදුණද ඔහු තම පුතාට අධ්‍යාපනය ලබාදීම සඳහා තෝරාගෙන තිබුණේ ඇමරිකා සහ බ්‍රිතාන්‍ය අධ්‍යාපන ආයතනවීම බොහෝදෙනකුගේ අවධානයට ලක් වන කරුණකි. ඇමරිකාවේ වෙස්ට් පොයින්ට්හි ස්ථාපිත එක්සත් ජනපද මිලිටරි ඇකඩමියෙන් හුන් මානෙට් සිව් අවුරුදු ඩිප්ලෝමාවක් ලබා තිබේ. එයට අමතරව ඇමරිකාවේ නිවේයාක් විශ්වවිද්‍යාලයෙන් සහ බ්‍රිතාන්‍යයේ බ්‍රිස්ටල් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධි දෙකක් හුන් මානෙට් ලබා ඇත.

2021 වසරේදී ප්‍රකාශයක් කරමින් හුන් සෙන් කියා සිටියේ කාම්බෝජයේ අනාගත අග්‍රාමාත්‍යවරයා තම පුතා බවයි. හුන් මානෙට්ගේ දේශපාලන ආගමනය මේ වසර තුළදී සිදුවනු ඇතැයි ද අනුමාන කෙරේ. කෙසේ වුවත් හුන් සෙන් ප්‍රබලයකු ලෙස දේශපාලනයේ සිටින තුරු හුන් මානෙට්ට අග්‍රාමාත්‍ය ධුරයට ඒම අසීරු වනු ඇති බව බොහෝදෙනකුගේ විශ්වාසයයි. තව කොපමණ කලක් හුන් සෙන් අග්‍රාමාත්‍ය ධුරයේ කටයුතු කරනු ඇත්ද යන්න සැක සහිතය. අනෙක් අතට තම පියාගේ අඩි පාරේ යමින් හුන් මානෙට්ට අග්‍රාමාත්‍ය ධුරයේ තබා දේශපාලන ක්ෂේත්‍රයේවත් සාර්ථක ගමනක් යා නොහැකි බව දේශපාලන විචාරකයෝ පවසති. හුන් මානෙට් තමන්ගේ නායකත්ව ලක්ෂණ පළ කරමින් ජනතාවගේ විශ්වාසය දිනාගත යුතු බව ඔවුහු වැඩිදුරටත් පෙන්වා දෙති.

හුන් මානෙට්

බටහිරට බැන බැන පුතාට උගන්වලා තියෙන්නේ ඇමරිකා - බ්‍රිතාන්‍ය සරසවිවලින්

ළඟම හිතවතා චීනය

ටවුමෙදී ඇහැ ගැහුණ නංගිට නොම්මරේ දීලා අයියා ඉල්ලගෙන කාලා

■ සුසිල් කරුණාතිලක - මින්නේරිය

හාදකමක් ඇති කර ගැනීමේ අරමුණින් මින්නේරිය නගරයට පැමිණි තරුණියකට සිය දුරකථන අංකය දී අමතක නොවන පාඩමක් උගත් තරුණයකු පිළිබඳ පුවතක් හිඟුරක්ගොඩ ප්‍රදේශයෙන් වාර්තා වීය.

ඔහු හිඟුරක්ගොඩ පදිංචි අවුරුදු තිස් අටක් පමණ වයසැති කඩවසම් තැනැත්තෙකි. කොතරම් කඩවසම් කෙනකු වුවත් ප්‍රේමකිරීමට පෙම්වතියක් නොසිටීම හේතුවෙන් ඔහු පසුවූයේ දැඩි කනස්සල්ලකිනි. මේ නිසාම ඔහු ඉක්මනින් පෙම්වතියක සොයා ගැනීමට අමුතු ක්‍රමයක් අනුගමනය කළේය.

මේ අතරවාරයේදී මගතොට දකින තරුණියන් සමග හාදවී ජංගම දුරකතන අංකය ලබාදීමට ඔහු පුරුදුව සිටියේය. කිහිප විටක්ම මෙසේ උත්සාහ කළත් ඔහුගේ වෑයම අසාර්ථක විය. මෙසේ කල් ගතවද්දී දිනක් රූමත් තරුණියක් හිඟුරක්ගොඩ නගරයේදී මෙම තරුණයාට මුණගැසුණේය. නගරයේදී දුටු ඇය සමග නොපැකිළිව කතා කළ මොහු අවසානයේදී ඇය ආපසු යෑමට සැරසෙත්ම සිය දුරකථන අංකය කොලයක ලියා ඇය අත තබා තිබිණි. ඒ වේලාවේ තරුණියද මද සිනාවක් පාමින් මින්නේරිය දේවාල පාර අසලට එන ලෙස කියා පිටව ගොස් තිබුණාය. තරුණයා ඇය දෙස බලා බලාපොරොත්තු සහගත සිනහවක් පාමින් පිටවගොස් තිබිණි.

මොවුන් දෙදෙනා මුණ ගැසීමට යොදා ගත් දිනය උදාවිය. වෙනදා මෙන් නොව උදෝෂගයෙන් හැඳ පැලඳ හැඩවූ තරුණයා වටිනාකමින් ඉහළ රන් මාලයක්ද ගෙල පැලඳගෙන ඉතා සතුටින් තරුණියට පැවසූ ස්ථානය වෙත පැමිණියේය.

වේලාව සවස හත පමණ වීය. තරුණිය පැමිණියාය. ඇය පැමිණියේ තනිව නම් නොව තවත් පිරිසක් සමගය. ඔවුන් බැලූ බැල්මට දමරිකයන් වාගේ වීය. තරුණයාට හුනස්නෙන් නැගිට ගැනීමටවත් අමතක විය. මොහොතින් ඔහු ළඟට පැමිණි තරුණිය මෙලෙස පවසා තිබිණි.

"මම එන්න පරක්කු වුණාද මන්ද අයියා... කමක් නෑ කොහොම හරි ආවානේ.'' කියා පසුපසට ගොස් තිබුණාය. ඒ සමගම ඇය සමග පැමිණි දමරිකයන් වැනි පිරිස ඔහුට තඩි බාන්නට විය. ඔහුගේ ගෙලෙහිවූ රන් මාලයද සැනින් කඩා ගෙන සාක්කුවේ වූ රුපියල් පන්දහසේ නෝට්ටුවක්ද උදුරා ගත්හ. අවසානයේ තරුණියද සිනාසෙමින් පිරිස සමග පිටත්ව ගොස් තිබිණි.

සිද්ධිය පිළිබඳ තරුණයා මින්නේරිය පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. ඒ තමා සතු රුපියල් දෙලක්ෂ පනස් දහසක් වටිනා ගෙල බැඳි රන් මාලය සහ මුදලින් රුපියල් පන් දහසක් පැහැරගත් බවට පවසමිනි.

සිද්ධිය සම්බන්ධයෙන් සැකපිට මින්නේරිය හේන්යාය පදිංචි විසි තුන් හැවිරිදි සහ විසිහය හැවිරිදි තරුණියන් දෙදෙනකු සහ 27, 28 හා 30 හැවිරිදි පුද්ගලයන් තිදෙනකු අත්අඩංගුවට ගෙන තිබේ. පැහැරගත් බවට පැවසෙන රන් මාලය හෝ මුදල් මෙතෙක් හමුවී නොමැති බව පොලිසිය සඳහන් කළේය.